# පැරකුම්බාසිරිත.

මාතර බටුවිට

ඩී. ජී. අභයගුණරත්න මහතා විසින්

කරනලද

## පරාක්‍රමබාහුචරිතව්‍යාඛ්‍යා

නම්

සන්නයෙන් යුක්තයි.

මහාබෝධියන්ත්‍රාලයෙහි

මුද්‍රිතයි.

**1922.**

# සංඥාපනය.

ස්වස්ති ශ්‍රීඝනසුගතතථාගතසද්ධර්මවරචක්‍රවර්ත්තිස්වාමීන්වහන්සේගේ නිර්වාණපුරප්‍රවේශයෙන් එක්වාදහස්නවසියඅටපනස්වන්නෙහි ත්‍රිසිංහලය එක්සත් කොට රාජ්‍යවිචාරණය කළ ශ්‍රීපරාක්‍රමබාහුමහාරාජොත්තමයාණන්ගේ උදාරචරිතය ප්‍රකාශ කොට රචනාකරනලද **පැරකුම්බාසිරිත** නම් වූ මේ කාව්‍යය සකලසිංහලසුධීන්විසින් විපුලහරසර ඇති වැ පරිශීලනය කරනලදුවත් ලිපිකරභ්‍රමාදිදෝෂදූෂිත වැ පවත්නෙන් සාධූන්ගේ චිත්තඛෙදයට හෙතු වෙයි. අර්ථව්‍යාඛ්‍යාග්‍රන්ථිපදවිවරණාදියක් නො මැත්තෙන් කාව්‍යරසාස්වාදයෙහි ලොල්වූවන්ගේ මනදෙළ නොපිරෙයි. එබැවින් මෙයට ව්‍යාඛ්‍යානයක් කළමැනැවැ යි කතිපයඋත්තමයෙකනකුන් විසින් නිවෙදිතවූ ඇපි ආධුනිකජනතාව කෙරෙහි කාරුණ්‍යයෙන් යුක්ත චිත්තසන්තාන ඇත්තමෝ ‘රුහුණු, මායා, පිහිටිරටයැ’ යන ත්‍රිසිංහලයෙන් මෙයට හවුරුදු සියයකට දෙසියයකට පමණ පෙර ලියනලද පුස්කොළ පොත් කිහිපයක් ලැබැ යථාශක්තීන් පාඨශොධනපූර්වක වැ **පරාක්‍රමබාහුචරිතව්‍යාඛ්‍යා** නම් වූ මේ සන්නය මෙයට සොළොස්හවුරුද්දකට පෙර ලියාලීමු. හේ චනාහි අපගේ අනවකාශත්වය හෙතු කොට ගෙනැ මුද්‍රණය නො කරවනලදුවත් ඉන් පිටපත් කොට ගෙනැ භාවිත කිරීමට අවසර දීමෙන් ශිෂ්‍යානුග්‍රහය කෙළෙමු. මේ දත් පරහිතකරණයෙහි නිරතවූ ශාස්ත්‍රාචාර්ය්‍ය ඩී. බී. ජයතිලක අභිනීතිඥ මහතාණන් විසින් ඒ මේ ග්‍රන්ථය මුද්‍රණය කරවුවහොත් යෙහෙකැ යි ආරාධිතවූ ඇපි නැවතත් සකස් කොට මුද්‍රණයට පැමිණවීමු. මේ පද්‍යමය කාව්‍යය කවරකුවිසින් කරනලද්දේදැයි අපට නො දත හැකි විය. අවසානයෙහි පැනෙන වාසකාසජ්ජාවර්ණනාදිකතිපයපද්‍යයකින් පැරකුම්බා මහරජාණන්ගේ වල්ලභස්ත්‍රියකවිසින් කියනලද්දක් මෙන් හැඟෙතුදු මාගමකවිසින් කරනලද්දක් නො වෙයි—යම් කිසි කවීන්ද්‍රයකු විසින් (ස්ත්‍රීව්‍යාජයෙන්) කරනලද්දකැයි විචාරක්ෂම බුද්ධිමතුන්විසින් කලපිතයි. මේ කාව්‍යකර්තෘ කවරෙක් වුවත් ඉතිහාස පුරාණතර්කව්‍යාකරණජ්‍යොතිශ්ශාස්ත්‍රාදිවිවිධශාස්ත්‍රාන්තරස්වභාෂා භාෂාන්තරනෛකසමයාන්තරයෙහි හා බෞද්ධාගමයෙහි දක්ෂ විචක්ෂණ කාව්‍යනිර්මාණයෙහි කෘතහස්තවූ පණ්ඩිතොත්තමයෙකනෙකැයි සන්දිහියෙන් හැඟෙ.

ශාස්ත්‍රාචාර්ය ජයතිලක මහාශයන් විසින් මීට ලියනලද ප්‍රස්තාවනායෙහි පැරකුම්බා මහරජාණන්ගේ වංශපරම්පරාව ආදී ඉතිහාසානුගත කථාප්‍රවෘත්තිය විස්තර විසින් ප්‍රකාශවන බැවින් ඒ පිළිබඳ යමක් මෙහි නොලීමු.

මෙහි සමහර පද්‍යයක් කෙවලසිංහලභාෂායෙනුදු කිසි පද්‍යයක් මිශ්‍රසිංහලභාෂායෙනුදු රචනා කොට තිබෙ. අපට ලැබුණ ආදර්ශ පොත්හි කවිගණන එක්සියසතළිසෙකි. ඒ වනාහි යමකානුප්‍රාස උපමාලඞ්කාරාදීන් හා රීතිවර්ණනාදිකාව්‍යාඞ්ගයන්ගෙන් හා මධුර කොමලකාන්තපදවලින් යුක්තය. බහුතරපණ්ඩිතප්‍රකාණ්ඩයන් විසින් ශිෂ්ටප්‍රයොගයැයි සම්මතය. ප්‍රාක්තනභූපතීන්ගේ චරිතාවගමනයට මාතෘකාපාඨයක් වැන්න. සිංහලභාෂොද්ග්‍රහණයට ඉවහල් වන්නේ ද වෙයි. එබැවින් ශාස්ත්‍රාභිලාෂීන් විසින් මේ ග්‍රන්ථය අත්‍යන්ත සමාදරයෙන් භාවිත කටයුත්තේයි.

මේ පැරකුම්බාසිරිත දීර්ඝකාලාගත ලිපිකාරාදිභ්‍රමජනිත දොෂයෙන් ගහන වූයෙන් ව්‍යාඛ්‍යාකරණය ඉතා දුෂ්කර විය. එහෙයින් අපගේ ප්‍රාමාදිකදොෂජාතයක් දුටහොත් ජගඩිතකරණයෙහි නිරතවූ සිත් ඇති මනීෂීන් විසින් කුලුණුසිත්පෙරදැරි වැ පරිශොධනය කළ මැනැවි.

මෙහි 125 වැනිකවිය පාඨාන්තරබාහුල්‍යයෙන් හා ව්‍යාකුලත්වයෙන් යුක්තහෙයින් ව්‍යාඛ්‍යාකරණයෙන් ප්‍රතිමණ්ඩිත නො විය. මේ පරාක්‍රමබාහුචරිතය නිසා ලියනලද **පරාක්‍රමබාහුචරිතපරිකථාව** නොබෝදවසකින් මුද්‍රණයට පමුණුවන්නෙමු. ඒ ප්‍රස්තාවයෙහි ඒ මේ ඌනත්වය සම්පූර්ණ කරන්නෙමු.

D. G. Abhayagunaratna.

1922 අප්‍රේල් මස 10 වෙනි දින
කොළඹ දී ය.

# ප්‍රස්තාවනා.

**පැරකුම්බාසිරිත** නම් ප්‍රසිද්ධ කාව්‍යය මීට හවුරුදු පන්සියයකට පූර්වයෙහි ජයවර්ධනපුරය අග්‍ර රාජධානි කොටගෙන ලංකාරාජ්‍යානුශාසනය කළ ශ්‍රීසංඝබොධිශ්‍රීපරාක්‍රමබාහු මහරජාණන් පිළිබඳ යශඃකීර්ති ප්‍රතාප ගුණවර්ණනාමුඛයෙන් බඳනාලද මාහැඟි පද්‍යරචනාවකි. මේ කාව්‍යනායකවූ මහරජහුගේ රාජ්‍යපරිපාලනය වනාහි ඝනාන්ධකාරය දුරුකොට පැනනැඟි සූර්යාලොකය මෙන් නානාඋපද්‍රවයෙන් පීඩිතවූ ලංකාවිපයට ශාන්ත්‍යභිවෘද්ධිදායක වූයේය. පස්පනස්හවුරුද්දක් පමණවූ මේ රාජ්‍යකාලයතුළ රට ප්‍රථම බොහෝසෙසින් පිරිහී ගොස්තුබූ සිංහලදෙශය පිළිබඳ ඓශ්වර්යය හා ගෞරවය ප්‍රකෘතිමත් භාවයට පැමිණ ශාස්ත්‍රඥානය විශෙෂයෙන් සමෘද්ධව සම්බුද්ධශාසනයද අත්‍යන්තනිර්මලත්වයෙන් බැබළීමට පත්වූයේය. මෙසේ විවිධලොකශාසනාභිවෘද්ධියට හෙතුවූ වාසනාපුණ්‍යබලයෙන් හා ශ්‍රද්ධාවීර්යප්‍රඥාදි උදාරගුණයෙන් සමන්විතවූ මේ මහරජාණන්ගේ ප්‍රභවය හා චරිතය පිළිබඳකරුණු විස්තරවශයෙන් දැනගතනොහැකිවුවත් මේ පැරකුම්බාසිරිත ආදි සමකාලීන ග්‍රන්ථාදියෙන් මේ නරේන්ද්‍රොත්තමයා සම්බන්ධ යම් යම් ප්‍රවෘත්ති දැනගන්ට පිළිවන්වතිබීම සතුටට කරුණකි.

ශ්‍රීපරාක්‍රමබාහු රාජොත්තමයා ජයමහාලෙඛක තනතුරු ධැරූ ලැමැණිරාජවංශයට අයත් කුමාරයකුට දාව සුනෙත්‍රා මහාදෙවී නම් බිසොවකුස උපන් බව පැරකුම්බාසිරිතේ 27 වැනි කවියෙහි මෙසේ දක්වනලදි:–

“මෙලෙස තෙදබල මහත් අණසක ඇති රජුන් කුලැ පිවිතුරු
සවුළු විජෙබා නිරිඳු පිත් පැරකුම් රජුන්හට මුනුබුරු
ලැමැණි ජයමහලැනහිමි සුරතුර වෙළු රන් ලියයුරු
සුනෙත් මහදෙවි බිසෝ හිමි ලත් රජරුවක් සොඳ බුදුකුරු”

ආචාර්ය ශ්‍රීරාමචන්ද්‍රභාරතීන් විසින් විරචිත වෘත්තරත්නාකර පඤ්චිකායෙහිද මේ රජහුගේ මාතෘපිතෘදෙදෙන මෙසේ වර්ණනා කරන ලදහ.

“කාලිඞ්ගදෙශසඤ්ජාතභූමිපාලකුලොද්භවා
සුනෙත්‍රා නාම දෙවී සා පරාක්‍රම භුජං ප්‍රසූඃ.

* * *

ධර්මාශොකනෘපාන්වයෙ ජයමාලෙ මහීපතිඃ
තස්‍ය පුත්‍රඃ ප්‍රජාශ්‍රියෙ පරාක්‍රමභුජො’භවත්”

[කාලිඞ්ගුරට උපන් රාජවංශයෙන් 'පහළවූ ඒ සුනෙත්‍රා නම් දෙවී තොමෝ පරාක්‍රමබාහු (කුමාරයා) ප්‍රසව කළා. ධර්මාශොකරජහුගේ වංශයෙහි වූ ජයමාලේ නම් රජෙක් (වූයේය). ඔහුගේ පුත්‍රතෙමේ ලොකාභිවෘධිය සඳහා පරාක්‍රමබාහු (නම් රජ) වී.]

ලණ්ඩන් නුවර "බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට" අයත් මහාපුස්තකාලයෙහි තිබී අපට දක්නට ලැබුණු පැරණි රාජාවලී පුස්කොළ පොතක පරාක්‍රමබාහුනරේන්‍ද්‍රයාගේ වංශපරම්පරාව හා සිංහාසනාරූඪ වීමත් මෙසේ දක්වනලදී:-

"එකල්හි ශ්‍රී බුද්ධවර්ෂයෙන් එක්වාදහස්නවසියඅටපනස්වැනි අවුරුදු වෙසක්මස පුර සතවක් ලත් බෘහස්පතින්ද පූසේ 'නකතින් ශ්‍රීවෛවස්වත මනුසංඛ්‍යාත මහාසම්මතපරම්පරානුයාත ශුද්ධ සූර්‍ය්‍ය වංශොද්භූත සුමිත්‍රරාජෝත්තමගොත්‍රාභිජාත් සවුළු විජයබා මහරජහට පුත්‍රවූ පරාක්‍රමබාහු මහරජහට මුනුබුරුවූ ජයමාලේස්වාමි නමැති කල්පවෘක්ෂය වැළඳගත්වූ ස්වර්ණලතාවක් වැනිවූ සුනෙත්‍රා නම් දෙවිය ගේ ගර්භනමැති මේඝයෙන් නිකුත්......ශ්‍රීපරාක්‍රමබාහු මහරජතෙමෙ විදාගම මහාස්වාමීන්ගේ උපස්තම්භබලයෙන් ශ්‍රීලංකාද්වීපයෙහි මහ රජකමට පැමිණ වොටුනුපැළැඳ ශක්‍රදෙවේන්‍ද්‍රලීලායෙන් රයිගම්නුවර තුන්අවුරුද්දක් වැඩඉඳ ඉක්බිති ජයවර්ධනකෝට්ටේනුවරට වැඩ......"

මේ පාඨය පැරකුම්බාසිරිතෙහි පූර්වෝක්ත 27 වැනි කවිය ඇසුරු කොට ලියනලද්දක් මෙන්මැ හැගේ.

ශ්‍රීපරාක්‍රමබාහු මහරජාණන් ලැමැණිකුලයට අයත් බැව් සැලළිහිණිසන්දේශ කාව්‍යශෙඛර සද්ධර්මරත්නාකරාදි සමකාලීන අන්‍ය ග්‍රන්ථවලද ප්‍රකාශිතයි. මේ රාජවංශය ලම්බකර්ණ නාමයෙන්ද ප්‍රසිද්ධයි. තෘතීයධර්මසංගායනාවට අනතුරුව ලක්දිවට පැමිණි මිහිඳු මාහිමි යන් විසින් දෙවනපෑතිස් මහරජහු ප්‍රමුඛ සිංහලදේශවාසීන් රත්නත්‍රයෙහි පහදවා මේ ද්වීපයෙහි සම්බුද්ධශාසනය පිහිටුවූ පසු ධර්මාශොක මහරජාණන් විසින් සඞ්ඝමිත්‍රාස්ථවිරීන්වහන්සේ හා සමඟ එවනලද ශ්‍රීමහාබොධිශාඛාව කැටිව පැමිණි මෞර්‍ය්‍යවංශික කුමාර යන් අතුරෙන් බොධිගුප්ත කුමාරයාට ලක්මහලේනාතනතුර ද සුමිත්‍ර කුමාරයාට ජයමඟලේනා තනතුරද මහත් පිරිවරසම්පත්ද දෙවා මහාබොධිරක්ෂණයෙහි නියුක්තකළපරිදි මහාබොධිවංශාදි යෙහි දක්වනලදී. එයින් බොධිගුප්තකුමාරයෝ සඞ්ඝමිත්‍රාස්ථවිරීන් වහන්සේ සමඟ හත්ථාළ්හකාරාමයෙහි විසූ මෞර්‍ය්‍යවංශික සුනන්‍ද නම් සාමණේරින් රාජසම්මතයෙන් සිවුරුහරවා පාවාගත්හ. ඔවුන් ගෙන් පැවත ආ පරම්පර තොමෝ "මෙහෙණවර" වංශය යයි ප්‍රකට විය. සුමිත්‍ර කුමාරයෝ සඞ්ඝමිත්‍රාස්ථවිරීන් සමඟ අවුත් යථොක්ත

ආරාමයේම සිටි සුමනා නම් සව්වංශයෙම අයත් කුමරිය පාවාගත්හ. ඔවුන්ගේ දරුමුනුබුරු පරම්පරායෙන් පැවතආවෝ ගණවැසි, ලැමැණි, ලම්බකණ්ණ, යන නාමයෙන් ප්‍රසිද්ධවූහ. සද්ධර්මරත්නාකරයෙහි ශ්‍රීපරාක්‍රමබාහු මහරජාණන්ගේ වංශපරම්පරාව දක්වන තැන:—

"ක්‍රමයෙන් සමූහව ගණිවූහෙයින් ගණවැසිවංශයයි කියාද උභය කුලපරිශුද්ධ වංශ ගුණ ඥාන ආචාර ශීල යශස් තෙජසින් මහත්ව අලාමකව ලම්බකණ්ණව පැවතආහෙයින් ලැමැණිවංශයයි කියාද බොධි වඩා අා ශාක්‍යවංශයෙන්ම ශ්‍රීලඞ්කාවිපශයෙහි රජබිජුවට පහළව ලංකාව හිමිවූහෙයින් ඒ වංශපරම්පරානුගතවූ මෙකල දූහැමෙන් රාජ්‍යශ්‍රියම ප්‍රාප්තවූ ශ්‍රීපරාක්‍රමබාහු නම් මහරජතෙමෙ"

යනාදීන් ඒ ප්‍රවෘත්තිය විස්තරයෙන් දක්වනලදි. 'ලැමැණි' යන්න 'ලම්බකණ්ණ' යන්නෙන්ම බිඳී ආ ශබ්දයක් ලෙස සැලකියයුතුයි.

මේ ලම්බකණ්ණ හෙවත් ලැමැණිවංශය ක්‍රමයෙන් විශාලව බල සම්පන්නව ලඞ්කාරාජ්‍යයටද හිමිවූ පරිදි මහාවංශාදි ඉතිහාස ග්‍රන්ථයන්හි පැනේ. ශ්‍රීබුද්ධවර්ෂ 580 පමණේදී රාජ්‍යශ්‍රියට පැමිණි ඉළනාග නම් රජහුගේ කාලයේදී ලම්බකණ්ණයෝ දමරිකව රජු රටින් පලවා හැර තුන්අවුරුද්දක් රජය විචාළෝය. ඒ රජහුගේ පුත්‍රවූ යසලාලක තිස්ස නම් රජු මරා සිංහාසනාරූඪවූ ශුභ නම් බලත්‍ා පග කොට රාජ්‍යශ්‍රියට පත්වූ වසභ නම් රජද ලම්බකණ්ණවංශයට අයත් කුමාරයෙකි. ඉන්පසු ශ්‍රීබුද්ධවර්ෂ 830 පමණේදී රජපැමිණි විජයරජුට අනතුරුව පිළිවෙළින් රාජ්‍යශ්‍රිය ලත් සඞ්ඝතිස්ස, සඞ්ඝබොධි, ගොඨාභය යන රජුන් තුන්දෙනම ලම්බකණ්ණවංශිකයන් බැව්—

"ලම්බකණ්ණා තයො ආසුං සහායා මහියඞ්ගණෙ
සඞ්ඝතිසෙසා සඞ්ඝබොධි තතියො ගොඨකාභයො"

යන මහාවංශගාථායෙන් දර්ශිතයි. මීට පසුකාලයෙහි රාජ්‍යශ්‍රීපද ප්‍රාප්ත බුද්ධදාස, කුමාරදාස, අග්‍රබොධි, මහාවිජයබාහු, මහාපරාක්‍රම බාහු ආදි කීර්තිමත් මහරජුනුත් මේ වංශයට අයත් බැව් මේ පැරැ කුම්බාගිරිතින් හා කාව්‍යශෙඛරයෙන් පැනේ. ඒ රාජපරම්පරාවගේ අවසානයෙහි දක්වනලද සවුළුවිජයබා රජ ශ්‍රීබුද්ධවර්ෂ 1890 පමණේදී කුරුණෑගල්නුවර රජකෙළේය. මේ සවුළු ශබ්දය "සවුලු"යයි ගෙන ඊට "ශාක්‍යකුල"යයි බොහෝ පඬිවරයෝ අර්ථ කියති ලැමැණි පෙළපත ශාක්‍යවංශයට අයත් බැව් ප්‍රකාශිතහෙයින් මේ අර්ථයද ගැළපෙන නමුදු මේ 'සවුළු' ශබ්දය ග්‍රාමනාමයක් බැව් සිතීමට කාරුණු තිබේ. සවුළු නම් ගමේ උපන්හෙයින් විජයබාරජහුගේ නාමයට "සවුළු" නම් ග්‍රාමනාමය පූර්වපදකොට යොදනලදි- වළගම් අභා ආදියෙහි මෙනි

ශ්‍රී බුඬවර්‍ෂ දෙදහස් පස්අසූවන්නෙහි සෙංකඩගල් නුවර රජවූ වීරවික්‍රම නම් රජහුගේ වංශපරම්පරාව දක්වන තැන මේ සවුළු ශබ්දයාගේ නිෂ්පත්තිය ජනශ්‍රැතිවාතීානුකූලව රාජරත්නාකරයෙහි මෙසේ විස්තර කරනලදි.

“ඒ රාජකුමාරවරුන් අටදෙනා අතුරෙන් සූර්‍ය්‍යගොත්‍ර කුමාරයන් දෙවනපෑතිස්රජු මහත් ප්‍රෙමයෙන් රාජභවනයෙහි තබා රක්‍ෂා කරනකල්හි මායාරජයෙහි කළුගංපියස නම් එක්ගමෙක හිරණ්‍ය සුවර්‍ණාදි බොහෝ ධනධාන්‍යාඪ්‍යව වසන එක්තරා බ්‍රාහ්මණයෙක් තමාගේ රන්රිදී ආදී ධන නිධාන කොට මියපරලොව ගියකල්හි ඉක්බිති ඒ බ්‍රාහ්මණයාගේ දුහිතෘවක් ඒ නිධානගත ධනයෙහි කළ ලෝභයෙන් එම ග්‍රාමාසන්නයෙහි වසන මයූරධෙනුවකගේ කුක්‍ෂි යෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කළාය. ඒ මයූරධෙනුතොමෝ නිධාන මස්තකයෙහි බිජුවටය තබා රක්‍ෂාකරනකල්හි එම ගම වැසි එක්තරා මනුෂ්‍යයෙක් කුඩා කළයක් පමණවූ ඒ බිජුවටය දුක දුවාණකරඬු වෙක්හි තුබූ සුවර්‍ණරූපයක්මෙන් බිජුවටය ඇතුළෙහි දිලිහෙන කුමාරිකාව දුක රජහට දක්වන්ට පඬුරකැයි ගෙන බිජුවටය ඇතුළෙහි හිඳිනා කුමරියගේ පින්බෙලෙන් එකදම අනුරාධපුර නුවරට ගොස් එමද සවස දෙවනපෑතිස් රජු අතට දින. එකෙණෙහි ඒ බිජුවටය කරඬුවක් පිධානය හැරියාක්මෙන් දෙකක්ව රාජකන්‍යා තොමෝ ඒ දෙවනපෑතිස් රජුගේ ඇකයෙහි පහළවූවාය. ඒ ආශ්චර්‍ය්‍යය දුටු දෙවනපෑතිස් රජු නුවර බෙරලවා දුහිතෘවක් ලත් සතුටින් මහත් පූජා පෙරහර කරවා ඒ කුමාරිකාවට මයූරවතීයයි නම්තබා සුතප්‍රෙමයෙන් වඩා මහත්ව වැඩිවිය පැමිණිකල්හි කනක කටකනූපුරාදි සියුසැට ආභරණයෙන් සරහා යටකී සූර්‍ය්‍යගොත්‍රකුමාරයාහට භාරකොට දී ඒ දෙවනපෑතිස්රජතෙම මයූරවතීරාජමහෙසි කාවට හිරණ්‍යසුවර්‍ණ දශිදශ ගවමහිෂාදි බොහෝ ධන පරිත්‍යාග කොට දී ගම්වර දෙනුයේ පළමුකී නිධානමස්තකයෙහි පූගද්‍රැමයක් ප්‍රමාණව උසින් වඩු සත්රියන් උස බටු වෘක්‍ෂයක් ඇතිවූහෙයින් එම ගම බටුවන්නයයි නම්තබා දී අතිකුඳු රයිගම්කෝරළයෙන් වැලි තොළ ආදි ගම්ද මායාදුන්නේ බද කුරුගම් ආදි .ගම්ද කුරුණෑගල් කෝරළයෙන් ගොඩගම ආදි ගම්ද සිඳුරුවාණය යටිනුවර බද රන්මුංගොඩ ආදි ගම්ද ඒ ඒ දිගින් බොහෝ ගම්වර ශිලාලෙඛ හිඳුවා දුන්නේය. එසේ දෙනලද ග්‍රාමයන් අතුරෙන් ඒ මයූරවතී රාජමහෙසිකාවගේ රජකුමරියන් බොහෝ කලක් විසූ ගම සෙබළ හම් විය. කාලාතික්‍රාන්තයෙන් සෙබළහම් පෙරළී සවුළුවයයි[1] මේ

1 හවුළුව නම් ගමක් දුම්බදෙණි පළාතේ දැනුදු තිබේ එය මේ සවුළුව නම් ගමයයි සිතිය හැකියි.

නමින් ප්‍රසිද්ධවිය. මෙසේ ඒ රාජමහෙසිකාවගේ පරම්පරාව නොහැර අා ජයමහලේන සවුළුපරාක්‍රමබාහු මහරජාණන්ට මුනුබුරුවූ පිතෘපක්ෂයෙන් යටකී මෙහෙණවර වංශොද්භූත වික්‍රමබාහු මහරජාණන්ට මුනුබුරුවූ..........................................”

මේ පාඨයෙහි සඳහන්වූ සවුළුපරාක්‍රමබාහු මහරජහු පැරැකුම්බා සිරිතේ 27 වැනි කවියෙහි පැනෙන සවුළුවිජේබාරජහුගේ පුත්‍රවූ පරාක්‍රමබාහු රජු වියයුතුයි.

මෙසේ ශ්‍රී පරාක්‍රමබාහු මහරජහුගේ පියමුතුපරම්පරාව සමකාලීන ග්‍රන්ථයෙන් නිශ්චිතවන නමුදු ඒ රජහුගේ පියා විජයබාහු නම් රජකු බවත් ඒ විජයබාහු රජු චීනයට අල්වාගෙන ගියබවත් ඇතැම් නවීන උගතුන්ගේ මතයකි. මේ කල්පනාව වැරදි බැව් පෙන්වීමට කියහැකි කරුණු බොහෝයි. ඒ සියල්ලම මේ ලිපියෙහි බහාලීම ප්‍රපඤ්චහෙයින් එයින් ප්‍රධාන කරුණු එකක් දෙකක් මෙහි සඳහන් කරමු.

රාජාවලි පොත් පන්තියකම පැනෙන එක්තරා පාඨයක් යථොක්ත වැරදි මතයට හෙතුභූතවී තිබේ. ඒ පාඨය මෙසේයි:-

“මේ[දඹදෙණියේ පරාක්‍රමබාහු]රජ බොහෝ කාලයක් සැපවිඳ රජකර නමහට ජාතක පුත් කුමාරවරුන් **විජයබාහුය, භුවනෛකබාහුය, ශ්‍රී භුවනෛකබාහුය, පරාක්‍රමබාහුය, සිරි විජයබාහුය,** යන පුත්‍රයෝ පස්දෙනය, **වීරබාහු** බෑනාය යන සදෙනා ළඟට කැඳවා “පෙර දඹදිව සැටදහසක් රජදරුවෝ දඹදිව බෙදාගෙන කැවූය. වෙන වෙන නුවර කරවා උන්නාහ. ඒ දඹදිව දෙවතුව දසබෑ රජදරුවෝ බෙදාගෙන කැවූය. දඹදිව රජුන් තොපට නැකරවාපිමි. සොළී පාණ්ඩිරජුන් ගෙන් ඔටුනුගෙන්නවා පාමුලරැස්කරවාපීමි. තොප සත්නමුත්තනට දකිනාතුරු තිබෙන්ට වස්තු රැස්කරපීමි, තෙපි සදෙන උනුන් විරොධ නොවී සිරිලක බෙදාගෙන කව”යි කියා ‘පරසතුරන්ට එන්ට ඉඩ නාරිවු’ කියා දළඳා සාමීන්ට හැම මස් නොවරදවා පෝයදින පූජා කරවන්ට කියා නිරන්තරයෙන් මල්පහන් පුදන්ට කියා සිරිලක හැම දාගැබ් හැම විහාරවල් බිඳෙන්ට නැර අවුරුදුපතා සුණු බදම්ලා මහා සංඝයාට මසින්මස තිතිපතා දන් දෙන්ට කියා “මපියාණන් කළ එක මායාරට තිබා තුන්රාජ්‍යයම එක්සත්කර ගතිමි, මායාරට දෙලක්ෂ පනස්දහසක් ගම්ද පිහිටිරට හාරලක්ෂ පනස්දහසක් ගම්ද රුහුණුරට හත්ලක්ෂ හැත්තෑ දහසක් ගම්ද යන මෙකී රටවල සතට අඩුවක් නැතුව මඟුල්ගෙය මෙන් දුක් නැතුව සව්සත රැක්කෙමි” කියා කුමාරයින් සදෙන ළඟට කැඳවා සදෙනම සිඹ සනහාගෙන විරෝධ නො

වන්ට දිවිරවා වැඩිමහල ජ්‍යෙෂ්ඨ විජයබාහුට රාජ්‍යය භාරකරදී තිස්දෙකක් අවුරුදු රාජ්‍යයකර දෙව්ලොව ගියේය. විජයබාහු රජකරන අවදියට **මහා චීනෝ දෙස්රජ** සියගණන් සෙනග ගෙන මේ ලකට ගොඩබැසලා පඬුරු පාක්කුඩම් ගෙන එනවාය කියා මායම්කර උපායෙන් එරජු අල්ලා ගෙනගියේය. පරාක්‍රමබාහු රජ කරන අවධියේදී දේසවලින් පඬුරු ගෙනෙන්නාහ. ඒසැටි සිතා ගෙන සිටලා විජයබාහුරජ අනුවණකම් කොට දෙස්රජුට අසු විය. එරජහුගේ මල් සතරදෙනත් නැගිලා නැතක් හමුදුවක් අල්ලා ගෙන දෙස්රජ මහා චීනයට ගියේය. පසුව ලඞකාවේ රජ්ජුන් නැති හෙයින් **අලකෙශ්වරමන්ත්‍රී** රයිගම්නුවර විසුවේය. පරාක්‍රමබාහු රජුගේ බෑනා ගංපළ නුවර උන්නේය. යාපාපටුනෙහි **ආශ්‍යීචක්‍රවර්ති** රජ උන්නේය. මෙරජුන් අතුරෙන් ආයශීචක්‍රවර්ති රජු සේනා බලයෙන්ද අණබලයෙන්ද උසස්වූ බැවින් උඩරටින්,හා පාතරටින්ද නවතොටමුණෙන්ද අයබදු ගෙන්නවන සඳ එක්දවසක් අල කෙශ්වරයා තමාගේ සේනාව දැක බලා 'මෙච්තර සේනාවක් ඇතුව ඉඳ එකකුට අයබදු දීම සුදුසුනොවෙයි' සිතා ජයවර්ධන කෝට්ටේ බැඳ ජලය පිරි සිටින්ට අමුණුගිල්ම බැඳ අවුරුදු කීපයකට කන්ට ලුණු පොල් වී රැස්කොට තිබා ආයශීචක්‍රවර්ති රජ්ජුරුවන්ගෙන් ඒ ඒ තැන බදුවලට සිටියවුන් එල්ලාදැමීය. එපවත් ආයශීචක්‍රවර්ති රජ අසා විසඝෝර නයකුසේ කෝපයෙන් දිලිහී සොළීරටින් දහස් ගණනක් දෙමළ සෙනග ගෙන්නවා ගංපළටත් ජයවර්ධන කෝට්ටය ටත් එකඳ කොටන සැටියට සෙනග පිටත්කර එවුවේය. ගොඩින් ආ සෙනග මාතලේ වාඩිලාගත්තාහ. මුදෙන් ආ සෙනග පාණදුරා තොටින් කොළොම්තොටට ගොඩබැස දෙමටගොඩ ගොරකාන යන තැන අතුරු සිදුරු නැතුව වාඩිලාගත්තාහ. බුවනෙකබාහු ගංපළ නුවර ඇර බයින් රයිගම්නුවරට වන. උඩරට සේනාව අප වැනි සේනාවක් ඇරගිය රජුගෙන් කම්කිම්ද කියා පස්රටේ සේනාව තම්තමුන් ඝනාඝාර රාත්‍රියේ වාඩිවලට වැදලා දෙමළ සෙනගට ඇන වාඩිකුලප්පුකොට නැතක් දෙමළසෙන් මරුවාහ. ඉන්පසු සිටි දෙමළසෙනඟ මග ඇර යාපාපටුනට බිඳීගියාහ. අලකෙශ්වරයා දෙමටගොඩ ගොරකාන වාඩියට පැනලා කොටා දෙමළසෙන් විනාසකරවා පාණදුරාතොට තුබූ නැවූත් පොඩිකරදමා රයිගම් නුවරට වන. ගංපළ බුවනෙකබාහු ගංපළට ගියේය. ශ්‍රී බුඩවර්ෂයෙන් එක්දහස් නවසිය පනස්අටක්වූ වෙසඟපුර සතවක්ලත් බෘහස් පතින්දා පුසේ නැකතින් විජයබාහු රජ අල්ලාගෙනගිය අවධියේදී එරජුගේ බිසව සුනෙත්‍රාදෙවී කුමාරයාත් කැඳවාගෙන

නුවරින් නික්ම විසිදුගමට ගියාහ. විසිදුගම තෙරසාමි එකුමාරයාගේ ජාතකය බලා මුහපින් ඇති බව දැකලා පින්වත් ලංකේශ්වරයකු කියා මතු සිරිලක රජකරන බව දැන ඒ කුමාරයා ගණපතියේලා ගෙන උන්නේය. ඒ වග අලකේශ්වරයාට සැලව ගියවිට සතරකෝරළේ පොල්වත්ත කියන ගමේ ගමයාටත් එම ගම ආචාරියාටත් හාරකර ඇරියේය. රාත්‍රියේ ගමයාගේ ගෙදර ගොස් ඉන්නේය. දවල් දවසට ආචාරියාගේ පැටියා එක්ක කෙළිනේය. එවග අලකේශ්වරයාට සැලවී පණිවිඩකාරයින් ආචාරි ගෙදරට එවුවේය. විමසන්ට ආචාරියාගේ ගෙදරට ආ පණිවිඩකාරයින් දැකලා පතුවැලගෙන තමාගේ පැටියාට පාරක් ගසා හරක් බලන්ට කියා කුමාරයින්ත් එක්ක එලවිය. ඒ පණිවිඩකාරයෝ ආචාරියාගේ ලමයායයි සිතා ආපසු රහිගමට ගියාහ. ඔවුන් ගියපසු ආචාරියා එකුමාරයා කැඳවාගෙන ගොස් එ ආචාරියාගේ නගා හිටින ගම ගමරදලගේ ගෙදරට ඇරලා ඈති තතු ගමරදළට කියාදී ආපසු ගමට ආවේය. මෙසේ ඒ කුමාරයා සොළොස් ඇවිරිදි වයසට පැමිණිවිට විසිදුගම තෙරුන්වහන්සේ ප්‍රධානවරුන් ගෙන්නවා කථාකරගෙන ඒ කුමාරයා ගෙන්නවමින් අලකේශ්වරයාට රහසින් වෙසහ පුර සතවනලත් ගුරුදින පුසේ නැකතින් මහා සේනාවට හාරකරදී අලකේශ්වරයාට හදිසාර **ශ්‍රීපරාක්‍රමබාහු** නමින් සිංහාසන ප්‍රාප්තකළේය."

නිකායසංග්‍රහ සද්ධර්මරත්නාකරාදි සමකාලීන ලිපිවලද මහාවංශාදි ග්‍රන්ථයන්හිද පැනෙන ඉතිහාස කථාමාර්ගය හා සම කොට බැලූකල මේ රාජාවලී පාඨය නොඑක් වරදින් ගහණවූ අතිශයින් ව්‍යාකූලවූ වාසගමක්බැව් ප්‍රත්‍යක්ෂව වැටහේ. දඹදෙණිනුවර රජකළ බෝසත් විජයබාහු රජහුගේ සිංහාසනාරූඪවීම පටන් චීන යුද්ධය දක්වා ශතවර්ෂයකට අඩුනොවන කාලයක්තුළ ලඞ්කා ඉතිහාසය මෙහි සම්පූර්ණයෙන්ම ලොප්වීතිබේ. ගංපල රජකළ තුන්වෙනි වික්‍රමබාහු රජහුගේ කාලයේදී සිදුවූ ජයවර්ධන කෝට්ටය ගොඩනැගීම හා ආර්‍යචක්‍රවර්තීන් නෙරපාදූමීම ආදී කරුණු චීන යුද්ධයෙන් පසුව සිදුවූ ප්‍රවෘත්තිලෙස දක්වා තිබේ. ඉතිහාසයට ඉදුරාම විරුද්ධවූ මෙවැනි යෙදුම්වලින් දූෂිතවූ යථොක්ත පාඨය ගරුකොට සැලකිය නොහැකියි.

චීන යුද්ධය පිළිබඳ සැබෑ ප්‍රවෘත්තිය සද්ධර්මරත්නාකරයෙහිද චීන ඉතිහාස කථායෙහිද ප්‍රකාශිතයි. ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන්ට සත්වන්නෙහිදී පළාබත්ගල වනවාසි පරම්පරානුගත ධර්මදින්නාචාර්‍ය විමලකීර්ති මහාස්ථවිරපාදයන්විසින් විරචිත සද්ධර්මරත්නාකරයෙහි තුන්වෙනි වික්‍රමබාහු මහරජහුගේ කාලයේදි ප්‍රසිද්ධියට පැමිණි

නිශ්ශංක අලගක්කෝනාර හෙවත් අලකෙශ්වරනම් ප්‍රභුරාජයාවිසින් කරනලද විවිධ ශාසන සංග්‍රහ ක්‍රියා වර්ණනාකොට ඊට අනතුරුව සිදුවූ ඉතිහාස ප්‍රවෘත්ති මෙසේ දක්වනලදී:-

"ඊට ඉක්බිති ඒ අලකෙශ්වර නම්වූ ප්‍රභුරාජයාගේ ඖරස පුත්‍රවූ කුමාරඅලකෙශ්වරය ඔහුගේ පිතෘහට බෑනවූ වීර අලකෙශ්වරය ඔහු මල්වූ වීරබාහු ඈපාණය ඔහුගේ පුත්‍රවූ විජය ඈපාණය ඔහුගේ මල්වූ තුනයෙසය—ඔහුගේ මහලු පිතෘවූ පළමුකී වීර අලකෙශ්වර රයිගම් පුරයෙහිදී මල්වූ වීරබාහු ඈපාණන් හා යුධයෙන් පැරද දෙශාන්තර ගතව නැවත අවුත් මෙහි දෙළොස් අවුරුද්දක් රාජ්‍යය කළ ඉක්බිති පුරාකෘත කර්මයෙන් චීන මායමට අසුවගිය සඳ—පළමුකී සෙනෙවිරදුන්ගේ මුනුබුරුවූ පරාක්‍රමබාහු ඈපාණයයි යනමේ සත් දෙනා ඇවෑමෙන් අප බුදුන් පිරිනිවී එක්වාදහස් නවසිය අටපනස් වනු පොසොන්මසට ලකසසුන් පිහිටි එක්වාදහස් සත්සිය දෙවිසි අවුරුදදෙක් පිරුණේය. එකල්හි ශාක්‍යකුල පරම්පරානුගත අමිතශ්‍රී වික්‍රමාන්විත පරාක්‍රමබාහු මහරජතෙම ශ්‍රී ලඞකාවීපයෙහි රාජ්‍යශ්‍රීයට පැමිණියේය."

චීන යුධය පිළිබඳ ප්‍රවෘත්තිය "පිනිඑටියන්" නම් චීන ඉතිහාස කථාවෙහි මෙසේ දක්වාතිබේ :-

"සීලන් වන්" (සීලන් දිව) නම් පුරාණ "සෙංකියාලෙ" (සිංහල) රාජ්‍යයයි. රාජභවනයට නුදුරුව ගිනිමෙන් දිලිසෙන මහාඝ මාණික්‍ය යෙන් බබළන දළදා මාලිගය තිබේ. දීර්ඝකාලයක් මුළුල්ලෙහි නොකඩව් දළදා වහන්සේට නොඅඩුවූ පූජෝත්සව පවත්වනලද්දේය. මෙකල රජකරන්නේ "අලිකුනයිඋල්" (අලගක්කෝනාර) නම් "සුඔලි" (සොලි) ජාතිකයෙකි. හෙතෙම බුඩධර්මයට ගරුනොකරන මිථ්‍යාදෘෂ්ටිකයෙකි. රාජ්‍යයෙහි වැසියන්ට කිසි අනුකම්පාවක් නැතිව පීඩාකරන අධර්මිෂ්ඨවූ මේරජතෙමේ දළදාවහන්සේට ගරුසම්මාන නොපවත්වයි. ජුංලෝ අගරජතුමාට තුන්වන්නෙහි (ක්‍රි: ව: 1405 දී) ෂැංහෝ නම් සෙනාධිපතියා පූජා පිණිස ගඳදුම්මල් ආදියන් සමඟ පරදෙශවලට යවනලදී. ෂැංහෝ සෙනාධිපතිතුමා "අලිකුනයි උල්" (අලගක්කෝනාර) රජුගේ මිථ්‍යාදෘෂ්ටිය හරවා ඔහු බුදුසමයෙහි පිහිටුවන්ට උත්සාහකොළේය. ඒ රජ ඊට අප්‍රසන්නව සාහසිකව ක්‍රියාකරන්ට සැරසුණේය. ෂැංහෝ සෙනාපතියාට ඒබව දැනී පිටත්වී ගියේය. කලකට පසු ෂැංහෝ සෙනාපතියා නැවතත් පරදෙශවලට යවන ලද්දෙන් සිංහල ද්වීපයෙහි රජුටත් පඬුරුගෙන ආවේය. (අලගක්කෝනාර) රජ ප්‍රථමවාරයටත් වඩා අභිමානයෙන් යුක්තව ඔහුට කිසි සත්කාර සම්මානයක් නොකොට පීඩාවන පරිද්දෙන්

ක්‍රියාකොළේය. රජුගේ නියෝගයෙන් පන්ස් දහසක් හේවායෝ ගස්කපා හෙළා මංමාවත් ඇවුරූවෝය. ඒසා අතික් හමුදුවක් නැව් වල බඩු පැහැරගන්ට යවනලදී. එසේද වුවත් රජුගේ සෙවකයන් මෙන්ම මේ තොරතුරු දැනගත් ෂැංහෝ සෙනාපතියා වහ වහා නැව්කරා එන්ට පිටත්විය. මාගීය අවුරාතුබු නමුත් හේවාහමුදුවක් ගොඩබස්වා සටන්කරන්ටයයි නැව්වලට රහසින් පනිවිඩයක් යැවුයේය. ෂැංහෝ තුන්දහසක් සෙනඟගෙන වක්මඟකින් රාත්‍රියෙහි ගමන්කොට අගනුවරට පහරදී එය අල්වාගත්තේය. එවිට නැව් කොල්ලගන්ට ගිය සතුරු හේවායෝත් රාජ්‍යයේ අතික් හේවායෝත් හැමපැත්තෙන්ම අවුත් නගරය වටලාගෙන සදවසක් සටන් කොළෝය. ෂැංහෝ සවකිය හමුදුවත් කැටිව රජු අල්වාගෙන අලුයම වාසල් දෙරින් පිටත්වී මහසරස හෙළනලද ගස් පහකොට සටන් කෙරෙමින්ම "ලි" විස්සක් (හැතැප්ම පහක්) ගමන්කොට ඇඳිරි වේලෙහි නැව්වලට ළඟාවිය. ඔව්හු නැව්නගින්ට ප්‍රථම විධිවූ පරිද්දෙන් දළදුවහන්සේට පූජා පැවැත්තුවෝය. ඒ ප්‍රස්තාවයෙහි ආශ්චයර්‍යීමත් කරුණක් සිදුවිය පළමුකියනලද (දළදා මාළිගයෙන්) රැස්විහිදීමක් ඇතිවිය. මෙඝගජිතා පැවැතිණ. විදුලිකොටන්ටද වන...............ජුංලෝ මහරජහුට නවවන්නෙහි (ක්‍රි: ව: 1411) සත්වන මස නවවනදා ඔව්හු (චීන) අගනුවරට පැමිණියෝය"

ෂැංහෝ සෙනාපතියා ලක්දිවට පැමිණිකාලයෙහි "යලිකුනසිඑර්" (අලගක්කෝනාර) රජු හා රටවැසියන් අතර බලවත් විරෙධිතා පැවැතුණුබවත් යුඩකොලාහාලයෙන් රාජ්‍යය වියවුල්ව තුබූබවත් අලගක්කෝනාර රජුසමඟ ඔහුගේ බිසෝවරුන් හා කුමාරයන්ද ප්‍රධානින්ද අල්වාගෙන ගියබවත් රජු මැරියයුතුයයි චීන අමාත්‍යයන් සැලකර සිටිනමුත් අගරජු ඔහුකෙරෙහි අනුකම්පාකොට ඔහු සහ බිසෝවරුන් හා කුමාරයන් නිදහස්කොට අගරජුගේ නියෝගයෙන් "යෙපානැයිනා" නම් රාජවංශික කුමාරයකු ලක්දිව රජකමට තෝරාගත්බවත් ඒ තෝරාගන්නාලද කුමාරයා අගරජුගේ සන්හස් සමඟ චීන ආධිපත්‍යයට යටත්ව රජකරන පිණිස ලක්දිවට එවූබවත් සිංහාසනයෙන් පහකරනුලැබූ අලගක්කෝනාරරජුත් සියරටට එවූබවත් "මිංෂි" නම් චීන ඉතිහාස කථාවෙහි පැනේ. එතැන්පටන් ක්‍රි: ව: 1459 දක්වා අවුරුදුපතා ලක්දිවින් චීන අගරජුට කප්පන් දුන්බවත් 1430 වන්නේදි ෂැංහෝ සෙනාපතියා නැවත මෙහිපැමිණි බවත් 1416 දීද 1421 දීද පරාක්‍රමබාහු රජහුම පඬුරු පාක්කුඩම් ගෙන චීනයට ගියබවත් මේ ඉතිහාසකථාවෙහි කියා තිබේ. අවසානයෙහි සඳහන්වූ මේ ප්‍රවෘත්තිය සැබෑයයි සිතීම උගහට නමුත් චීන ඉතිහාසයෙහි පැනෙන අනික් ප්‍රධාන ප්‍රවෘත්ති සත්‍යයයි පිළිනොගැනීමට

කරුණු නොමැතිසි. "චීන මාගමුට" අසුවූයේ වීරබාහු ඈපාණන්ගේ සහෝදරවූ වීර අලකෙශ්වරයයි සද්ධර්මරත්නාකර කර්තෘවර සමකාලීන විමලකීර්ති මහාස්ථවිරපාදයන් විසින් කියනලද ප්‍රවෘත්තිය චීන ඉතිහාසයෙන් සපිරවේමැයි. වීර අලකෙශ්වර (හෙවත් අලගක්කෝනාර) නම් අධිපතියා විජයබාහු නාමයෙන් සිංහාසනාරූඪවූබවක් යට දක්වනලද ආකූලව්‍යාකූල රාජාවලී පාඨයෙහිමුත් අන්‍ය කොයිම ඉතිහාසයකවත් සඳහන්විනොමැතිසි. හෙතෙම විජයබාහු නාමයෙන් ප්‍රසිද්ධව සිටියේනම් රජතන් පත්වීමට ප්‍රථම ධැරූ අලගක්කෝනාර නාමය චීන ඉතිහාස කථාවට ඇතුලත්විය නොහැකිසි. එසේම මේ වීර අලකෙශ්වර නම් අධිපතියා ජයමහාලෙඛක තනතුර ඉසුලූ බවක් කොතැනකවත් සඳහන්වී නොමැතිසි. එසේහෙයින් ශ්‍රී පරාක්‍රමබාහු රජහුගේ පියා චීනයට අල්වාගෙනයන ලද්දේය යන මතය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂෙප කටයුතුයි.

ශ්‍රී බුද්ධ වර්ෂ 1834 පමණේදී කුරුණෑගල් නුවර රජපැමිණි ද්විතීය පණ්ඩිත පරාක්‍රමබාහු (හෙවත් වර්තමාන ව්‍යවහාරයෙහි සතරවැනි පරාක්‍රමබාහු) මහරජාණන්ගේ කාලයෙහි පටන් ජයවර්ධන කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු මහරජහුගේ රාජ්‍යොදය දක්වා ශතවර්ෂයක් ප්‍රමාණවූ අතර කාලය පිළිබඳ ඉතිහාසා ්ත කරුණු මහාවංශාදියෙහි අතිශය ඌනත්වයෙන් දක්වනලදී. එසේද වුවත් සමකාලීන පොත්පත් ශිලා ලිපි ආදියෙන් ඒ කථාමාර්ගය තරමක්දුරට සම්පූර්ණකරගන්ට පිළිවන්ව තිබේ.

යටකියනලද පණ්ඩිත පරාක්‍රමබාහු රජහුගේ මෙහෙයීමෙන් ශක වර්ෂ 1247 දී (බු. ව. 1868 දී) දළදාසිරිත රචනාකළබැව් ග්‍රන්ථාවසානයෙහි පැනෙන හෙයින් ඒ රජු පන්තිස් හවුරුද්දක් පමණ රාජ්‍යානුශාසනාකළබැව් සිතිය හැකිසි. ඉන්පසු වන්නිභුවනෛකබාහුය, සවුළු පරාක්‍රමබාහුය, පණ්ඩිත වික්‍රමබාහුය යන පවතරේන්ද්‍රයන්ගේ නම් ඉතිහාසයෙහි පිළිවෙළින් සඳහන්වේ. මෙ පස්රජුන් අතුරෙන් සවුළු විජයබාහුයයි නම්ලත් පස්වැනි විජයබාහු රජුගේ කාලය ශ්‍රී බුද්ධවර්ෂ 1890 දී අවසානවූ බැව් නිකායසඞ්ග්‍රහයෙන් පැනේ. එසේ හෙයින් වන්නිභුවනෛකබාහු සවුළුවිජයබාහු යන මේ රජුන් දෙදෙනාගේම මුළු රාජ්‍යකාලය උඩත්පිරිසෙයින් දෙවිසිහවුරුද්ද කට වැඩිනොවේ. මේ නරපතියන් සිංහාසනප්‍රාප්තවූබවමුත් ඔවුන්ගේ කාලයෙහි සිදුවූ යම්කිසි සිහිකටයුතු ප්‍රවෘත්තියක් ඉතිහාසයෙහි හෝ අන්‍ය ලිපියෙක්හි නොදක්නාලැබේ. "සතරවෙනි භුවනෛකබාහු මහරජාණන් සතරවන්නට අප බුදුන් පිරිනිවි එක්වා දහස් අටසිය සුවානූ අවුරුද්දෙක් අතික්‍රාන්තවිය"යි නිකායසඞ්ග්‍රහ

යෙහි කියනලද හෙයින් මේ රජහුගේ රාජ්‍යෝදය ශ්‍රී බුඩ වර්ෂ 1890 දී සිඩවියැයි පැනෙනං නමුදු මේ. නරේඥයාගේ අග්‍රාමාත්‍ය සෙනා ලංකාධිකාර සෙනෙවිරත් මන්ත්‍රීශ්වරයාණන් විසින් කරවනලද ලඞ්කාතිලක විහාරයෙහි පිහිටුවූ ශිලාලේඛනයෙහි මේ වර්ෂය වෙනස් ලෙස දක්වාතිබේ. මේ ශිලාලිපියෙහි ඇතැම් කොටස් කියවන්ට බැරිතරම් අකුරු මැකීතිබෙන නමුත් මුළු සන්නසම ලණ්ඩන්නුවර බ්‍රිතාන්‍ය කෞතුකාගාරය සම්බන්ධවූ මහා පුස්තකාලයට අයත් පුස් කොළ පොතකින් අපට පිටපත්කරගන්ට ලැබුණේය. එහි මුල් කොටස මෙසේයි:–

"ශ්‍රී සංඛ්‍යල ජ්‍යොතිශ්ශාස්ත්‍රයට දිව්‍යනෙත්‍රයක් බඳුවූ ශකවර්ෂයෙන් එක්දහස් දෙසිය සූසැට අවුරුද්දක් පිරුණුසඳ මෙලක රජ පැමිණි ත්‍රිසිංහලාධීශ්වර භුවනෛකබාහු නම්වූ මට තුන්වනු වෙසහ පුරපසළොස්වක් දෙවාසයේ මහසංඝයාවහන්සේ එක්ව සිදුරුවානේ පන්හල් ගල්මුදුනෙහි කැරවූ නායක පිළිම අටවිස්සක් හා පිළිම සහශ්‍රයකින් සම්පූර්ණවූ සතරවෙනි මාලත්...............................''

භුවනෛකබාහු රජු ශකවර්ෂ 1264 දී (බුඩ වර්ෂ 1885 දී) රාජ්‍යශ්‍රියට පත්වූබව මේ පාඨයෙන් පැනේ. නිකායසඞ්ග්‍රහයෙහි සඳහන්වූ වර්ෂයත් මේ වර්ෂයත් අතර පස්හවුරුද්දක වෙනසක් තිබේ. මේ වර්ෂවයම සමකාලීන ලිපිවල ආහෙයින් එයින් එකක්වත් වැරදියයි ප්‍රතික්ෂෙපකටනොහැකියි. මේ විෂමත්වය කෙසේ ඇතිවීදැයි සලකා බලනකල මේ කාලයෙහි සිංහල රාජ්‍යය පිළිබඳව පැවතුණු එක්තරු පිළිවෙළක් ඊට හෙතුවූ බැව් වැටහේ. කුරුණෑගල රාජධානියෙන් පසු කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන්ගේ රාජ්‍යෝදය දක්වා අතරකාලයතුළ චීපවක්‍රවර්තිවූ බලසම්පන්න රජකු නොසිටි බැවින් රාජබලය ඇතැම්විටෙක රාජවංශික කුමාරයන් දෙදෙනෙකුට බෙදී පැවැතුණේය. මේදෙදෙනා අතුරෙන් එක්කෙනකුන් මහරජ නමින්ද අනික්රජු ඈපා (හෙවත් යුවරජ) නමින්ද ඉතිහාසයෙහි පැනෙනු නමුත් දෙදෙනාගේ බලය බොහෝ සෙයින් එකසමානවිය. මේ පිළිවෙළට අනුව සලකාබැලූකල ශ්‍රී බුඩ වර්ෂ 1885 වන්නෙහි භුවනෛකබාහු රජු සවුළුවිජයබාහු රජුට යුවරජව ඒනරේඥයාගේ ඇවෑමෙන් 1890දී මහරජවූ බැව් හැඟේ. මේ (සතරවැනි) භුවනෛක බාහු දසවන්නෙහි "ශ්‍රීපරාක්‍රමබාහු ඈපාණන්වහන්සේ විසින්" කරනලද ක්ෂෙත්‍රපූජාවක් වේගිරිදේවාලයේ ගල්සන්නසෙහි සඳහන්ව තිබෙනහෙයින් යටත්පිරිසෙයින් ශ්‍රී බුඩ වර්ෂ 1895 දක්වා භුවනෛකබාහු රජහුගේ රාජ්‍යපරිපාලනය පැවැතිබැව් වැටහේ. ගඩලාදෙණියේ ශිලාලේඛනයෙහි "ශ්‍රීශකවර්ෂයෙන් එකාසූ අවුරුද්දක්

පිරුණු ශ්‍රීපරාක්‍රමබාහු "[1]එ(ක)ළොස්වනු" යි පැනෙන හෙයින් ශ්‍රී බුද්ධ වර්ෂ 1891 පමණෙහිදී සවුළුපරාක්‍රමබාහු රජු භුවනෛකබාහු රජහුට යුවරජව ඔහු ඇවෑමෙන් මහරජතනතුරට පත්වූබැව් සැලකියයුතුයි.

පස්වැනි පරාක්‍රමබාහුයයි ඉතිහාසයෙහි සඳහන්වෙන මේ සවුළු පරාක්‍රමබාහු රජු දවස් වෘත්තමාල සන්දෙස ශතකය හා තිසරසන්දේශ යත් රචනාකරනලද්දේයයනු අපේ කල්පනාවයි. මීට විරුද්ධ මත දෙකක් පවතී. යථෝක්ත සන්දේශදෙක ජයවර්ධන කෝට්ටේ ශ්‍රීපරාක්‍රම බාහු මහරජාණන්ගේ කාලයට අයත්යයි බොහෝ උගතුන් විසින් සලකනලදී. යටදක්වනලද සද්ධර්මරත්නාකර පාඨයෙහි පැනෙන සේනාලංකාධිකාර "සේනෙවිරදුන්ගේ මුනුබුරු පරාක්‍රමබාහු ඈපාණන්" ගේ කාලයෙහි මේ කාව්‍යයෝ රචනාකරනලදහ යන නවීන මතයක්ද තිබේ. මෙසේ මේ ප්‍රශ්නය පිළිබඳව මතභේදයක් පවත්නා හෙයින් අපේ කල්පනාවට සාධකවශයෙන් කියහැකි කරුණු ස්වල්පයක් මෙහි බහාලමු.

මේ කාව්‍යනායකවූ පරාක්‍රමබාහුරජු කවරකුවුවත් ඔහු ජාතිග්‍රාම (දූතිගම්) පුරයෙහි රජකළබවත් ඔහුගේ මවු සුමිත්‍රා නම් මෙහෙසියකු බවත් සන්දේශවයෙන්ම නිශ්චිතවේ. කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන්ගේ මවුබිසෝව සුනේත්‍රාමහාදේවිය බැව් පැරකුම්බා සිරිත ආදී කාව්‍යග්‍රන්ථයෙහිද පැපිළියානේ ශිලාලේඛනයෙහිද පැනෙනහෙයින් යථෝක්ත සන්දේශදෙක මේ රජහු පිළිබඳය-යන මතය කිසිසේත් පිළිගත නොහැකියි.

තිසරසන්දේශය කළ කර්තෘවරයාගේ නාමය අප්‍රකාශිත නමුත් වෘත්තමාල සන්දේසය ගතාරා නම් ස්ථවිරෝත්තමයකුගේ ප්‍රබන්ධයක් බැව් කාව්‍යනිගමනයෙහි පැනෙන "සරසිගාමමූල මහාසාමිනො භාගිනෙය්‍යභූතෙන ගතාරාභිධාන උපතපස්සිනා රචිතං වුත්තමාල සන්දෙස සතකං සමත්තං" යන පාඨයෙන් දක්වනලදී. මූන්වහන්සේ විල්ගම්මූල මහාස්වාමිපාදයන්ගේ බෑනණුවන් බවද එහි ප්‍රකාශිතයි. මේ දෙදෙනා වහන්සේගේ ඥාතිසම්බන්ධත්වය හා ආචාර්‍ය්‍ය ශිෂ්‍යත්වය

"සබ්බා දෙසප්පභූතාගත බුධමධුපා සෙවනාධාර භූතෙ
සීලක්ඛන්ධස්සුගන්ධෙ සකුලසරසිජෙ සඞ්ඝරාජාරවින්දෙ
පූරෙත්වා සුප්පතිණ්ණං ජිනවචන මධුං සංගහෙත්වා වසන්තා
පුඤ්ඤාධාරෙ ගතාරා ස උපයති සදා හංසපොතො පතීතො"

යන ගාථාවෙන් නිර්දිෂ්ටයි. මෙහි සඳහන්වූ සංඝරාජ ස්වාමිපාදයෝ ධාම් ගලතුරුමූල මහා ස්වාමිපාදයන්ගේ ප්‍රධාන ශිෂ්‍යවූ මයූරශතක

---

1 "පාළොස්වනු" යි බෑල් මහතාගේ මතයයි.

සන්නය, සිංහල මහාබොධිවංශය යනාදි ග්‍රන්ථකිපයක් රචනාකළ ගඟතලාකරඹවලින් පරපුරෙන් පැමිණි කල්‍යාණි විහාරාධිපති ශ්‍රී පරාක්‍රම විල්ගම්මූල මහා ස්ථවිරපාදයෝයි. මූන්වහන්සේ යට කියනලද කුරුණෑගල විතීය පණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණන්ගේ අයදමෙන් එළු බොධිවංශය කළබැව් ඒ පොත අවසානයෙහි කියන ලදී. කිත්සිරිමෙවන් කැලණිවිහාරයෙහි මේ මාහිමියන්විසින්ම පිහිටුවනලද ශිලාලෙඛනය ඉතාවැදගත් ලිපියකි. මේ සන්නසෙහි ප්‍රධාන කොටස් මෙහි බහාලමු:-

(1-22) "ශ්‍රී බුඩවෂී එක්වාදහස් අටසිය සත්‍යාසහවුරුද්දක් ගිය කල ශ්‍රීමත් ගඟතලාකරඹවලාන් පරපුරෙන් පැමිණි ශ්‍රීවන්ත විල් ගම්මූල මාහිමි පැරැ කිත්සිරිමේ රජයෙ පටන් ඥති පරම්පරුවෙන් හා බන්ධු පරම්පරු දසපරම්පරුවක් එක්සන්තතියෙ පැවත ආ කිත්සිරි මෙවන් කැලණිවිහාරයේ පිළිමගෙයි ඇතුළුවාසල්තුන මඩපය දගබ බොධිකොටුදෙක පවුරු පදනම් පසුමාලයේ තණගෙවල් පස ඇතුළුවූ සියලු ජරා[වා]ස කර්මාන්තන කුශලය විශිෂ්ට වව්පරපුරෙන් පැමිණි නිස්සංක අලගක්කෝනාරනම් අමාත්‍ය ශ්‍රෙෂ්ඨයාණන්ගේ පරම්පරු වෙන් පැවැත ආ දසවැනි අලගක්කෝනාරනම් අමාත්‍යොත්තමයා ණන් උපසනමහකරවා ගෙනාමුලපටන්කරවා............[39-51] මෙකී සියලු ගම් කුඹුරු මිනිසුන් ආදිවූ දෙය පන්දසක් අවුරුදු පවතින ලෙස බොධීන්වහන්සේට ඉරසඳ පමුණුකොට පුදවා වද්ළසේක. මතු ඇතිවන බන්ධු පරම්පරාවේ ගතාරු පිරිවෙන්සිටි තැනන් විසිනුත් සෙසු උභයවාසයේ මහාසංඝයාවහන්සේ විසිනුත් රජ යුවරජ මහ ඇමති ආදීන් විසිනුත් මේ පින්කම අනුමෝදන්වැ චිරාත්කාලයක් පැවැත්වියයුතු."

ශ්‍රී බුඩවෂී 1876 දී විල්ගම්මූල මහාස්ථවිරපාදයන් මාහිමි පදවිය ධැරූබව මේ ශිලාලෙඛනයෙන් නිශ්චිතයි. තවද ගතාරුනම් පිරිවෙනේ අධිපතිධුරය උන්වහන්සේගේ බන්ධු පරම්පරාවට අයත් බවත් මේ ලිපියෙන් පැනේ. එසේ හෙයින් වුත්තමාල අවසානපාඨයෙහි "සරසිගාමමූල මහාසාමිනො භාගිනෙය්‍යභූතෙන ගතාරුභිධාන උපතපස්සිනා" යනුවෙන් දක්වනලද්දේ මේ විල්ගම්මූල සංඝරාජ ස්වාමිපාදයන්ගේ බන්ධු ශිෂ්‍යවූ ගතාරු පරිවෙණාධිපති ස්ථවිරයෝයි. බු ව. 1876 දී මාහිමි පදවිය ධැරූ මූන්වහන්සේ පස්වැනි පරාක්‍රම බාහු රජහුගේ කාලය් දක්වා—එනම් තව විසිඅවුරුද්දක් පමණ—ඒ ධුරය උසුලමින් වැඩසිටින්ට බැරිකමක් නොපැනේ. මෙසේ මේ කාරුණු සලකාබලනකල මේ සන්දෙශ ශතකය යථොක්ත පරාක්‍රමබාහු රජහුගේ කාලයෙහිම රචනාකරනලද්දේය යන නිගමනයට තොබෑ සීම දුෂකරයි.

මීළඟට මේ සන්දේශය සේනාලංකාධිකාර සෙනෙවිරදුන්ගේ මුනුබුරු පරාක්‍රමබාහු ඇපාණන් කාව්‍යනායකයාට කරනලද්දේය යන මතයගැන මදක් කල්පනාකරබලමු. යටදක්වනලද සද්ධර්ම රත්නාකර පාඨයෙහිමුත් අන්‍ය කිසිම පොතක පතක හෝ ශිලා ලිපියක මේ ඇපාණන්ගේ නාමමාත්‍රයවත් සඳහන්වී නොමැතියි. එතකුදුවුවත් මොහු වීනයුඩයෙන්පසු ශ්‍රීපරාක්‍රමබාහු මහරජාණන්ගේ රාජ්‍යාදය දක්වා අතර ඇතිවූ අරාජක කාලයෙහි—එනම් 1952–1953 පමණේදී—ප්‍රමාණවත් ආධිපත්‍යයක් ඉසුලූබැව් සිතියහැකියි. මේ කාලයෙහි හෝ ඊට සමීපකාලයෙහි විල්ගම්මූල සංඝරාජකෙනකුන් වැඩසිටිබව යථොක්ත මතය අවලම්බනයකරන උගතුන්විසින් පෙන්වියයුතුයි. එපමණක්ද නොවේ. ඒ මාහිමියන්ට බෑනාණුවූ ගතාරු පරිවෙණාධිපති සථවිර කෙනකුන්ද ඒ කාලයෙහි විසූබවත් එසේම ඔප්පුකළයුතුයි. මේ බැරෑරුම් කටයුත්ත සඳහා ඒ භවතුන්ට සවකීය මතිමාත්‍රයවිනා අන්‍ය පිහිටක් ලබාගතහැකිවේයයි නොහඟිමු.

වුත්තමාලය පස්වැනි පරාක්‍රමබාහු රජහුගේ කාලයෙහි කරනලද්දේනම් තිසර සන්දේශයත් ඒ කාලයටම අයිතිවියයුතුයි. එසේ ගත්කල දැනට පවත්නා සන්දේශ කාව්‍යයන් අතුරෙන් මෙය ඉතා පැරණි සන්දේශයබැව් පිළිගතයුතුයි. මතු සඳහන්වන පස්වැනි භුවනෙකබාහු රජහුගේ කාලයේදී—එනම් ශ්‍රී බුද්ධවර්ෂ 1914 පටන් 1934 දක්වා අතර කාලයෙහි—රචිත මයූර සන්දේශයට තිස්හවුරුද්දකට පමණද කෝට්ටේ ශ්‍රී පරාක්‍රමබාහු මහරජහුගේ කාලයෙහි බඳනාලද සැළලිහිණි සන්දේශ, හංස සන්දේශ, ගිරා සන්දේශාදියට හවුරුදු 75 කට පමණ පූර්වයෙහිද මේ සන්දේශය කරනලදබැව් වැටහේ. තිසර සන්දේශය මෙ කියනලද අනික් කාව්‍යයන්ට වෘද්ධතරබව සන්ධිවිධි වාක්ප්‍රයොගාදී අභ්‍යන්තර කාරණාවලින්ද පෙන්වියහැකි වුවත් එබඳු පරීක්ෂණයකට මෙහි ඉඩනොමැතිහෙයින් අපවිසින් අභිනව සන්නයක් සමඟ මුද්‍රණයකරවීමට පිළියෙළකරනලද මේ කාව්‍යය සම්බන්ධ ප්‍රස්තාවනායෙහි ඒ විස්තර දක්වනුලැබේ.

පස්වැනි පරාක්‍රමබාහු රජහුගේ ඇවෑමෙන් රාජ්‍යශ්‍රියට පත්වූයේ තුන්වැනි වික්‍රමබාහු නරේන්ද්‍රයායි. මොහුගේ රාජ්‍යොදය වර්ෂය නියම්ගම්පායේ ශිලාලේඛනයෙන් නිසැකව දතහැකියි. නොඑක් කාරුණු නිසා ඉතා වැදගත්යයි සැලකියයුතු මේ සන්නස කොටු ශිලාස්තම්භයවත් දැනට සොයාගන්ට නොමැතියි. එසේදවුවත් මේ ශිලා ලිපියත් පූර්වෝක්ත ලණ්ඩන් මහා පුස්තකාලයට අයත් පුස්කොළ පොතකින් අපට පිටපත්කරගන්ට ලැබුණේය. සංස්කෘත

ශ්ලෝකමයවූ මූලභාගය පළිත්පළු අසම්පූර්ණ නමුත් රජහුගේ නම සහ වර්ෂාදි ප්‍රධාන කරුණු අනූනවම තිබේ. මෙහි ප්‍රථම ශ්ලෝකවය මෙසේයි:—

"ශ්‍රීශාකෙමධුරූපාබ්දෙ බුඩවර්ෂෙ තපොධිපෙ
වසුවිශෙව කලියුගෙ වත්සරෙ මාසි මාසකෙ
ශ්‍රීලඞ්කාපෘථිවීපාලරාජවංශවතංශක-
රාඥෙ වික්‍රමබාහොජීත්සරෙ සප්තදශාධිකෙ"

වික්‍රමබාහු රජහුගේ දසසත්වැනි වර්ෂය ශකවර්ෂ 1295 වද බුඩවර්ෂ 1916 වද කලියුගවර්ෂ 4474 වද යෙදුණුබව මෙයින් පැනේ. එසේ හෙයින් ඔහු යුවරාජ පදවියට පත්වීම බුඩවර්ෂ 1899 දී වියයුතුයි. "ශ්‍රී ශකවර්ෂ එක්දහස්දෙසියදෙයාසූ අවුරුද්දක් වළඳු ශ්‍රී වික්‍රමබාහු සතරවන ඇසළ අවපෑළවිය"යි විගුලවත්තේ ශිලාලිපියෙහි කියන ලද වර්ෂයද මීට ගැළපේ. සවුළු පරාක්‍රමබාහු රජහුගේ අවසාන වර්ෂය නියමකළ නොහැකිහෙයින් වික්‍රමබාහුරජ මහරජපදවියට පත්වූයේ කිනම් වර්ෂයේදීදැයි නිසැකව කියනොහැකියි.

මේ රජහුගේ කාලයේදී ප්‍රසිඞියට පැමිණි නිශශංක අලගක්කෝනාර හෙවත් අලකෙශ්වර මන්ත්‍රීශ්වරයාණෝ මහත්වූ ශෞර්‍ය්‍යවීර්‍ය්‍ය බලපරාක්‍රමයෙන් විරාජමානව ලොකශාසන සඞ්ග්‍රහයෙහි නියුක්තව වසනුවෝ ජයවඞීන කෝට්ටය කරවා යාපවුනුවර මහාභුවනෛකබාහු මහරජහුගේ අවසාන වර්ෂයෙහි පටන් සියක් හවුරුද්දක් පමණ ලක්දිව නානාතන්හි කඳවුරු බැඳගෙන සිංහල දෙශවාසීන් නොඑක් ලෙස පෙළමින් සිටි ආර්‍ය්‍ය චක්‍රවර්තීන්ගේ බලසෙන් පරදවා යාපාපටුනට නෙරපාහැර මහාජනයා සුඛිතකොට ශ්‍රී බුඩවර්ෂ 1812 වන්නෙහිදී පළාබත්ගල වනවාස පරම්පරානුගත ශ්‍රීධර්මකීර්ති මහාස්වාමිපාදයන් ලවා ශාසනශුඞියක් කරවූහ. මේ ප්‍රභුරාජයා පිළිබඳවද මෙකල නොඑක් වැරදි මත පවත්නාහෙයින් ඔහුගේ වංශය හා චරිතය සම්බන්ධව ඇදහියයුතු කරුණු ස්වල්පයක් මෙහි බහාලීම ප්‍රයොජනවත්වේයයි හඟිමු. නියම්ගම්පායේ ශිලාලෙඛනයෙහි:-

"වඤ්චිපුරවරාධීශො වණිග් වංශශිඛාමණිඃ
අලකෙශ්වරමන්ත්‍රීන්ද්‍රො රාජා ලඞ්කාමහීතලෙ"යි

වඤ්චිපුරයට අධිපතිවූ වෛශ්‍යවංශයට සිළුමිණක්බඳුවූ අලකෙශ්වරනම් මන්ත්‍රීන්ද්‍රයා ලඞ්කාභූමියෙහි රජවීයයි කියනලදී. මෙහි රජශබ්දයෙන් වොටුනු පලන් රජෙක් දක්වනලද්දේයයි නොසිතියයුතුයි. මේ කාලයෙහි සිංහාසනාරූඪවූ මහරජතුමා පමණක්නොව අන්‍ය මහාමාත්‍ය ප්‍රභුරාජාදි බලසම්පන්න අධිපතීන්ටද රජ යන නාමය සාමාන්‍යයෙන් ව්‍යවහාරකළබැව් පැනේ. ලඞ්කාතිලකවිහාරයේ ශිලාලිපියෙහි සෙනා

ලංකාධිකාර සෙනෙවිරදුන් පිළිබඳව රජ මහරජ යන වචනවයම යොදුතිබේ. අලකෙශ්වර මන්ත්‍රීශ්වරයා අයිතිවූ වෛශ්‍ය වංශයෙහි මූලස්ථානයවන වඤ්චිපුරය කාඤ්චිපුරයමැයි සමහරු සිතති. මේ වැරදි කල්පනාවකි. කාඤ්චිපුරය චොළ මණ්ඩලයට අයත් පුරාණ නගරයකි. වඤ්චිපුරය වනාහි කෙරළ දෙශයෙහි ඉතා පැරණි රාජධානියවූයේය. එය "පෙරියාර්" නම් ගඟබඩ පිහිටියේය. ඒ ගංගාවෙහි මුවදෙර පිහිටි (දැනට ක්‍රඟනූර්යයි කියනුලබන) නැව්තොට පුරාණ කාලයෙහි දඹදිව දක්ෂිණාපථයෙහි ප්‍රධාන යාත්‍රාතීර්ථයවූයේය. මිසරදෙශය යවනදෙශය ආදි එවකට ප්‍රසිද්ධවතුබූ සියලුම රටවලින් වෙළඳ නැව් මෙහි පැමිණියාහ. එහෙයින් මේ ප්‍රදෙශය ජම්බුද්වීපයෙහි ප්‍රධාන වෙළඳම්පළවැ ධනසම්පත්තියෙන් ආඪ්‍යවිය. අලකෙශ්වර මන්ත්‍රීශ්වරයන්ගේ මුතුන් මිත්තන් වඤ්චිපුරයෙහි ආධිපත්‍යය ඉසුලූ උසස් වෙළඳ කුලයකට අයත් බැව් මේ ශිලාලිපියෙන් පැනේ. මේ කුලයෙන් ලක්දිවට පළමුවෙන් පැමිණියේ නිශ්ශංක අලගක්කෝනාරනම් අධිපතියකුබව යටදක්වන ලද කිත්සිරිමෙවන් කැලණිවිහාරයේ ගල්සන්නසෙහි කියනලදී. ඒ අලගක්කෝනාර මන්ත්‍රිවරයාගේ පැමිණීම කවරකලක සිද්ධවීදැයි නිශ්චයකළනොහැකිවුවත් මේ ශිලාලෙඛනය පිහිටුවූ කාලයෙහි විසූ අලගක්කෝනාර මන්ත්‍රිවරයා "වඤ්චිපරපුරෙන් පැමිණි අලගක්කෝනාරනම් අමාත්‍යයාණන්ගේ පරම්පරායෙන් පැවැත ආ දසවැනි අලගක්කෝනාර අමාත්‍යොත්තමයාණන්" බව එහි සඳහන්වූහෙයින් මේ වංශය ඊට පෙරත් දීර්ඝකාලයක් ලක්දිව පැවැතුණුබව හැඟේ. ශ්‍රී බුද්ධවර්ෂ 1876 වන්නේදී කැලණිවිහාරය පිළිබඳ ප්‍රතිසංස්කරණයට විල්ගම්මූළ සංඝරාජ ස්වාමිපාදයන්ට උපස්ථම්භකවූ මේ දසවැනි අලගක්කෝනාර අමාත්‍යයා කවරෙක්දැයි විමසාබලනවිට වික්‍රමබාහු රජහුගේ කාලයේදී ජයවර්ධන කෝට්ටය කරවා දෙමළ සතුරන් පලවාහැර සිංහල දෙශය නිෂ්කණ්ටක කළ ඇමැති උතුමාම බැව් සිතන්ට ඉඩතිබේ. කල්‍යාණි විහාර නවකර්මාන්තයකළ කාලයෙහි ඔහුට තිස්හවුරුද්දෙක්විනම් බුද්ධවර්ෂ 1925දී ඔහුගේ වයස 79කි. මෙය විශ්වාස කරන්ට බැරිතරම් දීර්ඝ ආයුඃප්‍රමාණයක්යයි කියනොහැකියි. සිංහල අත්තනගලුවංශාරම්භයෙහි

"අත්තනගලු විහාරවංශාඛ්‍ය ප්‍රබන්ධය ශ්‍රී ශකවර්ෂයෙන් එක්වා දහස්තුන්සියසිව්වසක් පිරුණුසඳ ත්‍රිසිංහලාධීශ්වර නවරත්නාධිපති භුවනෛකබාහු නරෙන්ද්‍රයාහට අග්‍රාමාත්‍යවූ ශ්‍රද්ධාබුද්ධිසම්පන්න රත්නත්‍රය ශරණපරායණ අශරණශරණ ශරණගත වජ්‍රපඤ්ජර අනවරතදානයෙහි ප්‍රපඤ්චීකෘත විවිධ විභව සර්වයීකෘත වඤ්චිපුරප්‍රවරපවිත්‍ර පූර්ගොත්‍රෛකකාලප්‍රභූත චන්ද්‍රසූර්‍ය්‍යමණ්ඩල යුගලායමාණවූ ශ්‍රීලඞ්කාධීශ්වර අලකෙශ්වරනම් මන්ත්‍රීශ්වරයාණන් හා මෙම මන්ත්‍රීශ්වරයා

ණන්ට සහෝදරවූ පරනාරීසහෝදර යනාදි අනෙකප්‍රකාර විරුදවලී ඇති ස්වාර්ථපරාර්ථකරණප්‍රවීණ ඉෂ්ටාර්ථප්‍රසවය කිරීමෙන් අර්ථිජන මනෝරථපූරණයෙහි අත්‍යර්ථයෙන් අපිවූ අර්ථනායක නම් මන්ත්‍රීශ්වරයන් හා ........................................................................ ..." ඍතාදීන් මේ අලගක්කෝන්නාර අමාත්‍ය ශ්‍රෙෂ්ඨයාණන් හා ඔහුගේ සහෝදර අර්ථනායක නම් මන්ත්‍රිවරයකුත් සඳහන්කරතිබේ. මින්පසු මේ ප්‍රභුරාජයාගේ නාමය පොතකපතක හෝ ශිලාලිපියක නොපැනෙනහෙයින් මේ වකවනුවේදී ඔහුගේ අපවත්වීම සිඩවීයයි සැලකියයුතුයි.

යටකීයනලද විල්ගම්මූල සංඝරාජ මාහිමියන්ගේ ශිෂ්‍යවූ ලංකා සෙනෙවිරත් පිරුවන් තෙර සාමීන්විසින් විමුක්තිසංග්‍රහනම් ධර්ම ප්‍රකරණය වික්‍රමබාහු රජහුගේ අටළොස්වන්නෙහි කලබැව්

"අඩ්ඪාරසීහි වස්සෙ හි—රඤ්ඤො වික්කමබාහුනො
විමුත්තිසඞ්ගහං සෙට්ඨං—කතං ලොකාභිවුඩ්ඪිදං"

යන ගාථාවෙන් නිදර්ශිතබැවින් ඒරජු යටත්පිරිසෙයින් බුඩවර්ෂ 1917 දක්වා රජකළබැව් හැගේ. මේ රජහුගේ ඇවෑමෙන් 1914 පටන් යුවරජව සිටි පස්වැනි භුවනෙකබාහු රජ මහරජකමට පත්විය. මේ නරෙන්ද්‍රයාටත් අලගක්කෝන්නාර මන්ත්‍රීශ්වරයා මහඇමැති ව සිටිබව ඉහත දක්වනලද අත්වනගලුවංශ පාඨයෙන් පැනේ. මේ රාජ්‍ය කාලයට අයත් මයූර සන්දේශය අලගක්කෝන්නාර මන්ත්‍රීශ්වරය, ආදිපාදය, දෙවසවාමිය යන සහෝදර මන්ත්‍රීශ්වරයන් තුන්දෙනකු කාව්‍යනායකත්වයෙහිලා බඳනාලද්දකි. මේ කාව්‍යයෙහි පැනෙන

"රිවිසඳ තෙදයසස—රුඳි දිරිනි රන්ගිරියුරු
සයුරෙක් සේ නැර තියුගීනදින් සැ දී
අලගක්කෝන්නාර හිමි සිරිසඳ වැළ දී
සතපා උපාගුරු—ඈපාහිමිඳු පින්සරු
දෙව්තුරු මෙන් ලෙව්රුතිඳුන් තඳුන්යු ත
දෙව්හිමිසඳ සව්සැපතින් මුදුන්ප ත
පි නා නා මෙල්ක තුන්බෑමෙහිමි වෙ ත
ම නා නා ලොවිසිරි දෙවමින් සත ත
දි නා නා ලෙසින් තෙද දිවනා දිග ත
දි නා නා විකුම් දුනමැනැවී දියසෙ ත" *

---

* රිවිසඳ, සූර්‍ය්‍යචන්ද්‍ර දෙදෙනාමෙන්; තෙදයසසරුඳි, තෙජසින් හා කීර්ත්තියෙන් රජිතවූ; දිරිනි, ධෛර්‍ය්‍ය කාරණකොටගෙන; රන්ගිරි යුරු, සවර්ණපර්වතතුල්‍යවූ; සයුරෙක්සේ, සාගරය පරිද්දෙන්; නැර, නොහැර; තියුගීනදින්, සතුති ගීතනාදයෙන්; සැදී, සජ්ජිතවූ; සිරිසඳ,

යන දසපදසැහැල්ලෙහි මේ සහෝදර මන්ත්‍රීශ්වරයන් තුන්දෙනාගේ නම් පිළිවෙළින් දක්වනලදි.' කාව්‍යයෙහි අන්‍යස්ථානයන්හි මේ අධිපතීන් වෙන වෙනම වර්ණනාකරතිබේ. මේ සන්දේශයෙහි කාව්‍ය නායකවූ අලගක්කෝනාර මන්ත්‍රිවරයා පළමුකී නිශ්ශංක අලගක් කෝනාර ප්‍රභුරාජමැයි බොහෝ උගතුන් සිතන නමුත් ඒ මතය පිළිගතනොහැකිබැව් විමසා බලනවිට වැටහේ. මේ කාලයෙහිම පිහිටුවනලද සගම ගල්සන්නසෙහි

"......................නවරතනාධිපති ශ්‍රී භුවනෛකබාහු රාජෝත්තම වහන්සේ.................ශ්‍රී බෝධි වඩා ඇමිණි ගණවැසිකුල මාතෘවංශ පිතෘවංශ මේණවරකුල..................**අලකේශ්වර දෙවමන්ත්‍රීශ්වර දෙබෑසන්ද**....................."

යනාදීන් අලකේශ්වර දෙවමන්ත්‍රි යන සහෝදර අමාත්‍යයන්ගේ නම් දක්වා ඔවුන් මාතෘපක්ෂයෙන් ගණවැසිකුලයටද[1] පිතෘපක්ෂයෙන් මෙහෙණවර වංශයටද අයත්බැව් කියනලදි. නිශ්ශංක අලකේශ්වර ප්‍රභුරාජයා වෛශ්‍යවංශිකයකුබැව් නියම්ගම්පායේ ශිලාලිපියෙහි කපිතයි. තවද ඔහුගේ සහෝදරයකු යුවරාජව සිටිබවක් කිසි ලේඛනපතක සඳහන්වී නොමැතියි. එසේහෙයින් සගම සන්නසෙහි දෙවමන්ත්‍රීශ්වරයාටද මයූර සන්දේශයෙහි ආදිපාද දෙවස්වාමි යන දෙදෙනාටද සහෝදරයකුලෙස දක්වනලද අලකේශ්වර මන්ත්‍රිවරයා ඒ නිශ්ශංක අලගක්කෝනාර ප්‍රභුරාජයානොව අන්‍යයකු

---

වැළඳි, ශ්‍රීකාන්තාව විසින් ආලිංගනයකරනලද්දවූ; අලගක්කෝනාර හිමි, අලගක්කෝනාරස්වාමිද; සතපා, පරන්තපවූ හෙවත් තේජස් සහිතවූ; උපා, චතුර්විධ උපායඥනයෙන්; ගුරු, බෘහස්පතිහුවැනිවූ; පින්සරු, පුණ්‍යසාරවූ; ඈපාහිමිදු, ආදිපාදස්වාමිද; දෙව්තුරුමෙන්, කල්පවෘක්ෂයක් පරිද්දෙන්; ලෙව්, ලෝකවාසීන්ට; රුතිදුන්, අභීෂ්ටාර්ථදසිවූ; නඳුන්යුත, චිත්තසන්තුෂ්ටියෙන්යුක්තවූ; සව්සැපතින්, සකල සම්පත්තීන්; මුඳුන්පත, මස්තකප්‍රාප්තවූ; දෙව්හිමිසඳ, උතුම්වූ දෙවස්වාමිද (යන`; මෙළසා, මේලඛකාවිපයෙහි; නා, අධිපතිවූ; මෙතුන්බෑහිම්වෙත, මෛත්‍රිභ්‍රාතෘක (මන්ත්‍රී) ස්වාමීන් විෂයෙහි; පිනා, සන්තුෂ්ටවැ; අනා, මතුකාලයෙහි; සතත, නිරන්තරයෙන්; මනා, සිත්කලුවූ; ලොවිසිරි, ලෞකිකසම්පත්තිය; දෙවමින්, සලස්වමින්; දිනාතාලෙසින්, සූර්යයාමෙන්; දිගත, දිගන්තයෙහි; දිවනා, ධාවනය කරන්නාවූ; තෙද, තේජසද දිනාතා, ජයග්‍රහණයකරන්නාවූ; විකුම්, වික්‍රමයද; දිය, ජයද; සෙත, ශාන්තියද; දුනමැනැවි, ප්‍රදානය කළමැනවි.

මුද්‍රිත මයූර සන්දේශයෙහි මේ කවිය හා සන්නය මීට වෙනස්ව දක්වා තිබේ.

වියයුතුයි. ඒ අන්‍යයා නම් ඒ ප්‍රභූරාජයන්ට බෑනණුවූ වීර අලකේශ්වරනම් අධිපතිශ්‍රීබව කාරුණු සලකාබලනවිට හැගේ. ඔහුගේ බාලසහෝදරයා වීරබාහු ඈපාණන්බව සද්ධර්මරත්නාකරයෙහි කියනලදි. මේ ඈපාණන් මෙහෙණවර වංශයට අයත් බව නිකායසංග්‍රහයෙන් පැනේ. එසේහෙයින් මයූර සන්දේශයෙහි සඳහන්වන අලකේශ්වර ආදිපාද සහෝදර දෙදෙනා සද්ධර්මරත්නාකරයෙහි නිදිෂ්ට වීර අලකේශ්වර වීරබාහු ඈපා යන අධිපතීන් දෙදෙනාමයයි නිශ්චයකිරීම යුක්තියුක්තයයි හගිමු. මොව්හු සේනාලංකාධිකාර සෙනෙවිරත් මහාමන්ත්‍රීශ්වරයන්ගේ පුත්‍රයෝයි සමහරු සිතති. මේ මහාමන්ත්‍රීවරයාත් මෙණවරවංශිකයකුහෙයින් ඒ මතය සැබෑවියහැකිවුවත් ඊට සාධකවශයෙන් දක්වියහැකි කරුණක් මේතාක් අපට ලැබීනොමැතියි.

ශ්‍රී බුඬවර්ෂ 1925 පමණේදී නිශ්ශංක අලගක්කෝනාර ප්‍රභූරාජයා අපවත්වූපසු ඊළඟ පස්විසිහවුරුද්දතුළ සිදුවූ කරුණු නිකාය සංග්‍රහයෙහි හා සද්ධර්මරත්නාකරයෙහි පැනෙන කථාමාර්ගානුසාරයෙන් මෙසේ සලකාගතහැකියි. ඒ ප්‍රභූරාජයාගේ පුත්‍රවූ කුමාර අලකේශ්වර පියාණන්ට. අත්වතුබූ ආධිපත්‍යයට පැමිණියේවීනමුත් නොබෝ කලකින් වීර අලකේශ්වර ඔහු පහකොට රයිගම්පුරය අත්පත්කරගෙන ස්වකීය බාලසහෝදරවූ දෙවස්වාමි මන්ත්‍රීශ්වරයා හා ඒ නුවර රාජලීලායෙන් වාසයකෙළේය. එවකට ඔහුගේ අතික් සහෝදරවූ වීරබාහු කුමාරයා භුවනෛකබාහු රජහුට යුවරජව ගංපළ විසූවේය. මේ කාලයේදී මයූරසන්දේශය රචනාකරනලදි. එය ශ්‍රී බුඬවර්ෂ 1934ට පූර්වයෙහි වියයුතුයි. කුමක්හෙයින්දයත් ඒ වර්ෂයේදී-එනම් භුවනෛකබාහු විසිවන්නෙහි—ඒ රජහුගේ සුහුරුබඩු* වීරබාහු ඈපාණන් "රජතන්පත්"වූබව නිකායසංග්‍රහයෙහි කියනලදහෙයිනි. රාජාවලියෙන් උපුටා යටදක්වනලද දීර්ඝපාඨයෙහි පැනෙන එක්තරා ප්‍රවෘත්තියක් වීරබාහු ඈපාණන්ගේ "රජතන්" පත්වීමේ ප්‍රස්තාවට ගැළපෙන බැව් පැනේ. එනම් ආර්යචක්‍රවර්තීන් විසින් එවනලද දෙමළ සේනාවක් උඩරටට වන්කල්හි භුවනෛකබාහු රජු රයිගම්නුවරට පලායාම හා උඩරට සේනාව අප අත්හැරගිය රජුගෙන් කම්කිම්දැයි කථාකරගෙන සතුරන් පහරදී එළවාදැමීම ආදි කරුණු අන්තර්ගත කථා ප්‍රවෘත්තියයි. මේ ප්‍රස්තාවේදී වීරබාහු ඈපාණන් දෙමළුන් පරදවා රට ආරක්ෂාකරගත්බවත් යුඬයෙන්පසු භුවනෛකබාහු රජහුට ගංපළ නැවතත් රජකරන්ට ඉඩනොදී ඔහු "රජතන්පත්"වූ බවත් සිතියහැකියි. ඉක්බිති වැඩිමහලු සහෝදර වීර අලකේශ්වර

* "සුහුරුබඩු"යන්නෙහි තේරුම "භාර්‍ය්‍යාවගේ සහෝදරයා"යනුයි. උමංදයෙහි "පඤ්චාලචණ්ඩ කුමාරයන් සුහුරුබඩුණුවෝයයි ආලිස්සම්නොකොට" යනාදි පාඨය මීට සාධකයි.

ප්‍රභූරාජයාත් සමඟ සටන්කරන්ට ඔහුට සිදුවිය. රයිගම්පුරය අසල කරනලද සටනකදී වීර අලකෙශ්වර පරාජයවී දඹදිවට පලාගියේය. ජයග්‍රහණයකල වීරබාහුරජ නිකාය සංග්‍රහයෙහි කියූපරිද්දෙන් රාජ්‍යය පරසතුරන්ගෙන් ආරක්‍ෂාකොටගෙන ලොකශාසන සංග්‍රහ කෙරෙමින් ශ්‍රද්ධාවත්ව වසනුයේ ශ්‍රී බුද්ධවර්‍ෂ 1939 වන්නෙහි පළමුකි ශ්‍රී ධර්මකීර්ති මහාස්වාමිපාදයන්ගේ ශිෂ්‍යවූ නිකායසංග්‍රහ ආදි ප්‍රශස්ත ග්‍රන්ථ රචනා කළ, දෙවරක්‍ෂිත ජයබාහු ධර්මකීර්ති මහාස්වාමිපාදයන්ලවා ශාසන ශුද්ධියක් කරවූයේය. 1940–1941 පමණෙහිදී දෙශාන්තරගතවසිටි වීරඅලකෙශ්වර ප්‍රභූරාජයා බලසෙනඟක් කැටිව පෙරළා අවුත් වීරබාහු රජු පරදවා රාජ්‍යය අත්පත්කරගත්තේය. මේ අලගක්කෝනාර රජු දොළොස්වසක් රජකළපසු සද්ධර්මරත්නාකරයෙහි හා චීන ඉතිහාසයෙහි කියූලෙස "චීන මායමට" අසුවගිය සඳ සෙනාලංකාධිකාර සෙනෙවිරදුන්ගේ මුනුබුරු පරාක්‍රමබාහු ඇපාණන් ස්වල්පකාලයක් ආධිපත්‍යය පැවැත්වූ ඉක්බිති ලම්බකර්ණ වංශ පරම්පරානුගත ශ්‍රී පරාක්‍රමබාහු නරෙන්ද්‍රතෙමෙ රාජ්‍යශ්‍රියට පත්වූයේය. මේ මහරජාණන්ගේ රාජ්‍යොදය වර්‍ෂය දෙයාකාරයකින් පොත්පත්හි පැනේ. සද්ධර්මරත්නාකරයෙහි එක්පළක 1953 වන්නද තවත් තැනක 1958 ද රාජ්‍යොදය වර්‍ෂයලෙස දක්වාතිබේ. කාව්‍යශෙඛරයෙහිත් පැපිළියානේ හා සපරගමුදේවාලයේ සන්නසෙහිත් 1958 පැනේ. මේ වර්‍ෂවයම නිවැරදියි. 1953 වන්නෙහි රයිගම්නුවර රජවූ මේ නරපතිතෙමේ පස්වසක් පමණ සටන්කොට පළමු අරාජක කාලයෙහි ඒ ඒ පළාත්වල රජකම් කරන්ට පටන්ගත් අධිපතීන් මර්දනයකොට 1958 වන්නෙහි ජයවර්ධනපුරයෙහි අභිෂෙක මඞ්ගල්‍යය පවත්වා සිංහාසනාරූඪවූයේය. ශ්‍රී බුද්ධවර්‍ෂ 2010 වනතුරු මේ මහරජාණෝ රාජ්‍යශ්‍රිය අනුභවකළහ. ශතවර්‍ෂාර්ධයකටවැඩිවූ මේ රාජ්‍යකාලයතුළ ලඞ්කාද්වීපයෙහි ආශ්චර්‍ය්‍යමත්වූ උන්නතියක් හා සමෘද්ධියක් ඇතිවිය. චීන දෙමළ ජාවකාදි නොඑක් සතුරන්ගෙන් පීඩිතව අභ්‍යන්තර භෙදයෙන් භින්නව අතිශයින් දුර්වලව සිටි සිංහල දෙශවාසිහු මේ රාජ්‍යාරම්භයෙහි අපරාධීන. ජාතියක්සේ හිසඔසවා ගන්නට ඉඩලැබ තමන්ට අහිමිවතිබූ ඓශ්වර්‍ය්‍යය හා කීර්තිය නොබෝකලකින් ප්‍රකෘතිමත් කරගත්හ. මුළුරටම ධනධාන්‍යයෙන් සමෘද්ධව සුභික්‍ෂව සශ්‍රීක භාවයට පැමිණියේය. බුද්ධශාසනයද නිර්මලව බැබළීමට පත්වූයේය. ත්‍රිපිටක බුද්ධවචනයෙහිද සමයාන්තරයෙහි හා නානා භාෂාශාස්ත්‍රයෙහිද පතළාවූ අනුපමඥනයෙන් විරාජමානවූ මහාපණ්ඩිතරත්නයන්ගෙන් ලක්දිව ශොභාමත්විය. මේ විවිධ විශිෂ්ට අභිවෘද්ධියට මූලකාරණවූයේ ශ්‍රී පරාක්‍රමබාහු නරෙන්ද්‍රොත්තමයාගේ බලවික්‍රමය හා ප්‍රඥසම්පන්න දෙශපාලනය මැයි.

ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන්ගේ ධර්මිෂ්ඨ රාජ්‍ය පරිපාලනයෙන් සුඛිතව ඔදවැඩීගියාවූ තත්කාලීන සිංහල ජනසමූහයාවිසින් පවත්වනලද ප්‍රීතිඝෝෂණයෙහි ප්‍රතිරාවයක්බඳුවූ මේ කාව්‍යයෙහි ඒ නරේන්ද්‍රයාගේ වීරචරිතය පිළිබඳ ශ්‍රද්ධාශීලශ්‍රැත ත්‍යාග ප්‍රඥාදි ගුණසම්පත්තිය හා කීර්ති ප්‍රතාප බලමහිමයද ඇසූවන්ගේ කන් පිනවන්නාවූ චිත්තප්‍රබෝධක ප්‍රෞඪ පද්‍යයෙන් වර්ණනාකරනලද්දේය. ලංකාඉතිහාසය සම්බන්ධ අප්‍රකට කරුණු රාශියක්ද මෙහි අන්තර්ගතය. සිංහල භාෂායෙහි මධුර කෝමල ගුණය හා වාග්විලාසය මෙය කියවන කාටත් ප්‍රත්‍යක්ෂවේමැයි. නානාවිධ වෘත්තවලින් බඳනාලද මේ කාව්‍යය ආශ්‍රයකොටගෙන මීටපසුකාලයෙහි හටන් කව් ආදි රාජප්‍රශස්ති ප්‍රබන්ධයෝ රචනාකරනලදහ. මෙසේහෙයින් සිංහල වීරපුරුෂ නරපතියකුගේ උදාරචරිතය හා ලංකා ඉතිහාසය පිළිබඳ කරුණුද සිංහල භාෂාව හා කාව්‍ය රචනාව සම්බන්ධ මාහැඟි ගුරූපදේශයන්ද. අවබෝධකරගැන්මට ඉවහල්වූ මේ පැරකුම්බා සිරිත යහපත් ශුද්ධියකින් හා සත්‍යයකින්ද යුක්තකොට මහාජනයා අතට පමුණුවාලන්ම කරනලද මේ ප්‍රයත්නය සිංහල ජාතිය හා සිංහල භාෂා ශාස්ත්‍රයෙහි වර්ධනයට හිතැති සුධීන්ගේ සන්තුෂ්ටියට හෙතුභූතවේයයි සලකමු.

D. B. J.

1922 ජූලිමස 31 දින
කොළඹදීය.

# ශුද්ධිපත්‍රය.

## පැරකුම්බාසිරිතෙහි-

| කවිය. | පදය. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 25 | 1 | සසිරි[4] | පිරිසුදු[4] |
| 28 | 2 | පැළද | පැළැඳ |
| 56 | 4 | පැළඳවි | පැළැඳවි |
| 57 | 3 | නිරිඳේ | නිරිඳෝ |
| 68 | 3 | තිළිණෙති | තිළිණති |
| 69 | 2 | [5]සිරි | [5]නම |
| 74 | 4 | බුජ | බුජ |
| 119 | 4 | සැරදු | සැරද |

## ව්‍යාඛ්‍යායෙහි-

| පිට. | පේළි. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 19 | 3 | අපිරිමිත | අපරිමිත |
| 21 | 15 | චක්ෂුෂට | චක්ෂුසට |
| 22 | 31 | කාමාරොතතමයා | කුමාරොත්තමයා |
| 27 | 26 | සුවර්ණයෙන් | සවර්ණයෙන් |
| „ | 34 | විපි | පිපි |
| 28 | 20 | ත්‍රිවීධ | ත්‍රිවිධ |
| 44 | 15 | යසඔඝ | යශඔඝ |
| 54 | 31 | ප්‍රියාලා | ප්‍රියාලාප |
| 65 | 15 | වජෑ | වැජෑ |
| 66 | 14 | ජ්‍යොත්ස්නා | ජ්‍යොතස්නා |

36 වැනි පිටේ 46 වැනි ව්‍යාඛ්‍යායෙහි—"දඹදෙණිවැසි, ජම්බුද්‍රොණිවාසතව්‍යවූ; දුල, ජ්වලත්වූ; යස, පරිවාරසම්පත්ඇත්තාවූ; පැරකුම් රජ, පරාක්‍රමබාහුමහරජහුවිසින් (තමාගේ); තෙදබලයෙන්, තෙජොබලයකාරණකොටගෙනෑ; කුලවන්තින්, ................................" මෙලෙසගළපා අර්ථ කියයුතු.

## ප්‍රස්තාවනායෙහි–

| පිට. | පෙළ. | වරද. | නිවරද. |
|---|---|---|---|
| v | 5 | සතාඞකරය | සතාඞකාරය |
| ix | 8 | මූතු | මූතුන් |
| " | 27 | දළදා | දළදා |
| | 29 | මරුවාහ. | මැරුවාහ. |
| xii | 14 | අවුරුදදෙක් | අවුරුද්දෙක් |
| " | 15 | රාජ්‍යශ්‍රියව | රාජ්‍යශ්‍රියට |
| " | 20 | දිලිසෙන | දිලිහෙන |
| " | 24 | සුඹලි (සොලි) | සුඹලි (සොළී) |
| " | 29 | ගඳදුම් | ගඳදුම් |
| xiii | 22 | කොලාහාල | කොලාහල |
| xiv | 25 | ඉන්පසු වන්නිභුවනෛකබාහුය...... යන පව නරේන්ද්‍රයන්ගේනම් | ඉන්පසු වන්නිභුවනෛකබාහුය, සවුළු විජයබාහුය, (සතරවැනි) භුවනෛකබාහුය, සවුළු පරාක්‍රමබාහුය, පණ්ඩිත වික්‍රමබාහුය යන පව නරේන්ද්‍රයන්ගේනම් |
| | 22 | අප්‍රාකාශිත | අප්‍රකාශිත |

"අළනක්කෝනාර" "අළකෙශ්වර" යන නන්හි ළකාර ලකාර වියැයුතු.

# පැරකුම්බා සිරිත.

## නමව් රුවන්තියා.

1. පිහිටි කුලුණඹතු ර
දහම්මුවරඳරස බ ර
සෙව් සුරතණබම ර
වඳිම් මුනිරජතඹර සිරිස ර

2. මුනි[1] මුවගින් පහ ළ
මහසිලිල [2]පලසිහිල ළ
පිවිතුරු මොක්වෙර ළ
වඳිම් අදරින් දහම්ගඟ ලෙ ළ

3. පෙළදම්[3]මියර යු ත
මුහුකළ සිල්දියෙන් ප ත
මහපලකරල් ග ත
වඳිම් මහසඟපවරපින්කෙ ත

4. ස ත ත සක සකඅ ත
තිනෙත ගජවත බරනෙ ත
ත ල ත ගුරු කිවි න ත
ස ත ත සලසත් [4]මෙසුර සතසෙ ත

5. සාළොත් ගුරු සේ වේ
සුවඳ පතනළ සේ වේ
නො මෙ කැරූ එ සේ වේ
[5]බැඳුමැ කව්තළබස් කෙ සේ වේ

6. මහත වියතුන් බ ස
නොදැනත් ඇසුව වේ නො ස
දැසමන්මල්රූ ස
නොසිඹු දුටුවත් දැනේඇනිලෙ

7. වියතුන් ඉ දි රි යේ
[6]නොහොබී කුකි වි දි රි යේ
දිවයුරු ඉ දි රි යේ
කෙසේ බැබළෙද සාන මැ දි රි යේ

8 පැහැය සුදු නිල් ර තු
ඇසට මැ පැනේ[7] සිත් යු තු
නෙපලනු කිමැ අමු තු
දනිත්[8] නුවණැතියො කිවිබස ත තු

9.

අතුරුකප පෙර උපන් බඹපුත්විවස්වත්මනුරජකුලෙන් ප ත
ඔකාවස්පුතු බානු මන්දතු පසේනදි සුදසුන් බගීර ත
නහුස සංකති රගු දිලීප තිසංකු නළ නාබාග දසර ත
රාම ලක්මණ කුස ලවාදී පසිදු සක්විතිරජුන්ගෙන් යු ත

---

1. බසගින්.
2. රුත්මින්සැල.
3. නියර.
4. මෙදෙව් සුබසෙත.
5. බැඳුම්, බඳුත්.
6. නොහොබි කුසාව් සරියේ.
7. ඇතිතතු.
8. දකිත්

10.

දහම් සෝ රජ සසිර් මාබෝ දකුණුසාසා එවත මෙලක ට
උතුම් තම කුලෙනෙවී සුමිතුරුකුමරු සමගින් කුලන් දසඅ ට
දකිම් නී උන් දෙවනපෑතිස් ලකිසුරු සෙදූ පෙරගමන්කො ට
වැඩුම් කැර ඒ දුමිඳු අනුරාපුර වෙතෙයි පුද පෙරහරින් තු ට

11.

එකල එතිරිඳු සුමිත් කුමරුන් පළඳවා මිණිවොටුනු පිවි තුරු
උදුල සත්ම හුලැ තු පිටින් පුර [1]වැඩමකරවා පුදෙන් විසි තුරු
තිමල කුලපරපුරෙන් එන ලෙස දෙමින් ජයමහලෑන තන තුරු
විපුල අදරින් සැලසි දුමිදුන් පුදසිරින් කරවනුව තිර තුරු

12.

මෙලක රජ කළ පවර ගජබා තිරිඳු මාවටුපුරෙන් සොළිර ට
එකල සැටවස් පුරාගෙනගිය දෙළොස්දහසක් දනන් සිරකො ට
අසා රුහැණිවැ ගදගෙනෑ පසළොස්රියන් තුන්රියන් දිග ව ට
මූද පීනා උරතෙලෙයි ගෑ සඳුන් නොමකා ගොසින් එතර ට

13.

පිවිස සොළිපුර එරජගෙට ගොස් සමඟ ඔහු සිහසුනෝ උන්ස ඳ
මෙ ලෙස සිහළිඳු තනිවැ ආයේ කිමැයි පුළුවුත් සෙමෙන් සොළිර ද
දෙළොස දහසක් පෙරපතුවරින් දනන් ගෙනෑ ආ තුඹගෙ පියර ද
තොලස ගෙනැයන ලෙසට ආමැයි කියන තෙපුලක් වෙමින් වැඩිඹ

14.

තිරිඳ සි සි කියනු කිමැ බස් මෙසේ නොතකා අප සොළින්මැ ද
තවද වැලිමැඩැ තෙල් [2]යපාදිය ගතැකිඳේ කවුරුන්විසින් ත ද
එසඳ සොළිඝා බසට [3]රුහැණී වැ ගදා මිරිකා රුපැයි දියසා ඳ
[4]පැහැද දුන් අඩු නොවැ ගේනායේ සුවිසිදහසක් දනන් නොවර ද

15.

රජෙක් සිරිසඟබෝ නමින් යුත් තවට වල වැදූ පවට බා
උදක් මෙත්සිත් වෙමින් [5]උන්නේ, එකලැ නරනිදු ගොළුඅ බා
යමෙක් ඔහු සිරගෙනා නම් දෙන ලෙසට දහසක් රන් ත බා
එවක් අණබෙර ලැවී රට, ඒ අසා බැලයෙක් දන ලො බා

16.

ගොසින් වලවන් තිරිඳු දිටි, එද අසා ඔහුගෙන් රට පව ත්
[6]තොසින් සිය සිර ඔහුට දන්දිනි, එහිස දෙස් කී ගිය තැන ත්
රිසින් බුදුබව ලබනු බුදුකුරුදහම් සපයන එ බෝස ත්
යසින් සිරිසඟබෝ නමින් දැන් ලියති වනුවක් රජමග ත්

---

1. වැඩුම්කරවා. 2. යපුදිය. 3. යගදා අතින් මිරිකා රුපැයි දියනඳ.
4. පැහැදදුන් දහසක් දෙළොස් අඩුනොව ගෙනාවේ දනන් නිවරද. 5. උන්සඳ.
6. තොසින් සිය සිර එවිට දන්දී ඔහුට දෙස් කී ගියතැනත්.

17.

තෙදින් මහසෙන් නමැති මහසෙන් රජෙක් ඉදිනා වෙහෙරනුප්පු ර
රි යන් සතලිස් තුරා සියයක් කරවමින් මහසෑයක් මතහු ර
බුදුන් ගුණ සලකා පවිදු සුරපුරෙන් බසිවිසි ඉඩිණ කෑ, ර
ලූ දින් නොවැඩිය රහබොමැසි රහවිත අතින් ගෙනා සිටිති එමෙව

18.

ව ඩා [1]ගෙනැ උන් සුරිදු නුබගබ ලඹ පවිලූ එ නරනිඳු දූ ක
ද මා රාවිත සුවඳසිලිලෙන් දෙවැ නමා සුබ ලකුණු අත්දෙ ක
එ ද අල්වත අසුරියනක් පබණ දුරුකැරැ නැගී සගස ක
යොද උකුලේ හුබූ සිරියැදූ ගෙනැ කැපී පැනැ ඉන් අඩක් එ ක

19.

වි සේ ස වැ ලක මීදුමාහිමි පුද සිරිත් පැවැතෙන ස ද
දෙ සේ කලිඟෙක් වඩා සපැමිණි දකුණුදළඳ වැඳැ පු ද
උ සේ සත්මගලින් අලුත් [2]ලෝමහපහා කර මතන ද
මෙසේ තෙදියන පසිදු වී කිත්සිරිමෙවන් නරනිඳුස ද

20.

විසූ නාලොවැ පවා නසිඳුන් නිරෝ කැරැ ලැබැ මිණි ම නා
මුසූ කරුණා නුවණ ගුණයෙන් සතන්හට මව් පිය මෙනා
අසූ මහසවු නම් තබා කුමරුන් අසූවක් ලැබැ ගෙනා
අසූ වක් හවුරුදු කෙළේ රජ බුජස් රජ ලෝවැඩ ත නා

21.

දෙටු පතිස්රජ අනඳහිමිරුව රනින් කැරැ රතයක ව ඩා
ඉ ටු මෙ තුන්රජයේ සඟුන් සහ රුවන්පිරිතින් පැන් ව ඩා
ප ටු න වේමැදූ ඇවිදූ [3]රෝයක්දුබික්බිය දුරු කැරැ ව ඩා
තු ටු කෙළේ ලක කලට මහමේ වස්වමින් දියසෙත් ව ඩා

22.

වියත් සිළුමිණි ඇදුරු බුදුගොස් මහතෙරුන්හට දඹදිවින් වැඩි
මහත් වෙහෙරක් රනින් කරවා දෙමින් [4]තෙකෙළක් පමණ අඩුවැඩි
සුගත් හට මෙන් පුදූ වෑඳැ නිති ලියවමින් අටුවා දහම් වැඩි
දිගත් ගෙබවී යසින් මහනම් සිරිනිවෙස් නම් නිරිඳු [5]ඔද වැඩි

23.

වෙහෙර දසවක් පුරා කරවා දහඅටක් මහවැව් බැ ඳි
ව ස ර එකදූ බිසව් අබිසෙස් මහණුවම් තෙමගුල් යෙ දි
ඇ ජ ර [6]කිවිවර පිනින් ජානකිහරණඇ මහකව් බැ ඳි
කු ම ර දස් රජ කාලිදස් නම් කිවිඳුහට සියදිවි පි දි

1. ගෙනවුත්.
2. ලොහොමහපාය.
3. රෝදුක්දුබික් දුරුකැර ඇර විඩා.
4. දෙකෙළක්.
5. එඩි.
6. කිවියරබැවින්.

24.

[1]ඉමල් හල මුනිලෙසින් වදහළ මෙලක [2]රකිනුව මෙත්සි හින්
[3]උපුල් වන්දෙව්රජුන් පිළිරුව වඩිනු දක මහසයුර ඝින්
විමල් ගුණයුත් නමින් දපුලුසෙන් රජෙක් ආ එමොහො හින්
විපුල් සිරි දෙව්නුවර කරවා පිහිට කැරැවී යහප හින්

25.

සසිරි [4]මාතාවුලුපුරෙසි ඉඳුපරපුරෙන් ආ පිරිසු දූ
සොළින් වසඟවැ තුබූ රට ගෙන [5]එ සානුවක් අවුරු දූ
මුනිසසුන් [6]රට වවා අමුතු වැ මනුරජේව් පිළිවෙළ සෑ දූ
එ සිරිසඟබෝ විජයබාරජ විසී පස්පනසවුරු දූ

26.

පොළොන් නරු පුර එපැරකුම්බානිරිඳු ලක එකසත් කා රා
ගොසින් අරමණ සොළී පඬිරට රැගෙන යුදයෙන් යස පු රා
යෙහෙන් දෙදහස්පන්සියක් මහවෙහෙර කරවා මනහ රා
තෙදින් දිවයුරු ලෙසින් බැබැළී ලෝසසුන් දුකඳුරු හැ රා

27.

මෙලෙස තෙදබල මහත් අණසකඇති රජුන් කුලැ පිවිතු රු
සවුළු [7]විජේබා නිරිඳුපිත් පැරකුම්රජුන්හට මුනුබු රු
ලැමැති [8]ජයමහලැන හිමි සුරතුර [9]වෙළු රන්ලිය යු රු
සුනෙත්මහදෙව්බිසෝහිමි ලත් රජරුවක් සොඳ බුදුකු රු

28.

උතුම්ගුණයුත් මෙ පැරකුම්බානිරිඳු රසිගම් නම් පු රා
බරණ සුසැට සිද්දවොටුනුත් පැළඳ විලසින් පුරඳ රා
වෙළෙඳගොවිකුල වන්නිනිරිඳුන් නොදූන කළ නොසිරිත් ව රා
බබුළුවා ලෝසසුන [10]හෙබවී සරසමින් කුල දිවයු රා

29.

දකුතු මෙනිරිඳු නුවන් ලත් පල ලැබෙයි සිතුවොත් දුක් ඇ රේ
නුමූතු රසබස් ඇසුව [11]දෙව්ලොව සැපත් පැමිණෙයි අරන රේ
දිමූතු යස තෙද නුවණ ගුණ කිව කැමැති යම්දෙය සිදුකො රේ
අමූතු බැඳි පද නියම් එබැවින් අසව් වියතිනි සබතු රේ

---

1. යමල්හල.
2. රකිනා.
3. උපුල්වන්දෙවුමහරජාණන්.
4. පරසිදු.
5. සයානුවක්.
6. ලක.
7. විජයබ.
8. ජයමහලනම් ඇඹි.
9. වැළඳී.
10. පැලඹෙයි.
11. දෙලොවම.

30. පැහැ දිස ර ම් බා රැඳි,මත ර ම් බා
තුනු සිරි ර ම් බා පති පිළිති ම් බා
රුපු රජ ර ම් බා රත මහකු ම් බා
දිහ පැර කු ම් බා හිඹි තෙවිතු ම් බා

31. ර ත ගලතල යුරු පැහැසර පුලුලු ර
මෙ ත දෙව්රජගජකර දිගු යුගක ර
ම ත පිනවන පුල් සල්තුරු සිරිබ ර
දි ත කැත්කුලමිණි පැරකුම් තරව ර

32. ලකා තුන් රට මුළු දඹදිව පිළිබ ද
නිරි ඳු න් බිහුකැන් ගුණසුවඳින් සො ද
අ වු දි න් ගෙනැ යත රන්මිණිමුවර ද
මෙරදුන් සරණත තඹරෙකි මතත ද

33. [1]ස ගුණෙන් පුවතර මෙනිරිඳු සසො බා
ති ළි ණෙන් ජයගෙන දලලඹ නිල බා
බ ල යෙ න් ගත් ලෙළ විදුලිය [2]සෙ ප බා
සො බ ම න් පදසිරි [3]වැකි රන් සල බා

34. සි ළු මිණි රජ මොහු දෙවටොර පුව ලා
ස ළු මිණි බරඳුල් ගවසත ලකා ලා
මු ළු ලොව උසුලන රන්වැම් [4]යුව ලා
ලෙළු මෙන් දනමන පිනවයි නොව ලා

35. දි ත කර සිය රුමිණිසර පුව ලා
මි ත ඉණසැදරළ මුතුපෙණ ඔස ලා
ග ත වෙරළත ගඟ තිළිණෙන් වත ලා
ර ත වැලිතල වැනි මොහු පුලුලුකු ලා

36. පි න් සර පැරකුම්නිරිඳුගෙ සිරිම ත්
දු න් කොකුමඟරු උර මුතුහර යු ත්
[5]ර න් මෙරගිරි මැද පිළිබිඹු සිසිප ත්
මෙ න් තරුවැළ බැබැළිණි සැඳැරුප ත්

37. ර තු මිණිතවපලු නිල්මිණි[6]කොළද ර
මු තු මල් පිපි රතරොන් වැළ පැගෑස ර
සි තු ලෙස දෙන විතරණගුණපලඹ ර
අ තු සිරිගති මෙනිරිඳු අතසුරතු ර

1. සෞණෙන්.
2. පසුබා.
3. වැනි.
4. සඟලා
5. රන්මෙර ගිරිතල මැද පිළිබිඹු පත්
6. කොදතුර.

38. මැද  ලප වැනි රසඳුන් බැකි යුගනෙ  ත
බ ඳ  තරුවැල මිණි අබරණ සවත  ත
ම ඳ  හස සඳකැන් [1]පිරි සත නෙතු නෙ  ත
ස ඳ  මඩලෙකි පැරැකුම්රජ වුවන  ත

39. දි ය නෙ ත  කුලපති මෙරජුගෙ මන න  ඳ
සි රි අ ත  රන් දපණෙව් වුවනත සො  ඳ
ස ව න ත  ·රතු මිණි කැන් රිවිරස් වැ  ද
පැ හැ ප ත  නව පුල් පියුමෙකි ඇමස  ඳ.

40. වි දු  ලිය තර සර තුහු සිහු සිරි ග  ත
උ දු  ඉඳු සැවු සිය ඇත එහි මුදුන  ත
බු දු  කුරු මෙනිරිඳු රන්කිරුළගප  ත
රැ ළු  නව මිණිකැන් එමැ විලසින් යු  ත

41. ම හ සෙ න්  පිරිවර තරුමැද සඳයු  රු
ග න ර න්  රතයට නඟිමින් විසිතු  රු
මෙ ර දු න්  පැදකුණු වනලෙස පුරතු  රු
සු ද සු න්  වේ මැද පත්වැනි පුරඳු  රු

42. න රි ඳු  ගුණයෙන්,  ගැඹරින්  කි රි ළු
කි රි ඳු  බල යෙන්,  දිරියෙන්  ගි රි ළු
ගි රි ඳු  නුව ණින්,  විකුමෙන්  සි රි ළු
සි රි ඳු  දින පැරැකුම්බුජ  නි රි ඳු

43. ම න ර ම්  සිරිපති සරසවි රසව  ත්
ග න ගු ම්  සක්සෙවි වෙරළත තුරුයු  ත්
වි හි ගු ම්  මින් නද පුන් සඳ නඳව  ත්
පැරැකු ම්  රජ සයුරෙකි කගමිණිග  ත්

44. මෙනිරිඳු  සුවිමල් යසසට දිමු  තා
එ කා බ ඳු  වනලෙස පැහැයෙන් නුමු  තා
සුර නි ඳු  නුසුලා ගජ, [2]හස සත  තා,
උ ර ගි ඳු  විදු, සෙවි කොලෙසද තිනෙ  තා

45. දි ය බ ඳ  සියුවත කළ තුරු සෙනෙහ  ස
සි රි ස ඳ  සරසවිවෙත සමඟ වැ වැ  ස
ම න න ඳ  පැරැකුම්හිමි නුබගුණරැ  ස
කොලෙසද  පරදරපව් දුරුකළ ලෙ  ස

1. වැද දිළිවත් පත.  2. හස.

46. දු ල යස පැරකුම්රජ දඹදෙණිවැ සි
කු ල වන්තින් මැඩි, තෙදබලයෙන් නි සි
නි ල ලා සිරිලක තැන්පත් කළ ලේ සි
[1]කැ ල ඹු දිය පැදුවැති අගති සි

47. අ ණ තද මෙතිරිඳු ඹැකි නොම කා ළ ම
ගු ණ සරැ අකරනවන් ගන කා ළ ම
බැ ණ නැඟු තද අසමින් රන් කා ළ ම
ර ණ දෙරණත නොසැලේඳ්‍ දේ කා ළ ම

48. බා ති ය රජවන් පැරකුම්දිනර ද
ජෝ ති ය වත සියුරඟසෙන් රැස් කා ද
ජෝ ති ය සිටු නරවරගනඳරකා ද
බි ති ය කැර ගියෙ පරසක්වළ වැ ද

49. කි වී කැලන් ඔද යසසින් සුර ර ද
රි වී කුලෙන් පැවැතෙන පැරකුම් ර ද
ගැ වී සුරත සිරිපාසරමුව ර ද
නි වී නැවුල්සිත ඈපාහස ර ද

50. පි ති පා වන් පිරිසුදු යසවතු රැ
සි ය පා තෙදයුත් මෙරජුගෙ සොඳු රැ
සි රි පා නියරස්ගඟ බැස මහ රැ
ස ත පා ගති ගිම් ගංපළ කුම රැ

51. ර න් කොඩි මෙ න් වැ ඩි මුළුලොව ප සි ඳු
පි න් දූ ඩි යෙ න් වැ ඩි පැරකුම් නි රි ඳු
ම න් එ ඩි යෙ න් අ ඩි යක් පසු නො වි ඳු
කා න් ත ඩි ම න් මැ ඩි විකුමෙන් පු රැ ඳු.

52. නැ රි ය ජයමන් පෙර සිවැ පුරැ ඳු
වී රි ය බලවිකුමෙන් සරි මිගි ඳු
ආ රි ය සක්විති රජකුල කුමු ඳු
සූ රි ය හිමි දිත පැරකුම් නිරි ඳු

53. [2]නි ර සර පැරකුම් රජ කි මේව ර
කැ ර මුදුනත සෙන් වැදූ සොළියා පු ර
ව ර [3]කුරුඩයන් මාලවරාය ර
පෑ ර යු පැලඹෙන තෙදණින් බාසු ර

1. කැලඹුණු. 2. නිරතර. 3. කාදවුරු සිද.

54\. උසුලනු පැහෙනුය දෙරණිඳින් ලිය    තු රු
මෙනිරිඳු·දුන් සුරතින් ගත් පිවි    තු රු
තිලුපුල් පැහැයුතු කගලිය තිර    තු රු
මිහිකත උසුලා කියලිය විසි    තු රු

55\. රණහණවන් රුපුවෙරලේ දිය ඉ    සි
කගලිය මෙ රජුගෙ යසමල් පිපිනි    සි
එහි රජසිරිපල ගෙනැ දසදම්රැ    සි
සත දදගණ තුටුකෙළෙ මුළුලෝ වැ    සි

56\. ග රු  තර තරසර දිරිසරි    ගි රි ඳු න්
හි රු  කුලකිරිසමුදුර යුරු    ත රි ඳු න්
ස රු  ගුණ පැරකුම්රජ සරි    සු රි ඳු න්
කි රු  ළිස පැළඳවි සොළී පඩි    නි රි ඳු න්

57\. කා ල ඳේ  කොඳ කිරණව හස හා    රැ
ය ස ඳේ  පැරකුම්නිරිඳු උදා    රැ
නි රි ඳේ  සඳ රිවිකුල සරු සා    රැ
බැඳෑ ඳේ  මුදුනත් සිටිති නොවා    රැ

58\. මෙ නි රි  ඳු විකුමන් සිතුවොත් වැරසැ    ර:
මහමෙර  තුඹසෙකි, කිඳුලෙකි සමුදු    ර,
සියදෙර  වැලිමළුවෙකි දඹදිව ත    ර,
සෙ සු ර  ජ නරපණුවන්කිම බැඳ වෙ    ර?

59\. මෙ ර ඳු න්  තර ගුණ ලබනුව මෙරගි    ර
සු රි ඳු න්  මුදුනෙන් උසුලා ඇමව    ර
අ ඩ කි න්  තමතුනු ගැලෙමින් සමුදු    ර
ත ව දූ න්  රකිනෙව් සහ ගිරිපිරිව    ර

60\. තු ල්  ගජ හය රිය මුතු පට    වා ස ත්
ව ල්  විදුනා යුග මිණිවැළ    සේ ස ත්
බැ ල්  මෙන් පැරකුම්නිරිඳුගෙ    බෝ ස ත්
කා ල්  නොයවා ලැබ වෙති දන    පෝ ස ත්

61\. පු රැ  සතොස් යතිසියුරන් ළත    රේ
ව රැ  නොපිළිමෙත් පව්ගතඅඳු    රේ
ගු රැ  ලොවට පැරකුම්නරපව    රේ
ස රැ  සදෙව් හෙබවී සසුනඹ    රේ

62\. මෙ ර ඳු න්  සැපතින් පුරඳුරු    අ යු රු
සතොසි න්  ඥදන නිති මගදන්    ව තු රු
ව ස මි න්  යදිගහ මතදෙළ    ඉ තු රු
පු ර මි න්  වතලේ යසකිරි    ස යු රු

63. ච ර යස කිරි තල් මොහු පිරිස්ද යෙ ති
කි ර ණඩ දිගෝවි ලි, නුරුවලි උරඋ ති
හ ර ගිරි කිඩ සෙ ලි, [1]යති සුරගජඋ ති
සු ර ගහ මල් වැ ලි, මුතුහර තුරු පෙ ති

64. යු ත් ගෙල වේපියපතරින් මතර ග
න ත් හර කිරි [2]බිවු සියකුසතුර ල ග
සි ත් හැස පැරකුම්නිරිඳුගෙ දියනු ග
ග ත් තුඩගින් පොකුරකුරෙකි සුරග ග

65. කල් සොමිගුණ වැනි සඳ හිම ස ද නේ
මූල් මෙ ලකට පැරකුම්රජ න ද නේ
හල් පිලි නොවරද දූනැ මුනි ව ද නේ
සිල් ඹිණි ලා රකි තම හද නි ද නේ

66. සි ය කුල රිවිමෙන් කල්දෙස්පිළිවෙ ළ
[3]පැ ය කින් පැයකට විමසා දවස ළ
පි ය කරු පැරකුම්නිරිඳුට සතස ළ
කි ය සරි කවුරුද මුළු තුන්ලෝතු ළ

67. ම න ර ම් සිරි පැරකුම්නර ව ර ණේ
ඉ වැ සු ම් ගුණයට සත පිය සා ර ණේ
ප ච් සා ම් සාළ සතහට වත උ ර ණේ
[4]ය ළි කු ම් සරි වෙ ද පුවතර දෙ ර ණේ

68. මුනිගුණ සැල කු ම් සිතැ පා නොවැ කු ම්
කළ නිති නොනැ කු ම් විකුමෙනි තෙවි කු ම්
තිළිණෙනි සුර කු ම් ලකතැව සරි කු ම්
අගරජ පැරු කු ම් දින පෑ පැරු කු ම්

69. රුඳැවූ වෙත සරසවිකමල ම් බා
මෙනිරිඳුතුම නමූ [5]සිරි පැරකු ම් බා
සඳහන් සාළ සතහට බැනි පෙ ම් බා
ලැබෙනුය ලොවැ ඇති සව්සිරි එ ම් බා

70. තෙ දූ ති රුදුරු රුපුනෙඩි මැඩි විපුල විකුම් නා රා ය ණ
යු ව ති නයන මන පිනවන රුසිරු තෙනය නා රා ය ණ
නැණැ ති තියුණු හසළ නොඑක සතර වේද නා රා ය ණ
ප ව ති සසිරි පැරකුම්බුජ රජරජ නා රා ය ණ

1. යත.
2. බිජු.
3. දවසින් දවසට.
4. වැළි.
5. සිරිපැ.

71. ර න මිණිමුතු පඩුරැ ලබන රටින් ලාඩ ගව්ඩ ව ං ගේ
තැ න තැන වනවිල් [1]වැදූ රැදි තුඩවැඩි රැපු මැඬි බුජ ං ග
දි න මිණිකුල විජයනිරිඳු පරපුරෙනා [2]පුර කාලි ංග
දි න පැරැකුම්බුජරජහිමි රුජවේශ්‍යාබුජ ං ග

72 කි රැ එ සමහ දෙවිඳුවිලස සැදි සුසැටබරණ ර ත් හ
නැ බු එ මෙසිරිලකනුබගබ බබළන නවතබෝ ර ත් න
ස වු එ ලකල දැඹදෙණිපුර පැරැකුම්බුජරුජ ර ත් න
මෙ මු එ ලොවට පුවතර විය වීරරුජසිරෝ ර ත් න

73. ග ජ පති හයපති නරපති රජ්ජුනෙඬි මැඬ ගත් කා වා ර
බු ජ බල යසවතුරැ උතුරැ කළ සක්වළිනුත් පි වා ර
ර ජ නිය මුනිබණ වියරණ කව්නළු සරසවි කො වා ර
වැ ජ ඕ මෙ රජු තුනි පුවතර කාපටරුජතුරැකු වා ර

74. දි න කරකුලපුල්සියපතවිලැ [3]සරඳන මෙන රත්ග ස
ගෙ න මුදුනත තබිතලෙසට කළ නිරිඳුන් නම සත්හ ස
ම න මිණි[4]සිතු සුරබිදේනු කලබසදිසි නිළිණෙන් නො ස
දි න පැරැකුම්බුජබූපති ලෝබිරුජගජඅංකු ස

75. සි ප විරැසිරි තුති කියවන විරතුල දන ක්‍ෂ් ජ යා
ල ප නැති සද කොඳ නඳ කැරැ යස සොඳ ලත් රණ ක්‍ෂ් ජ යා
[illegible] [illegible]ැඹි රැව මදනසදිසි විතරණ තන හස ක්‍ෂ් ජ යා
[illegible] [illegible]කුම්නරනිඳු දින දනුරැවේදදන ක්‍ෂ් ජ යා

[illegible] බයරිවිකුලමිණි අකිලබුවන රුජ රු ජ
උ දු ල ලකුණු ගරුඩවේග [5]හයාරෝහ නකුල රු ජ
සක ල කලාවල්ලබගුණ සාහිත්‍යසත බෝජ රු ජ
ප බ ල විකුම් පැරැකුම්රජ [6]ගජාරෝහ [7]වංග රු ජ

77. පැ න ය නියත විසඳන කලැ මිලිඳුනිරිඳුසදිසි වං ද
වි න ය සුනබිදම් සසමය තකුසත දිඹනාගපා ද
ස න ය විකුම් පැරැකුම්බා නිරිඳු කිඳුරැමදුරැනා ද
වි න ය විතත වසුමතිපති මව්ළිමාල සුරබිපා ද

78. ගෙ න කාගපත සහදෙව්ලෙස රණමැද කිසි නොවන බී න
ව න පිළිමල් රජ කාල් පුල්කමල්විලට තුහිනපා න
ර න මිණිමුතු පට්ටවස්ත්‍ර විතරණගුණ පාරිජා න
දි න පැරැකුම්බාහුනිරිඳු දසරත[8]රමකුලබිජා න

---

1. මැදූ.
2. රට.
3. සරගත.
4. තුරැ.
5. හයරෝහණ.
6. ගජරෝහණ.
7. වත්තුරුජ.
8. රම.

79.

මූ නි ර ද [1]අප වදහලලෙස කල් තිපිටකතෙපල පා ට<br>
කා ළ බ ද තුහුගිජ්දුන් ලා බිඳි කන්තාඩිපුර කා පා ට<br>
ම නා නා ද මිණිබරණ ලකළ පැරකුම්රජ හේම පා ට<br>
එ ගූ බි ද රණදරණි මූකර වසිරිරජකුලවි පා ට

80.

ගු ණ කාරුණා කර සරණාගත සත සිවිරජ දේ ව<br>
ර ණ අසුරන් මැඩැ ජය ගත් [2]කුලයෙන් අ බාහු දේ ව<br>
අ ණ සක්විති [3]වාසලමේවන් පැරකුම්බාහු දේ ව<br>
නැ ණ බල පෑ සැපසේ ඉඳු [4]විලසින් මින්රජ දේ ව

81.

වත් මෙදෙන් යුද අ න් ර දු න් රඹ රන් තැඹි ම් මදමත් ගජ ණෙනි<br>
පුන් ස දි න් සඳ කැන් ලෙසි න් බට පුත් ය සි න් රගුරම් ර ජ ණෙනි<br>
රත් සා දි න් සාළමෙන් රු චි න් රස දුන් ළ දු න් නෙත මින්දජ ණෙනි<br>
තන් සි රි න් වි ද ම න් තොසින් ඉඳු පින් උ තු ම් පැරකුම්ර ජ ණෙනි

82.

පැ වි කු ම් බල කු ම් බකන් බි ඳි ර ම් උ ව ම් යුද ජයද ජණෙනි<br>
බා නු හි ම් කැරු නම් ද ග ම් දෙනකම් න ර ම් දුනැ මනුරජණෙනි<br>
[5]ලූකොකුම් නිවැකු ම් දූකු ම් කා ළ ර ම් කම ල් තනයුග බුජණෙනි<br>
ලෝ රකුම් [6]පැරකුම් උතු ම් පැරකු ම් නමින් දින මහර ජණෙනි

83.

ම ත් ස රා කර ගත් ස රා ලෙස නෙත් ස රා යුතු රු සරා ණෙනි<br>
ස ත් ස රා සඳ නත් හ රා යුරු බි ත් ස රා දිගු කිත් සරා ණෙනි<br>
අ ත් පු රා යදි සි ත් පු රා දෙන කැත් ස රා [7]පැරකුම් සරා ණෙනි<br>
ස ත් උ රා තල මුත් හ රා ලෙස මෙත් පු රා ඉඳු ලක් සරා ණෙනි

84.

ප ත් ම අ ත් කුල කැ ත් දි මු ත් හර [8]ප ත් ප ද ත් වර රත්න වත් ත ම<br>
ර ත් නෙතත් දි ගු අ ත් යු ග ත් පැහැපත් ග ත ත් සහපත් සෙසිත් ත ම<br>
ප ත් ම ව ත් ව ත ප ත් ම හ ත් සි රි යු ත් ප ස ත් පැරකුම් රජුන් ත ම<br>
සි ත් සැ ප ත් ලැබැ ස ත් තොසත් කර සි ත් මිණෙ වි පවතින්න නිත් ත ම

85.

මූ ද සේ නැණ වාදයෙන් දිනු වේදයෙන් ගුරුසේ සු රු දි ප<br>
යෝදසේ බල වීරවික්මැති දීරවූ ගුණ බුද රු දි ප<br>
සා ද නූ තිරිඳුන් මුදුන් දුන් පාදයුත් [9]අනුරුපු රු දි ප<br>
තා ද ගී යස ලෝ පුරා සැපසේ ඉඳින් පැරකුම්න රු දි ප

---

1. ඇම.
2. විකුමෙන් ඉක්වාකු දේව.
3. බාසල.
4. සැපතින්.
5. ලූ කොකුම්නිවූකුම් ඇකුම්කළ.
6. පැරකුම.
7. පැරකුම්රජණෙනි.
8. වන්දපත්.
9. අසුරපුරදිප.

86.

[1]අංග මංග ජ මංගලෙන් වැඩි කිංග මෙන් මුනිපාකමල් වට්
අංග තුංග ම තංග ජන් දෙන ඉංග කින් කාව්බන් දනන්හට
[2]අංග වංග කාලිංග හිංගුලකොංගණෙන් පැවසූ යසින් තුට
අංග සංග ව ලංග වෙන් සිරි සංග බෝ පැරකුම්රජුන් හට

87.

ඇස්සහස් සිරිලෙස් නිවෙස් තරුරුස් පිරිස් පාබලයස ස් ඇති
දෙස් වෙසෙස් දූසි දස් ගවස් දෙනනිස් සපස් සුබරණරු ස් හිති
වස් හිදෙස් කිවිහස්[4] තහස් පතවිස් මබස් පැවැසුම් සරස් වති
රස්සහස් දෙතරස් තිදෙස් කෙළෙතොස් උසස් පැරකුම්ගජස් පති

88. අග රජහිමි පැරකුම්බාතර පවර
දිග සක්වළහිමි පැලඹෙන තෙද පතර
ළඟ [3]වෙවුලා වනගබ දිවයුරු තිසර
සැඟ විණි වළබ[4]දහරණ සමුදුර වතුර

89. පැරකුම් දෙරණිසුරු පරසිදු තෙදයස ස
විහිගුම් [5]විදි සතරසිලිලාර පැන්රු ස
මනරම් තියුණු නැණදෙහොතින් රුගෙනැ ඉ ස
නොතරම් තරම් දැති වියතුන් කියන බ ස

90. නඳ දෙන ලෙව්නුවන් නවසඳ සාලාවන්
දෙන තිළිණෙන් සියුදිව්වැසි වලාවන්
මුනිබණකෙසරතෙල්යුතු රන මලාවන්
දූනැගති මෙ හිමි ලොවැ සුසැට කලාවන්

91. අරුණුසරණතල ගජවත් ගමන් යුතු
කාමල්කල්වුවන් රස පියබස් නු මුතු
[6]වදුරවිනුවණ සොම්ගුණ මෙතිරිඳු දි මුතු
සව්දෙව් රුසිරි එකතැනැ මැවුවැනි අ මුතු

92. හෙසඳ!, කිම මුහුද! කිම සැඟවෙනු වෙල ත
මෙ ගජහය අතින් පැරකුම් රජ දිමු ත
දෙසි ගිජ්දුන්, ඔහු මඳහස කැරු ලව ත
තදුන් කැලුම් සොම්ගුණ යුතු පඬුරු ඇ ත

93. රද කෙසරිඳු පැරකුම් නිරිඳු උදය ග
බඳ සේසත්සඳ මුතුලැල් තරු සම ග
වැඳැ ඉඳිනා හැමනිරිඳුන් පැදුම් දි ග
සොඳ කරතල සියපත් හැකිළමෙකර ග

1. අංගමෙන් ජයමංගලෙන්. 2. ගංගවංසකාලිඟනාගත සිංහලේ සැරසූ යසින්තුට.
3. වෙවලා. 4. රණසමුදුර දියවතුර. 5. විදු. 6. වදුරුවි.

94. ල කි සු රු සුරතු ලෙළ සාගපතවලාකු ළේ
නි ර තු රු නැඟෙන එවිගස පැළදිගින් වෙ ළේ
අ මි තු රු තිරිඳු අහතත් කොමළ උරත ළේ
පි යො වු රු තිසර මුතුහර ණෙලුඹුදැළි හ ළේ

95. දූසැ [1]හිමසෙලැ [2]ඇත්සිහරද [4]උතුරුද ස
එහි සිඳගත වෙත වෙත ගාත මේලෙ ස
පැරකුම්රජුට සරි තිරිදෙක් තිලෝ කු ස
ඔහු රුවමැයි පිළිබිඹුපත් දපණප [5]. ස

96. මෙර [3]පත්හිදට හැරගෙනැ ගුවතතල්ප ත
ලියූ තිවුට සාළුමැදූ සයුරතෙලිය ත
පව සත අනත මෙතිරිඳු ගුණනැණ අන ත
කිසි අඩුනොවෙයි එවනත කෙවියත සම ත

97. මි හි ප ල් පැරකුම්රජ මි ණි
ර නො වි ල් ගුණ සවන පැමි ණි
ල ද සා ල් තිරිඳුන් පිළියැ ණි
නි ලු පු ල් සවතින් ගිලිහි ණි

98. මෙරජුගෙ සාග සිලිල්පොව ත
වගලෙළ සිලිල් රුපඹුවනෙ ත
එමෙ සාග සුරතින් ලෙළව ත
ලෙළදුනි සුරඹුව වම්නෙ ත

99. සිරි සරසවි සහ පුරු දු
සිරි පැරකුම් මෙනරනි දු
යස ගී අසමින් සුරි දු
සොළෙ සඳහන් නත [4]උවිදු

100. පැරකුම් තිරිඳු ස ද
බලත රුසිරි මතන ද
සියලඟ තිසල සො ද
නුවන් වීනම් යෙහෙකි ඇමස ද

101. සවන්තැටියෙන් බො ත
මොහු පියබස් අමා ඇ ත
බමා රතමෙරම ත
කුමට [5]ඇලැළුදු සුරෝ සයුරත

102. පිනිදිය සඳුන් ර ස
කුමට මුතුහර සඳර ස
පැරකුම් රජ වෙසෙ ස
පවති සිරිපා සෙවණ සිහිල ස

103. ඉසුරුද සුරලොව ට
සක්විති සැපත් මූළර ට
තිවන්සුව ලද තු ට
සදිසිවේදෙ මෙරජ බැල්මට

104. නුවණ සුරගුරුබ දු
ගුණයෙන් සදිසි සොමිස දු
සැපතින් සරි සුරි දු
වැඩකි සීනෙන් දුටත් මෙතිරිඳු

---

1. හිමසෙල්.
2. ඇඳි සිහදද.
3. පත්සිදට සැරගෙනැ.
4. උරිඳු.
5. ඇලුළු.

105. පත් මත සිරි සිලි ගත දුනුකු ම්බා
සත් අත සිරි පති දිනිදු තිය ම්බා
වත් අත සිරි සඳ මෙසුරකද ම්බා
දෙත් සෙත සිරි තිරිදුව පැරකු ම්බා

106. තෙවි කුම් විකුමෙන් බැසැ රණ දෙ රණා
නොතැකුම් කළ රුපු නි ස රණ ස රණා
සුරකුම් කළ ලොව නි ස රණ බ රණා
පැරකුම් 'රජ! දින අ ස රණ ස රණා

107. අප පැර කුම්රජ යස පැලැඹෙත නි නි
උර හර 'නිල්ගෙලෙ' යන නම නොපව නි
හිම කර නිකැලැල, සප්කුලපති ප නි
රූපුතර පති[1]මෙන් කිතයුග සිරිග නි

108. පුවතර ර ම්බා විරිදු තර ම්බා
මත හර ර ම්බා පතිපිළිබි ම්බා
යස හර ල ම්බා උරදිගුත ම්බා
දින පැර කු ම්බා රජ! සිරිර ම්බා

109. රූ පු බිඳු මට පිහිට වැ සිටි සඳ රු
රූ දු [2]උ දු ගුණ දිනවත යසපත රු
වැඩ සිදු කැර සෙවුනා අත්නොහැ රු
මෙ තිරිදු කග[3]අගමැතිඳකු අයු රු

110. [4]මුනි සර ණ තඹර මී පා මී පා
පුවතර සිරිලක් දී පා දී පා
කාම සර දෙවිඳු ස රූ පා රූ පා
දින පැර කුම්බුජ බූ පා බූ පා

111. ගත සර යුරු යස කි රණා කි රණා
[5]වෙත තර පති මත ව රණා ව රණා
මත හර විරූසිරි ස රණා ස රණා
[6]දින පැර කුම්බුජ ත රණා ත රණා

112. යස සැනි පැරකුම් තිරිඳුගෙ දියතෙ තා
සස ලැසි පියැ වක් බැව් බැමයුගර තා
සස ලා රුදු මුදු බැමයුග පැහැප තා
නිස නේ හස ඇත දීමෙහි වෙත තැ තා

1. වෙත්.
2. ඉදු.
3. අගමැති තිය.
4. මුනිපද තඹරස මීපා මීපා.
5. වික.
6. දින පැරකුම්තරවරණා වරණා.

113.

කි රි සී දු අගතිඹි එකැදිලියෙන් ගත්වර වියැළුණු කා ල
සි හි ස ඳු තමසුලැගිලි නියැතුළට සිව්සැ සැගැවුණු කා ල
පු ර සි ඳු පැරකුම් නිරිඳුගෙ වැජැඹෙන දසදෙසැහැම කා ල
ශ්‍රී රි සු ඳු යසසට සරිකොට උවමක් පවසනුයෙ කි කා ල

114.

පෙ ර දිගුපති තිදසිඳු, රද ඉඳුරැ පැදුමැ සියුදිගු ප ති;
එ ර වණ නම් ඇතෙකි ඔහුට, මෙරජුට ගජසෙනහෙක් ඇ ති;
පෙ ර සුරරණ දිනි එසුරිඳු, මෙනිරිඳු [1]සුරරණ ජයග ති;
සු ර රදංමෙහුැමින් අප පැරකුම් නරනිඳුහට සරිනැ ති.

115.

'අ ල්ප දෙයක් නොදෙමැ'යි යන තුතිගොස පළ කැරැ දිය තු රැ
සි ල්ප නිපුණ පැරකුම්රජ රජසැපතට පැමිණෙන තු රැ
'ක ල්ප තුරැ'යි පසිඳු මදුරු පරසතු සිතු සුර තු රැ
'ක ල්ප -සු කැරැ සිටිති' සිතෙයි ලෙව්සත තුටු කැරැ නිර තු රැ

116.

කි ය ග [2]මැගිය! එනු කොහි සිටැ? දද! සමනොළ ගොසි නා
නො ය කියමුතු එදිගැ, බමුණ! [3]සුමන සුරිඳු විසි නා
ගි ය කලැ දෙදහස් පන්සිය රජෙක් එතැයි දිය නා
කි ය විය [4]නන්වැසිය! එනම්? පැරකුම්රජ මෙදි නා

117.

ම ත ඟ නැ ගු ම ට සදිසි වසුදෙව්, සියලු දුනුසිප් දෙණැ දු රු ම ය
තු ර ඟ නැ ගු ම ට නකුලරද, සග සිපට සහදෙව්, පර සු රු ම ය
ස ම ඟ සි යු සැ ට සිපට විකුමට, යොවුන් රූසිරට රම් සු රු ම ය
මෙරඟ සරි කොට පසිඳු නිරිඳෙක් මෙකලැ පැරකුම් ලක් සු රු ම ය

118.

වි ත් ත බේ රි විජයදළඟන් පුම්බමින් සක් මෙලක්දී පා
නි ත් ත වේ රි රජුන් සිතැ බිය ගන්වමින් දක්වා පතා පා
ම ත් ත හා රී තුරඟ නැගිලෙස පවර පැරකුම් බාහු බූ පා
ස ත් ත නා රී තුරඟ නැගි පෙර නවයොවුන් මන්මද සරැ පා

119.

ස බ ඳ දෙරණ ගත දූරැමෙහි නත පණීපති පුර න් ද රු
ස ර ද සමය උදිත නිමල හිමකර යසැති සු න් ද රු
ස ම ද වයිරි රුජ සමර ජල නිදි මතන ම න් ද රු
සැ ර ඳ පවර පැරකුම්බුජරජ! මුනි පුද පුර න් ද රු

1. සුරනර. 2. මගිය. 3. සමන්. 4. ගම්වැසිය.

120.

සිරි වර ගජ හය රිය මහසෙන් ගෙනැ රණමුහ අබී ත
දිරි තර බුජ බල විරිඳුන් ජය ගත් විලසින් විනී ත
සිරි සර තල තඹරනිවෙස් කළ දිනකරකුලබිජා ත
සිරි බර පැරකුම්රජ! දින පව්වවස්ත්‍රපාරිජා ත

121.

වෙන වෙන කව්තළු අවිසිප් සකල කලා දැනැ විබා ග
පි න ව න කිවි දන මනදන කනකදනකාළ මේ ග
නැන නැන රණ දරණී මුකර වසිරිරාජ සමල නා ග
දි න දි න කර කුලපැරකුම්බුජරජ! අනවරණනැ ග

122.

වි හි ගු ම් ර ජ නිකර කිරණ කිරණ තරඟ ගඟතු ගං ග
ම න ර ම් නි ජ යසිනලුකළ සිරිලක රිවි කුලෙනි තුං ග
පැ රැ කුම් බු ජ බලවිකුමැති යුවති නයන [1]රූසි තරං ග
පැ රැ කුම් බු ජ රජ! දින පරරාජවේශ්‍යා බුජං ග

123.

වැ ර සැ ර ර ම් බුජ විකුමැති පරනිරිඳුන් නොවනසා දැ
සි ර සැ ර හු ම් කළ මිණිමුතු තඹර සදිසි සුරබි පා දැ
සු ර පු ර හි ම් කැරැ පුවතර සිරිසර තුති ගීතනා දැ
ව ර පැ ර කු ම් බුජරජ! දින නවමිණි විතරණ විනෝ දැ

124.

ව ර ර ම් බා පුර හරගිරි කිරිසිඳු හිම යසස් හා ර
උ ර ල ම් බා දසදිගහන, මනමිණි විතරණිනුදු ර
දෙ ර ණ ම් බා කුලහන [2]කැරැ පුවතරවර ජගත්වි ර
පැරැ කු ම් බා නරනිඳු! දින අබිනව මදනාවතා ර

125.

ප ත හ කුලෙන් පැමිණි මෙපැරැකුම් නරනිඳු දෙරණු සුල ත
උ ත ග අනත දෙසෙයි බැලුම් ලියො පියොවුරු කිවිඳුන් වෙ ත
ව ළ හ [3]නැහුම් නන් සෙනෙහස නුරු යුදෙහි ලියපියන ත
බු ජ හ සසහවීමෙන් හර පුළුලුර මඩලෙහි වෙන නැ ත

126.

ඉ දු නි ල් රු ව නි න් දි ලි ර න් කිරුළින් දෙයවන් සොබොලින් සු ල ඹි
උ ර ම ල් යු ව ළි න් ගෙලෙ රන් ල කරි න් බුජමින් ව ල යෙ න් සසො බේ
මු තු දූ ල් මෙවුලින් දග මි න් පතරි න් ප ද ප ං ක ජ ර න් සළ ඹි
මෙසියල් බ ර ණි න් පැ රැ කු ම් ර ජ දූන් ලසා සක් ර ජු මෙ න් වැජැ ඹි

---

1 රූසිරනාංග 2 කළ. 3 ගැනුම්.

127.

හි ම ර සින් කිරිසිඳුලෙසින් දි ලි කු ල වි සින් මිණිදී පනේ
කාලුතැ සින් රසඳුන්ලෙසින් ප න් ස ර වෙ සින් තුනුරු පනේ
ස තු හ සින් මුසු පි ය බ සින් ලැබුණොත් තොසින් අද බූ පනේ
සඟරෙ සින් ම ද ර ජු වි සින් ම තු ස ර ප සින් වන තා පනේ

128.

ව න් නි ල් ගෙලෙ නිල් ර ල් ව ර ලි න් තු ලී බිඟු දූ ල් ලා
ව න් පු න් ස ඳ මෙ න් ර න් න ඔ රි න් පු ල් වන දු ල් ලා
කාන් වැ ල් වි දු සැ ල් මෙන් මිණිකැල් මෙන් ගන නි ල් ලා
සු න් ද ර පැ ර ං කු ම් ර ජ දි ගු බැ ල් මෙන් සිත ලො ල් ලා

129.

බ න් දු මින් ද්ද මද අරවින්දු සර්ලා සර යා නේ
ම න් දු තිල තුරගුව නැහෙමින්දු වියොවග නා . වා නේ
ව න් දු තලලෙස විය නෙත නින්දු නොලදිමි තනී යා නේ
කැන්දු වරෙ පැරකුම් නරනින්දු සකිසඳ! සඳ පා නේ

130.

වී ර සේ ර සොළි පාඬින් ලූ අණ දූ ප නේ
තා ර හා ර හර ගිරි යසසැති පරතා ප නේ
නැ ර වා ර ගන නයනදනා තුනු රූ ප නේ
වී ර ප ර ක්කම බාහු බානුකුල දී ප නේ

131. මි න් න ර සී කසුබ් කුරු ඈ වෙස් ගෙනැ ර
මෙන් සැර නළ විසුවසි උව්දුගෙන් හැ ර
පි න් ස ර [1]එකු වෙසෙසි සිටි බුජවිකුම් ස ර
දූ න් පැ ර කුම් නිරිඳුවේන විසි සිරි නිතො ර

132. දි ව සුරු කුල කමලකර දස සියකි ර ණ
පු ව තර මෙසිරිලක පැරකුම් නරව ර ණ
ලොව . කිවි සන සතොසකැර දෙවන විත ර ණ
න ව මිණි නිදි බියෙන් සැඟවුණු වැනි දෙ ර ණ

133. [2]ප බ ඳ රුඳුණු පැරකුම්රජ බුජ මැදු ර
මේ ස ඳ හස දිගැස [3]වෙසඟනද එකායු ර
ව ළ ඳ න මෙරජ සුරතින් තුටු වැ නම සා ර
වැළිං ඳ ගනි නිබඳ පරනරනිඳුන් කා ර

---

1 එකවෙසින්. 2 නිබඳ රුඳුණු. 3 වෙසඟනක.

134.

දද මුතුලැල් සිසි බිම්බා කුඩ නඟමින් දිගු යට ගේ
බැඳැ මින් දද තුබල ම්බා දිස් විජයට ගෙනැ සෙන ගේ
[1]නද කෝකිල සක් පුම්බා මලවිය නලඅසුට නැ ගේ
අද නරනිඳු පැරකුම්බා නොළැඟෙනු කිමැ වරද මගේ

135.

කොඳ මල් මුවරඳ රස බෝ බිඟු වැදූ පුල් කුමුදු වෙනේ
ම ද මත් කොවුලන් නද බෝ යකුහඬදෙ දූන් නොදූනේ
සොඳ රිවිකුල සිරි සඟ බෝ සිරිපැරකුම් [2]නරනිඳුනේ
නොදූ නෙසි සකි සඳ එන බෝ පෙරමඟ බැලුමෙන් නිඳිනේ

136.

දුන් තුනු විම නත සාඳපා තුඟු ගඟනඟ මිණි දීපා
වන් රසඳුන් නුවන ලපා වත සොමි පුන්සිඳසෙඹපා
බන් මිණි නූපුර සිරි පා සිරිපැරකුම් බාහු නුපා
දූන් දූනැ දූනැ ඉන්ට [3]සැපා වීනම් එමෙ වේයැ සැපා

137. පිරි සුදු මුනිඳු දහම් නතු සමඟ සසමය
පිරි සිඳැ ඉගෙනැ ඇත් අස් සියලු සරමය
දිරි බල විකුම් නුවණින් පසිදු මෙ සමය
තිරි දෙක් නම් මෙලක පැරකුම් නිරිඳුමය

138. උදහස් ගුණය දූනැ පැරකුම් නරනිඳුගේ
එදවස් පටන් මද යුදයට නලසු නැගේ
සඳරස් හිම සඳුන් සිහිලසය යුගනගේ
සෙදූ ගොස් මෙතතු කිය සකි! නරනිඳුට මගේ

139. කුන්දූ කර වැදූ නදදෙසි මත මීපා
මන්දූ තිල නලලෙස කෙරෙ තුනු තාපා
ඇන්දූ ලෙස සිතැ සිතෙනුයැ තුනු රූපා
සෑන්දූ වරෙ [4]මවෙන පැරකුම්බුජ බූපා

140. සිරි දියරම් රජමෙන් පැලැඳැ කිරුළිස
සිරි ලකහිමි රජකුල සිරි යෙහෙන් වැස
සිරි පදඅම් බුජ සිරිහට කැරැ නිවෙස
සිරි පැරකුම් රජ! දිනපස්වා දහස

පැරකුම්බාසිරිත

නිමි.

1. මද. 2 නිරිඳු දූනේ. 3. තොපා. 4. සකිය.

# පරාක්‍රමබාහුචරිතව්‍යාඛ්‍යා.

## නමඃ ශ්‍රී ඝනාය.

1. කුලුණඹතුර,—කුලුණු, (අපිරිමිත දුඃඛසලිලෞඝපූරිත භවාර්ණවාවතීර්ණානන්තාත්‍රාණප්‍රාණීන් විෂයෙහි පැවැති අනන්‍යසාධාරණවූ) කාරුණා නමැති; අඹතුර, ජලාන්තරාලයෙහි; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ; (ජනිතවූයැ යු සේ යි); දහම්මුවරඳරසබර,—දහම්, (සපර්‍ය්‍යාප්තිකනවලොකොත්තර) ධර්‍ම්ම නමැති; මුවරඳ රසබර, මකරන්දරසභාර ඇත්තාවූ; සුරනරබමර,—සුරනර, දෙව්මිනිස් නමැති; බමර, දෙහිරුන්විසින්; සෙවි, සෙවුනා ලද්දාවූ; සිරිසර, ශතපුණ්‍යශ්‍රීන් සාරවූ නොහොත් ශ්‍රීදෙවියගේ හෙවත් ලක්‍ෂ්මියගේ ආශ්‍රය ඇත්තාවූ; මුනිරජතඹර,—මුනිරජ, මහර්ෂි නමැති; තඹර, පද්මය; වඳිමි, නමස්කාර කෙරෙමි ෴

2. මුනිමුවගින්,—මුනි, ශාස්තෘහුගේ; මුව, මුඛ නමැති; අගින්, පර්වතයෙන්; (කෛලාශගිරිශිඛරයෙනැ යු සේ යි) පහළ, ප්‍රාදුර්භූතවූ; මඟසිලිල,—මඟ, ශ්‍රොතආපත්ති—සකෘදාගාමි—අනාගාමි—අර්හත් සංඛ්‍යාත චතුර්විධ ආර්‍ය්‍ය) මාර්ග නමැති; සිලිල, දියඇත්තාවූ; පලසිහිලළ—පල, (ශ්‍රොතආපත්ත්‍යාදි) ඵල නමැති; සිහිලළ, ශීතල ඵළවන්නා වූ; පිවිතුරු, පවිත්‍ර වූ; මොක්වෙරළ,—මොක්, නිර්වාණ මොක්‍ෂ නමැති; වෙරළ, වෙලාතට ඇත්තා වූ; ලෙළ, ලළිතවූ; ("ලලිතං ත්‍රිෂු සුන්දරම්" ඉත්‍යමරඃ) දහම්ගඟ,—දහම්, (පූර්වෝක්ත මාර්ග-ඵල-නිර්වාණ-පර්‍ය්‍යාප්තිසංඛ්‍යාත) ධර්ම නමැති; ගඟ, ස්වර්ණදිය; අදරින්, ආදරයෙන්; වඳිමි, අභිවාදනය කෙරෙමි ෴

3. පෙළදම්මියරයුත,—පෙළදම්, පාලිධර්ම නමැති; මියරයුත, කෙදුරමර්‍ය්‍යාදයෙන් යුක්තවූ හෙවත් වෙහෙලි ඇත්තා වූ; පත, පැමිණියා වූ; සිල්දියෙන්,—සිල්, (ප්‍රාතිමොක්‍ෂසංවරාදි) ශීල නමැති; දියෙන්, ජලය ප්‍රත්‍යය කොට ගෙනැ; මුහු කළ, මිහිකිරීම් ඇත්තාවූ හෙවත් පරිපක්වභාවයට ගියාවූ; මඟපලකරල්,—මඟපල, (ශ්‍රොතආපත්ත්‍යාදි) මාර්ග-ඵලසංඛ්‍යාත ශස්‍යමඤ්ජරීන්; ගත, ග්‍රහණයකළාවූ; මහසඟපවරපින්කෙත—මහසඟ, (අෂ්ටාර්‍ය්‍ය පුද්ගල) මහාසංඝ නමැති; පවර, උතුම්වූ; පින්කෙත, පුණ්‍යක්‍ෂෙත්‍රය; වඳිමි, ප්‍රණාමය කෙරෙමි ෴

4. සතත, බ්‍රහ්මයා; සත, ශක්‍රයා; සතඅත, විෂ්ණුයා; තිනෙත, මහෙශ්වරයා; ගජවත, ගණෙශ්වරයා; බරනෙත, සකන්දයා; තලත, බලභද්‍රයා; ගුරු, සුරාචාර්‍ය්‍යයා; කිවි, අසුරාචාර්‍ය්‍යයා; නත, අනන්තයා හෙවත් ශෙෂ නම් නාරජයා යන; මෙ සුර, මෙ දෙවියෝ; සතත, නිරතුරු; සත, සත්‍වයාහට; සෙත, ශාන්තිය: සලසත්, පමුණුවත්වා—මෙ කී දෙවියෝ සර්‍වොපද්‍රවදූරීකරණය කොට සව්සැපත් සාහමින් ලෝවැස්සන් රකිත්වා යනු භාවයි෴

ඇතැම් පොතෙක–'සත සෙත' යන්නට 'සුබ සෙත' යනු දක්නා ලැබේ–'ශොභනවූ ශාන්තිය' යනු එහි අර්ථයි ෴

5. ගුරුසේවේ, (යමෙක්) ආචාර්‍ය්‍ය සෙවය—ගුරුශුශ්‍රෑෂාව; කළොත්, කළ හොත්; (හෙ තෙමෙ) සුවඳපත, සුරභිප්‍රාප්තවූ; නළ සේ වේ, නඩ නම් තෘණවිශෙෂය මෙන් වෙයි; එ සේවේ, ඒ ගුරු ශුශ්‍රෑෂාව; නො මෙ කැරු, නො මැ කොට; කව්නළුබය්, කාව්‍ය නාටකොක්තිසම්බන්ධි වූ; බැඳුමැ, බන්ධනයෙහි; කො, කවරෙක්; සේ වේ, ඡෙක වේ දැ?

තුවරලාආදිවූ සුගන්ධද්‍රව්‍යයක් හා එක්වූ නළතණ තමා ඇසුරු කළ ද්‍රව්‍යයාගේ සුගන්ධය වහනය කෙරෙයි. එපරිද්දෙන් මැ සද්ගුරුසෙවය ඇතියේ කාව්‍යබන්ධනයෙහිලා පොහොසත් වෙයි; ආචාර්‍ය්‍යාශ්‍රය නො කෙළේ කාව්‍යබන්ධනයෙහි පොහොසත් නො වේ යනු භාවයි ෴

6. මහත, මාහාත්ම්‍යය—උදාරගුණය; නො දැනත්, අපරිඥාත වුවත්; වියතුන්, සත්කවීන්ගේ; බස, භණිතිය; ඇසුව, ශ්‍රවණය කෙළේ වී නම්; තොස වේ, (එ කන්කළුබැවින්) තුෂ්ටිජනක වෙයි; (කුම් මෙන්?) දෑසමන්මල්රුස, ජාතිසුමනකුසුමරශිය; නො සිඹැ, චුම්බනය නො කොට; දුටුවත්, දර්ශනය කළත්; ඇති ලෙස, විද්‍යමානවූ ස්වභාවය; දැනේ, විජානනය වෙයි (එ මෙනි)—ජාතිසුමනපුෂ්පනිචය ආඝ්‍රාණ විසින් ඝ්‍රාණෙන්ද්‍රියවිෂය නො වූයේ ද දර්ශනමාත්‍රවූ චක්ෂුරින්ද්‍රියවිෂයත්වයෙන් තත්ත්වාවගමනය වන්නෙයා; එසෙයින් මැ සත්කවිකෘත කාව්‍යයාගේ ව්‍යජනාර්ථ පරිඥානය නො වුවත් ශ්‍රවණමාධුර්‍ය්‍යය හෙතු කොට ගෙනැ සතුටු උපදනෙය යනු භාවයි ෴

කීහු මැ යි, ශාම්භවදෙවයෝ :-

"අවිදිතගුණාපි සත්කවිභණිතිඃ කර්ණෙෂු වමති මධුධාරාම්,
අනධිගතපරිමලාපි ච හරති දෘශං මාලතීමාලා"–යි ෴

7. වියතුන්, (කවිසමයනිපුණවූ) පැනවතුන්ගේ; ඉදිරියේ, අභිමුඛයෙහි; කුකිවි, (පණ්ඩිතම්මන්‍යවූ) කුත්සිතකවීන්ගේ;

දිරියේ, ධෛර්‍ය්‍ය තෙමේ; (ග්‍රන්ථනිර්මාණයෙහි උත්සාහයැ යු සේ යි) නො හොබී, හොබනේ නො වෙයි; (කුම්මෙන්?) දිවපුරැ ඉඳිරියේ, ගිරැහුගේ අභිමුඛයෙහි; ඝනමැදිරියේ, කද්‍යෝපැති තෙමේ; කෙසේ, කෙපරිද්දෙන්; බැබැළෙ දෑ, දිලිහෙ දෑ? (නො දිලිහෙ යි) එමෙනි ෴

8. සිත්යුතු, චිත්‍රකර්මයෙහි යොදනලද; සුදු-නිල්-රතු-පැහැය; ශ්වෙත-හරිත-රක්ත-වර්ණය තෙමේ; ඇසට මැ, නෙත්‍රයට මැ; (ඇස් ඇතියාහට මැ යි සේ යි) පැනේ, දෘශ්‍යමාන වෙයි; අඳුතු, අන්‍ධාන්‍ධය; (ඇස් නැතියාහට හෙවත් අන්‍ධයාහට නො පැනෙයි යනු) නෙපලනු කිමැ, කියනු කුමට යැ?; නුවණැතියො, නියවත්හු; (ශාස්ත්‍රඥයෝ) කිවිබසතතු, කවීන්ගේ වාක්‍යතත්‍වය; (ගුණදෝෂවිභාගය යු සේ යි) දනිත්, පරිඥානය කෙරෙත් ෴

දෙවනපෙදෙහි—"ඇසට මැ පැනේ ඇති තතු" යනු පාඨාන්තරයි. "සුදු-නිල්-රතු පැහැය, අවදාතාදිවර්ණයන්ගේ; ඇති, විද්‍යමාන වූ; තතු, ස්වභාවය; ඇසට මැ, චක්ෂුෂට මැ (චක්ෂුස්මත්හට මැ යු සේ යි); පැනෙ, දෘශ්‍යමාන වෙයි" යනු අර්ථයි. අඳහට නො පැනේ යනු සෙස්සයි.

සතරවනපෙදෙහි—"දකිත්" යන පාඨාන්තරයෙහි "දර්ශනය කෙරෙත්" යනු අර්ථයි. "නුවණැසිත" යනු සෙස්සයි.

සිත්තමෙහි යොදනලද නීලපීතාදිවර්ණභේදය ඇස් ඇත්තාහට පැනෙයි, අන්‍ධයහට නො පැනෙ. එසෙයින් මැ කාව්‍යයාගේ ගුණදෝෂවිභාගය ශාස්ත්‍රඥයෝ මැ දනිති. අශාස්ත්‍රඥවූ පණ්ඩිතප්‍රතිරූපකයෝ නො දනිත් යනු භාවයි ෴

කියනලද මැ යි, ආචාර්‍ය්‍ය ශ්‍රීදණ්ඩින්විසින්:—

"ගුණදෝෂානශාස්ත්‍රඥඃ කථං විභජතෙ ජනඃ?
කිමන්‍ධස්‍යාධිකාරෝ'ස්ති රූපභෙදොපලබ්ධිෂු?"—යි ෴

9. 10. 11. ඔක්කාවස්, (ත්‍රෙතායුගයෙහි අයොධ්‍යායෙහි රජ වූ වෛවස්වතමනුහු පිත්) ඉක්ෂ්වාකුයැ; පුතු, (අනෙනයා පිත්) පෘථුයැ; බානු, (පෘථුවෙය්‍යාමයා පිත්) භානුයැ; මන්දතු, (යුවනාශ්ව රාජපුත්‍ර) මාන්‍ධාතෘ නම් චක්‍රවර්ත්තියැ; පසේනදි, (විශ්වබාහු රජහු පිත්) ප්‍රසෙනජිත්යැ නොහොත් (ලාංගලයා පිත්) ප්‍රසෙනජිත්යැ; සුදසුන්, (ධ්‍රැවසන්‍ධිරජහු පිත්) සුදර්ශනයැ; බගීරත, (අංශුමත් රජහු පිත්) භගීරථයැ; නොහොත් (දිලීප රජහු පිත්) භගීරථයැ; නහුස, නහුෂයැ; සංකති, එනම් රජයැ; රඝු, (දීර්ඝබාහු රජහු පිත්) රඝුයැ; නොහොත් (දිලීපරජහු පිත්) රඝුයැ,

දිලිප, (අංශුමත් රජහු පිත්) ඛට්වාංගාපරනාමධෙය ඇති දිලීපයැ නොහොත් (විශ්වසහ රජහු පිත්). දිලීපයැ; තිසංකු, (සත්‍යව්‍රතාපරනාමධෙය ඇති) ත්‍රිශඞ්කුයැ; නළ, (නිෂධරාජපුත්‍ර) නළයැ; නාබාග, (වෛවස්වතමනුහු පිත්) නාභාගයැ; දසරත, (මූලකරාජපුත්‍ර) දශරථයැ නොහොත් (අජරජහු පිත්) දශරථයැ; රාම-ලක්මණ, (දශරථාත්මජ) රාම-ලක්ෂ්මණ දෙදෙනායැ; කුස, (ශ්‍රීරාමපුත්‍ර) කුශයැ; ලවාදී, (ශ්‍රීරාමපුත්‍ර) ලවයැ (යන මෙ ආදි වූ); පසිඳු, ප්‍රසිතවූ; සක්විතිරජුන්ගෙන් යුත, සාර්වභෞමයන්ගෙන් හා ආඥාචක්‍රවර්ත්තිනරශ්‍රෙෂ්ඨයන්ගෙන් යුක්තවූ; අතුරුකප, අන්තඃකල්පයෙහි; පෙර, ආදියෙහි හෙවත් හැම්රජනට පළමු වැ; උපන්, ලොවැ පහළවූ; බඹපුත් විවස්වත් මනුරජකුලෙන්. බ්‍රහ්මපුත්‍ර වෛවශ්වත මනුරජහුගේ වංශයෙන්; පත, ප්‍රාප්තවූ (෴) දහම්සෝරජ, (බින්දුසාර රජහට පුත්‍රවූ දෙවියනට ප්‍රියවූ ප්‍රිය දසාපරනාමධෙය ඇති) ධර්මාශොක රජ තෙමෙ තමා; සසිරි, සශ්‍රීකවූ—ශ්‍රීසහිතවූ; මාබෝ, (අප බුදුන් වදුරසුන් අරා පස්මරුන් මරා හුනස්නෙන් නැඟී පූර්වොත්තරදිශාභාගයෙහි වැඩැ සිටැ සතියක් තාක් අනිමිෂලොචනයුගලයෙන් පුදනලද) ජයමහා බොධිද්‍රුමරාජයාගේ; දකුණුසාකා, දක්ෂිණශාඛාව; මෙ ලකට, මේ සිංහලද්වීපයට; එවන, වැඩම කරවත්මැ; දසඅටකුලන් සැමැගින්, (කැත්-සිටු-බමුණු කෙළෙඹි-වෙළෙඳ-දුනුගා-සරස්-ඈ) අෂ්ටාදශකුලයන් හා; උතුම්, ප්‍රවරවූ; තම කුලෙන්, ස්වවංශයෙන්; සුමිතුරුකුමරු, සුමිත්‍රකුමාරයා; එව්, ප්‍රයාණය කැරැවියැ (෴) දෙවනපෑතිස් ලකිසුරා, දෙවානාංප්‍රියතිශ්‍ය ලංකෙශ්වර තෙමෙ; ඊ, ඒ ශාඛාමහාබොධිද්‍රුමරාජයා වැඩමවා ගෙන ආ අටලොස්කුලයන් මධ්‍යයෙහි; උන්, සුමිත්‍රාදීන්; දකිම්නි, දක්මින්; සෙද, වහා; පෙරගමන් කොට, ඉදිරියටගොස්; තුට, තොස් වූයේ; පුදපෙරහරින්, පූජාපරිහාරයෙන් යුක්ත වැ; ඒ දුමිඳු, පූර්වොක්ත ශාඛාමහාබොධිද්‍රුමරාජයා; අනුරාපුරවෙතෙසි, අනුරාධපුරය කරා; වැඩුම් කැරැ, වඩා ගෙනැ ගොස්; (෴) එකලැ, එදවසැ; එතිරිඳු, දෙවනපියතිස් රජ තෙමෙ; සුමිත් කුමරුන්, සුමිත්‍රකුමාරොත්තමයා; [උත්තමාර්ථයෙහි බහුවචනයි. නෙසු තැන්හි ද මෙසේ මෙ දතයුතු.] පිවිතුරු, පවිත්‍රවූ; මිණි වොටුනු, රුවන්කිරුළ; පලඳවා, ප්‍රසාධනය කරවා; උදුලසත් මඟුලැතුපිටින්—උජ්ජ්වල, (මුක්තාමාණික්‍යාදීන්) බබළන්නාවූ; සත්, (ආන්ධ්‍ර නම්-චොළ නම්-සිංහල නම් අභිධාන ඇති තුන්වැදෑරුම්) ශ්වෙතච්ඡත්‍රයෙන් යුක්තවූ; මඟුලැතු පිටින්, මංගලහස්තිස්කන්ධයෙන්; විසිතුරු, අපූර්වවූ; පුදෙන්, පූජායෙන් උපලක්ෂිත වැ;

[උපලක්ෂණෙ තෘතීයා සි] පුර, ඇතුළුනුවරට නොහොත් රජගෙට්; වැඩම. කරවා, කැඳවා ගෙනැ ගොස්; නිමලකුලපරපුරෙන්,— නිමල, ජාතිවාදයෙන් අක්ෂිණ අනුපකලිෂවූ; කුලපරපුරෙන්, වංශපරම්පරායෙන්; එන්ලෙස, පවත්නා නියායෙන්; ජයමහලානතනතුරු, ජයමහාලානසථානාන්තරය; (ජයමහලේනැන් යූ සේ සි) දෙමින්, පමුණුවා; දුමිඳුන්, (ඒ) ශාඛාමහාබොධිද්‍රුම රාජයාහට; නිරතුරු, ප්‍රතිවාසරයෙහි; පුදසිරිත් කරවනුව, පූජානුෂ්ඨානසංවිධානය පිණිස; විපුලඅදරින්; මහත්හරසරින්- ඉතා ආදරයෙන්; සැලැසි, යෙදී ...

12. 13. 14. ඉම ලකා, මේ සිංහලදෙශයෙහි; රජකළ, රාජ්‍ය විචාරණය කළාවූ; පවර, උතුම්වූ; ගජබා නිරිඳු, ගජබාහු රජ තෙමෙ තමා; එ කල, තතකාලය; (මතු පහළ වන වාතීශ්‍රවණ කාලය) සැටවස්පුරා, ෂෂ්ටිවර්ෂපූරණය කොට; (වාතීශ්‍රවණයට සැටහවුරුද්දකම පූර්වභාගයෙහියැ යූ සේ සි) මාවටුපුරෙන්,එනම් නාගරයෙන්; දොළොස්දහසක්, (12,000) දෙදහසක් අධිකවූ එක්නුහුවක්; දනන්, පිරිමිනින්, සිර කොට, යන්ත්‍රණය කැරැ; සොළිරට, ("ද්‍රවිඩතෛලිඞ්ගයොම්ධ්‍යෙ චොලදෙශඃ ප්‍රකීර්තිතඃ" යන්නෙන් දක්වනලද දඹදිවැ දක්ෂිණාපථයෙහි) චොලදෙශයට; ගෙනැ ගිය, අල්වා ගෙනැ ගියේයැ සි; අසා, (ජනශ්‍රැතිවාතී වශයෙන්) ශ්‍රවණය කොට; රුහැණි වැ, රොෂ වැ—දෞර්මනස්‍ය වැ; පසළොස්රියන් දිග, පංචදශහස්තායත වූ; තුන්රියන් වට, ත්‍රිහස්තවර්තුල වූ; ගදා, (අයොමය) ගදායුධය; ගෙනැ, ග්‍රහණය කොට ධරා; මූද පීනා, සමුද්‍රතරණය කොට; උරතෙලෙසි, (තමාගේ) වක්ෂඃස්ථලයෙහි; ගෑ, තැවැරූ; සඳුන්, චන්දන; (කල්කය) නො මකා, ම්‍රක්ෂණය නො කොට; එතරට ගොසින්, එකාන් වැ හෙවත් පාරිමතීරයට යාත්‍රා කොට (...) සොළිපුර, චොළරාජධානියට; පිවිසැ, වැද; එරජගෙට ගොස්, තද්‍රාජමන්දිර ප්‍රාප්ත වැ හෙවත් චොළරාජභවනයට ප්‍රවෙශවැ; ඔහු සමඟ, චොළරාජයා හා එක් වැ; සිහසුනේ, (චොළරාජයාගේ සිංහාසන යෙහි; උන් සඳ, නිෂණ්ණවූ කල්හි; සොළිරද, චොළරාජයා විසින්; මෙලෙස, මෙනියායෙන්; සිහළිඳු, සිංහලාධිශ්වරයා; තනි වැ, එකලා වැ; ආයේ, (මොබ) ආගමනය කොළෙ; කිමැ යි, කුමට දැ යි; සෙමෙන්, සන්සුන් වැ; පුළුවුත්, විචාරනලද (ගජබා රජ සොළිරජහට;) නුඹගෙ, භවත්හුගේ; පියරද, ජනක නරෙන්ද්‍රයා විසින්; පෙර, (මෙයට සැටහවුරුද්දකට) පූර්වභාග යෙහි; අප, අස්මතුන්ගේ; නුවරින්, නාගරයෙන්; (ලක්දිවිනැ යූ සේ සි) ගෙනැ ආ, පැහැරැ ගෙනැ එනලද; දොළොසදහසක්

දතන්, (12,000) එක්අයුත දෙදහසක් මිනිසුන්; නො ලස, ප්‍රපච
නො වැ; ගෙනැ යන ලෙසට, හැරැ ගෙනැ යන සේ (සිතා);
ආයෙමි, (මම මෙ මෙහි) පැමිණියෙමි (යන); තෙපුලක්, කථාවක්;
ඔද, ගජය; වැඩි වෙමින්, අධික වෙමින්; කියත, කථනය කරත්
මැ (෴) තිරිඳ!, ටනුජේශ්වරය!; සී සී, ඡී ඡී; (ධිග්ධිගිත්‍යර්ථඃ)
සොළින් මැදූ, චොළයන් මධ්‍යයෙහි; අප නො තකා, අසමතුන්
නො සලකා; මෙසේ බස්, මෙබඳු වදන්—උක්තප්‍රකාර තෙපුල්;
කියනු කිමැ, තෙපලනු කුමටයැ?; තවද, එකෙක් ඇති; වැලි,
වාලුකා; මැඩැ, මර්දනය කොට; තෙල්, තෛලය හෝ; තද,
ඝනබද්ධවූ; යපා, අයඃපාතිය මැඩැ; දිය, ජලය හෝ; සාවුරුන්
විසින්, කවර ජනකෙනකුන්විසින්; ගත ඇකි දේ, ග්‍රහණය කළ
හැකි දේ හෝ සි; (සොළීරජ කියැ.) එසඳ, එකල්හි; (ගජබා
රජ තෙමෙ) සොළියා, චොළයාගේ; (සොළීරජහුගෙ); බසට,
තෙපුලට; රැහැණී වැ, රොෂ වැ; ගදා, (අයොමය) ගදාව; මිරිකා,
මැඩැ; දියකඳ, ජලස්කන්ධය; රැ පැසි, ගෙනැ හැරැ පැයේයැ
(දක්වියැ යු සේ සි); පැහැදූ, (ඉක්බිති සොළීරජහුවිසින් තමා
කෙරෙහි) පහන් වැ; නිවරද,නිරපරාධවූ—නිදෝෂවූ;(පාඨාන්තර
විසින්: නො වරදූ, (සංඛ්‍යාකරණයෙහි) වද්‍ය රහිත කොට);
අඩු නො වැ, අනූන වැ (හෙවත්: ලක්දිවින් ගෙනැ ගිය
පිරිමිනින් දෙළොස්දහසට පොළී දෙළොස්දහසක් එක් කොට);
දූන්, දෙනලද; සුවිසිදහසක් දතන්, (24,000) චතුර්විංශතිසහස්‍ර
යක් මිනිසුන්; ගෙනැ, කැටි වැ ලා; ආයේ, ආගමනය කෙළේ
(පෙරළා ලක්දිව් ආයේයැ යු සේ සි) ෴

‘යපුදිය’ යනු විතීයපාදයෙහි ‘යපාදිය’ යන්නෙහි පාඨා
න්තරයි. ‘අයඃ පීත ජලය’ යනු අර්ථයි. රත්යවටහි වත් කළ
දිය සිඳෙයි, හේ යවටවිසින් පූයේ නම් වෙයි, නැවැතැ මිරිකා
ගත නො හේ ෴

“එසඳ සොළියා බසට යගදා අතින් මිරිකා රැ පැසි දියකඳ”
යනු තෘතීයපාදපාඨාන්තරයි. ‘එසඳ, එවේලායෙහි; සොළියා,
චොළාධිපතිහුගේ; බසට, වචනය සඳහා; යගදා, අයොමයගදා
යුධය; අතින්, මිටින්; මිරිකා, මැඩැ; දියකඳ, උදකස්කන්ධය;
රැ පැසි, දක්වී’ යනු අර්ථයි ෴

15. 16. සිරිසඟබෝ නමින් යුත්, ‘ශ්‍රීසංඝබොධි’ (යන) නාම
යෙන් යුක්තවූ; රජෙක්, නරවීරයෙක් තෙමෙ; පවට, (සංග්‍රාම
යෙහි ශත්‍රුඝාතනාදීන් වන්නාවූ) පාපයට; බිං, භය වැ; තවට,

තපස් රක්නා සඳහා; වල වැද්ද, අරණ්‍යගත වැ; උදක් මෙත්සිත් වෙමින්, කෙවලමෛත්‍රීසහගතචිත්තයෙන් යුක්ත වැ; (මෛත්‍රී භාවනා කරමිනැ යූ සේ යි); උන්නේ, විසී (෴) එකලැ, එසම යෙහි; නරනිඳු ගොඨඅබා, නරේන්ද්‍ර ගොඨාභය තෙමේ:— යමෙක්, කිසිවෙක්; ඔහු සිර, එ දූහැමිසිරිසඟබෝරජහුගේ හිස; ගෙනැ ආ නම්, (යම්දවසෙකැ) ග්‍රහණය කොට ආයේ නම් (එවිහට); එවක්, එදවස; දෙනලෙසට, (පාරිතෝෂිකධනවශයෙන්) පරිත්‍යාග කරනු සඳහා; රන්දහසක්, කාර්ෂාපණසහස්‍රයක්—කාවණු (1,000) දසක්; තබා, ස්ථාපනය කොට; රට, සකලරාෂ්ට්‍රයෙහි; අණබෙර ලැවී, ආඥාභෙරින් හැසිරවී (෴) බැළයෙක්, එක්තරා එක් මා ගිනාවෙක්; (දුකියෙකැයි කියත් මෙ); ඒ අසා, ඒ (අණබෙරහඬ) ශ්‍රවණය කොට; දනලොබා, ධනයෙහි ලොභ වැ (෴) ගොසින්, ප්‍රයාණය කොට; වල වන්, වනප්‍රවෙශවූ; නිරිඳු, (එ දූහැමිසිරිසඟබෝ) රජහු; දිටි, (මලයරට හෙවත් ගල්වල්රට අත්වනගලු නම් වෙනෙහිදී) දකැ ගති (෴) බුදුබවලබන රිසින්, සම්‍යක්සම්බොධිසමධිගම කරනු කැමැත්තෙන්; බුදුකුරුදහම්, බුද්ධකාරකධර්මයන්; (සමතිස් පැරුමන්); සපයන, සම්පාදනය කරන්නාවූ; (පර්යෙෂණය කරන්නාවූ—පුරන්නාවූ යනු භාවයි); බෝසත්, මහාසත්ත්වගුණ ඇති; එ ද, හෙ (දූහැමිසිරිසඟබෝ රජ) ද; ඔහුගෙන්, එ මැගී බැළයා අතින්; රට, අනුරාධපුරයෙහි; පවත්, ප්‍රවෘත්ති; අසා, විචාරා (දූනැ); තොසින්, (තමහට අහර දුන් මැගියාහට දහසක් ලදමනා හිස ගළවා දීමෙන් ප්‍රත්‍යුපකාර කිරීමයැ ආධ්‍යාත්මිකදානය බැවින් දානපාරමිතාවගේ කෙළ පැමිණීමයැ යන මෙතෙක් අනුසස් ලබමි යි සිතා) සන්තොෂයෙන් යුක්ත වැ; සියසිර, නිජශීර්ෂය; ඔහුට, මැගියාට; දන් දිනි, දානවිෂයෙහි පැමිණවියැ ෴ එ හිස, ඒ ශීර්ෂය තෙමෙ; ගියතැනත්, ප්‍රයාතස්ථානයෙහි දු; (ගොළුඅභා රජහුගේ සභාහියැ යූ සේ යි); දෙස් කී, ("රාජාහමෙව සුහදෙ සිරිසඞ්ඝබොධි සීසප්පදානවිධිනාසම් සම්බවිතෙතා" යනාදීන්) දෙශ්‍යකථනය කෙළේයැ; හෙවත් සාක්ෂි කියේයැ ෴ දූන් වනුවක්, එවක් පටන් මෙ තුවක් කල්; රජමහත්, (තදන්වයප්‍රභව) රාජෙශ්වරයෝ; යසින්, මනාසේ; සිරිසඟබෝ නමින්, 'ශ්‍රීසංඝබොධි' (යන) නාමය උපලක්ෂණ කොට; ලියති, ලෙඛ්‍ය කෙරෙත්; (පූජ්‍යවූ ශාක්‍යවංශ්‍ය සෛංහලපෘථිවීශ්වරයෝ තමන් නමට පෙරටු කොට ('සිරිසඟ්බොයි') 'සිරිසඟබෝ' යනු ලියති යූ සේ යි) ෴

17. 18. ඉතදින්, තෙජස කරණ කොට ගෙනෑ; මහසෙන්, සකාඳයා වැතිවූ; නොහොත්: තෙදින්, ප්‍රතාපයෙන් යුක්තවූ; මහසෙන්, මහත් සෙනා ඇති; මහසෙන් නමැති, මහාසෙන නම්

දභිධාන ඇති; රජෙක්, ක්‍ෂිතිපතියක්හු; අනුරපුර, අනුරාධපුර යෙහි; දේනාවෙහෙර, (ජේතවනඋයන්හි වූ) ජේතවනවිහාර යෙහි; රියන්සතලිස්තුරාසියයක්, (140) චත්වාරිංශදුත්තරශත හස්තප්‍රමාණවූ; මනහර, චිත්තහාරිවූ; මහසෑයක් කරවමින්; මහදහගබක් නංවනුයෙ; බුදුන්, සර්වඥයන්වහන්සේගේ; ගුණා, (අභිත්වාදි, නවවිධ) ගුණයන්; සලකා, සංලක්‍ෂණය කොට; (සිහි කොටයැ යු සේ යි); පටිදා, (එ අප බුදුන්ගේ පාරිභොගික ධාතුවිශෙෂ වූ) කායබන්ධනය තෙමෙ; සුරපුරෙන්, (තව්තිසෑ) දෙව්නුවරින්; බසිවසි, අවතීර්ණ වනසේක්වයි; ඉටන් කැරැ, අධිෂ්ඨාන කොට; ඉදින් නො වැඩිය, (අපගමුවට) නො බටුයේ වි නම්; රහ බොමැයි, මද්‍ය පානය කෙරෙමැයි; රහවිත, මද්‍යවෂ කය; අතින්, හස්තයෙන්; ගෙනැ, ධරා; සිටින, සිටිනා කල්හි; එ මෙ වර, එ විට මැ; (෴) සුරිඳු, ශක්‍රයා; වසාගෙනැඋන්, ප්‍රච්ඡාදනය කොට හුන්නාවූ; නුබගබ, අහස්කුසැ; ලඹ, එල්බෙන්නාවූ; පටිදා, කාබාන; එ නරනිඳු, මහසෙන්රජු; දූකැ, දර්ශනයකොට; රාචිත, (තමා අතැ තුබූ) සුරා (පිරූ) අනුතමීය; දමා, බහිනික්‍ෂෙප කොට; තමා, සව්යවූ; සුබලකුණුඅත්දෙක, (ශංඛචක්‍රාදි) මංගල ලක්‍ෂණයෙන් සැදුම් ලද කරතලයුගළය; සුවඳසිලිලෙන්, සුගන්ධ පරිවාසිතජලයෙන්; දෙවැ, සෝධා; අල්වන, අතින් ගනුත් මැ; සහසක, ශක්‍ර තෙමෙ; එදා, ඒ පටිධාතුව; අසූරියනක් පමණ, අශීත්‍යරත්නිප්‍රමාණ තැන්; දුරැ කැරැ, ඉක්මවා; නැගී, උද්ගත කෙලේයැ. (එසඳ මහසෙන් රජ තෙමෙ තමාගේ); උකුළේ, ඇකයෙහි-හිණෙහි; යොදා, යුක්ත කොට; තුබූ, තබනලද; සිරිය, ජුරිකාසංඛ්‍යාත අසිපුත්‍රිකාව (කිරිසි නම් පිහියා වෙසෙස); ඇදැ ගෙනැ, (කොපුවෙන් පිටතට) හයා; පැනැ, සපන්දනය කොට; (ගගනොල්ලංඝනය කොට); ඉන්, කාබාතින්; එක අඩක්, එක් භාගයක්; කැපි, සින්දේයි; (කපාගති) ෴

19. කිත්සිරිමෙවන් නරනිඳුසඳා, කීර්තිශ්‍රීමෙඝවර්ණනරෙන්ද්‍ර චන්ද්‍ර තෙමෙ; [මෙ තන්හි චන්ද්‍රශබ්ද උපනමාර්ථයෙහි වැටෙ]; ලකැ, හෙළදිව්හි; මිදුමාහිමි, මහෙන්ද්‍රමහාස්වාමීන් උදෙසා; විසේස වැ, විශිෂ්ට වැ; පුදසිරිත්, පූජාචරිත්‍රයන්; පැවැතෙනසඳා, පවත්නා කල්හි; දෙසේ කලිහකු, කාලිංගදෙශිකයකුවිසින්; (උජ්ජයිනී රජහු පිත් දන්තකුමාරයාවිසිනැ යු සේ යි.) කාලිංගදෙශ වාසත්වයබැවින් 'දෙසේ කලිහකු' යනු කිවැ); වඩා සපැමිණි, (තමාගේ රාජ්‍යාදය වර්ෂයෙන් නවවනුහවුරුදුයෙහි) වැඩමවා ගෙනෙනලද; දකුණුදළදා, (අප බුදුන්ගේ) දක්‍ෂිණදංෂ්ට්‍රාධාතුව

[රාජාරාමයෙහි ධම්සක්සෙරෙහි පිළිමිණිමුවාකරඬුයෙහි වඩා]; වැඳ, (කාය-වාක්-මනඃ සංඛ්‍යාත වාරත්‍රයෙන් සකසා) අභිවාදනය කරමින්; පුද, (දීප-ධූප-සුගන්ධ-පුෂ්පාදීන්) අර්චනය කරමින්; ලෝමහපහා, ලොහමහාප්‍රාසාදය; උසේ, ප්‍රොත්තුංගවූ; සත්මහලින්, සප්තමාලකයෙන් යුක්ත කොට; අලුත් කැර, නවාම් කරවා; මෙසේ, උක්තප්‍රකාරයෙන්; තෙදියතැ, තුන්ලෙව්හි; පතළ වියැ, ප්‍රසිද්ධ වී ..

20. බුජස්රජ, බුඩදස රජ තෙමෙ; නාලොවැ, රසාතලයෙහි; විසූ, වාසතව්‍යවූ; නසිඳුන් පවා, නාරජුනුදු; නිරෝ කැර, නොලෙඩසිරුරැ ඇත්තන් කොට (තුටුපහටුසිත්ඇති ඔවුන් විසින් තිළිණ කරනලද;) මනාමිණි, සොඳුරුරුවන් නොහොත් චින්තාමාණික්‍යයන්; ලැබැ, උරරීකෘත වැ; සතන්හට, ප්‍රජාවන් කෙරෙහි; මව්පියමෙනා, ජනනීජනකයන් සෙයින්; කරුණානුවණගුණයෙන්; (පරදුඃඛාසහනලක්‍ෂණ) කරුණායෙන් හා (සර්වානොචිත) ප්‍රඥයෙන් හා (කායවාක්සංයමාදි) ගුණයෙන් හා; මුසු, මිශ්‍රවූ; (යුක්තවූයැ යූ සේ යි); අසූවක්, අශීතිපරිමිතවූ; කුමරුන්, පුත්‍රයන්; ලැබැ ගෙනා, ජනනය කොට; අසූමහසවු, අශීතිමහාශ්‍රාවකයන්වහන්සේගේ; නම්, ('උපතිශ්‍ය' යනාදි) නාමයන්; තබා, (තමා ලද ඒ අසූවක් පුත්කුමරුන්ට පිළිවෙළින්) ව්‍යවස්ථා කොට; ලෝවැඩ තනා, ලොවට හිත කොට; අසූවක් අවුරුදු, (තමා ජනවර්ෂයෙන්) අශීතිවර්ෂයක් (ඉකුත්වනතෙක්); රජ කෙළේ, රාජ්‍යවිචාරණය කෙළේයි ..

21. දෙව, ශ්‍රෙෂ්ඨතරවූ; උපතිස්රජ, (අනන්තරොක්ත බුඩදස රජහු දෙටපිත්) උපතිශ්‍ය (නම්) භූපති තෙමෙ; (දෙටතිස් රජ තෙමෙ); අනඳහිමිරුව, (අප බුදුන්ගේ අග්‍රොපස්ථායකවූ) ආනන්දසාමීන්ගේ ප්‍රතිබිම්බය; රතින්, සුවර්ණයෙන්; කැර, නිමවා; රතයෙකැ, (විචිත්‍රකර්මානෙකාජ්ජ්වලිතවූ) ස්‍යන්දනයෙක්හි; වඩා, සිටුවා; [එපිළිරුව දෝතෙහි බුදුන් වැළැඳූ පාත්‍රාධාතුව තබා එහි පැන් පුරවා]; මෙ තුන්රජයේ, මේ ත්‍රිසිංහලයෙහි (වාසතව්‍යවූ); ඉටු, ලොකපූජ්තවූ; සඟුන් සඟ, උත්තමභික්‍ෂු සංඝයාවහන්සේ හා එක් වැ (භික්‍ෂුසංඝයාවහන්සේගේ සහායයෙනැ යූ සේ යි); රුවන්පිරිතින්, රතන (සූත්‍ර) පරිත්‍රාණයෙන්; පැන්, උදකය; වඩා, සිචනය කරමින්; පටුන, පත්තනයෙහි දූ; වේමැද, වීථිමධ්‍යයෙහි දූ; ඇවිද, සිසාරා ගමන් කොට; රෝයක් දුබික්බිය, රොග-අමනුෂ්‍ය-දුර්භික්‍ෂභීතිය; දුරු කැර, ඉවත ලා;

කාලට, යථාකාලයෙහි; මහමේ, මහාමෙඝය, (මහමෙයින් සන් වැසි;) වස්වමින්, වර්ෂාපතනය කරවනුයෙ; දිය, ලොවට; සෙත් ශාන්තිය; වඩා, වර්ධිත කොට; ලක, ලංකාව; (ලංකාවිපර්‍යාසන්නවාස්‍ය ජනයා); වඩා තුටු කෙළේ, අධික කොට හෂ්ට කෙළේයි.

තවද :—

දෙ වූ පතිස් රජ මුනිඳුපිළිරුව රනින් කැරූ රතයෙකැ ව ඩා
ඉ වූ මෙතුන්රජයේ සඟුන් සහ රුවන් පිරිතින් පැන් ව ඩා
ප වූ න වේමැද්‍ද ඇවිද්‍ද රෝයක්දුබික් දුරු කැරූ හැරූ වි ඩා
තු වූ කෙළේ ලක කාලට මහමෙ වස්වමින් දියසෙත් ව ඩා

යනු පාඨාන්තරයෙකි. එහි අර්ථ :—

දෙව, (බුජස්රජහුගේ අසූමත් පුතුන් අතුරෙහි) වැඩිමහලුවූ; උපතිස්රජ, උපතිෂ්‍ය නම් ක්ෂිතිපති තෙමේ; මුනිඳුපිළිරුව, මහර්ෂිහුගේ ප්‍රතිරූපය; රනින් කැරූ, සුවර්ණයෙන් (නිර්මාපණය) කොට; රථයෙකැ, රථයෙක්හි; වඩා, හිඳුවා; මෙතුන්රජයේ, (රජරට මායාරට රුහුණුරට යන) මේ රාජ්‍යත්‍රයෙහි; ඉවූ, කාන්තවූ; සඟුන් සහ, භික්ෂුසංඝයාවහන්සේ හා සමඟ; පවූන වේමැද්‍ද ඇවිද්‍ද, පත්තන-රථ්‍යාමධ්‍යයෙහි ආහිණ්ඩනය කොට; රුවන්පිරිතින් පැන් වඩා, රතනසූත්‍රපරිත්‍රාණයෙන් සලිලාවසෙක කොට; රෝයක්දුබික්, රොගයක්ෂදුර්භික්ෂභීතිය; දුරු කැරූ, ඉවත ලා; විඩා හැරූ, (මේ ත්‍රිවිධභයින් පීඩිතවූ රටවැසියන්ගේ) කලාන්තභාවය පහ කොට; කාලට මහමේ වස්වමින්, සුදුසු සෙමෙහි මහමේ නංවා-මහවැසි වස්වමින් (කුදු මහත් සියලු වැව් පුරවමින් ශස්‍යවර්ධනය කරවනුයෙ); දිය සෙත් වඩා, ලොවට සෙත් සලස්වා; ලක තුටු කෙළේ, ලක්වැස්සන් තුෂ්ට කෙළේයි.

22. ඔදවැඩි, අධිකවූ ප්‍රීති ඇති; [පාඨාන්තර විසින්: සිරිවැඩි, අධිකසම්පත් ඇති. "එඩිවැඩි" යනුදු මෙහි මැ පාඨාන්තරයි.] මහනම් සිරිනිවෙස් නම් නිරිඳු, මහානාමාපරනාමධෙය ඇති ශ්‍රීනිවාස නම් මිහිපති තෙමෙ; දඹදිවින්, භාරතවර්ෂයෙන්; වැඩි, ලංකාවතරණය කළාවූ; වියත්සිළුමිණි ඇදුරු බුදුගොස්මහ තෙරුන්හට, පණ්ඩිතශිරොමණි ආචාර්‍ය බුද්ධඝොෂ මහාස්ථවිර ස්වාමීන්ට; අඩුවැඩි, අඩියක් අධිකවූ; තෙකෙළක් පමණ, ත්‍රිකොටිපරිමිතවූ; රනින්, සුවර්ණයෙන්; (35,000,000—අඩුතුන් කෙළක් ධන විසඳු); මහත්, පූජ්‍යවූ නොහොත් විශාලවූ; වෙහෙරක් කරවා, විහාරයක් සාධවා; දෙමින්, පිළිගන්වාලා; සුගත්හටමෙන්, තථාගතයන්වහන්සේට සෙයින්; නිති, ප්‍රතිවාසරයෙහි; පුද, සියුපසය දී; වැඳ, නමස්කාර කොට; දහම්, තුන්වළාවට; වැනි, (හෙළටුවාහි තුබූ පමණම විස්තරාර්ථවිසින්)

පරිවර්ධිතවූ; අටුවා, අර්ථකාණ්ඩවත්; ලියවමින්, පෙළනසර් පෙරළවනුයෙ; යසින්, කීර්තියෙන්; දිගත්, දිශාන්තයන්; සොබවී, ශෝභමාන කෙළෙ ෴

23. පුර, (බුද්ධප්‍රතිමාලය-චෛත්‍ය-බෝධිවෘක්ෂ-පරිවේණ-චඞ්ක්‍රමණ-මණ්ඩපාදීන්) අනූන කොට; දසටක් වෙහෙර, (කාලාවැවෙහෙරඈ) අෂ්ටාදශමහාවිහාරයන්; කරවා, සාධවා; දහඅටක්, අටලොසක් (පමණවූ; මහවැව්, (පාදුලක-හම්බළඨ්‍යාදි) මහාවාපීන්; බැඳිවසර, බන්ධනාවසරයෙහි කර්මාන්ත නිෂ්ඨාපනමංගලයැ; බිසව්අබිසෙස්, මහිෂිකොවාහමංගලයැ (රාජ්‍යාභිෂේකමංගලයැ යූ සේ යී); මහණුවම, ප්‍රව්‍රජ්‍යාකර්ම මංගලයැ යන; තෙමඟුල්, තුන්මඟුල; එකද, එකාහයෙහි (මැ); යෙදී, යුක්ත කළාවූ; ඇජර, ආචාර්‍ය්‍යවූ; කිවිවර, උත්තමකවිවූ; පිනින්, පුණ්‍යලක්ෂණයෙන් උපලක්ෂිතවූ; [පාඨාන්තර විසින්: කිවිවරබැවින්, උත්තමකවිත්වයෙන් යුක්තවූ;] ජානකීහරණඈ මහකව්, ජානකීහරණප්‍රභෘතිමහාකාව්‍යයන්; බැඳී, බන්ධනය කළාවූ; කුමරදස් රජ, (ධාතුසේනාපරනාමධෙය ඇති) කුමාර දාස නම් රජ තෙමෙ; කාලිදස් නම් කිවිඳුහට, (තමා යහළුවූ ශ්‍රීමද්-ආචාර්‍ය්‍ය) මහාකවිකාලිදාසයා උදෙසා; සියදිවි, ස්වීය ජීවිතය; පිදී, පරිත්‍යාග කෙළෙ ෴

24. ඉමල්හල, (දඹදිවැ කුසිනාරානුවර මල්ලරජුන්ගේ උපවත්තන නම් සල්වෙනෙහි) යමකශාලාන්තරයෙහි (පරිනිර්වාණමඤ්චකයෙහි වැඩැහොත්); මුනි, බුදුරජාණන්වහන්සේ (තමන්වහන්සේ පිරිනිවන් පෑවදූරන දිනයෙහි සක්දෙව්රජහු අමතා—"ලක්දිවැ මාගේ සස්න පිහිටන්නෙයැ, තො සක්දෙව් රජ! ලකසසුන් රකුව"යි); වදහළලෙසින්, ඇණැවූ නියායෙන් (සක්දෙව්රජහුවිසින් උපුල්වන්දෙව්රජුන් කැඳවා—"නිදුකාණෙනි! සිහබාරජු දරුවෝ විදූකුමරුවෝ සත්සියක් යෝබළුන් පිරිවරා ලක්දිව් බැසැ යක්සෙන් දනා මිනිස්වස් කෙරෙත් ල. බුදුසසුනුදු පිහිටන්නෙ ල. තො ගොසින් උන්හට අරක් කර. බුදුසසුනුදු රකුව"යි කියෙන්) මෙත්සිතින්, මෛත්‍රීචිත්තයෙන් යුක්ත වැ; මෙ ලක, මේ සිංහලදේශය; රක්නා, පාලනය කරන්නාවූ; උපුල්වන්දෙව්රජුන්, උත්පලවර්ණදෙවරාජොත්තමයාගේ; පිළිරුව, (රක්තචන්දනසාරනිර්මිත) ප්‍රතිරූපය; මහ සයුරතින්, මහාසමුද්‍රොදරයෙන්; වඩිනු දුකැ, එන්නා බලා; විමල්ගුණයුත්, අසංක්ලිෂ්ටගුණයෙන් යුක්තවූ; නමින්, අභිධාන විසින්; දපුලුසෙන්, දප්පුලසෙන නම් වූ; රජෙක්, භූපාලයෙක්

තෙමෙ; එ ආ, ආදියෙහි ති පිළිරුව පැමිණියාවූ; මොහොතින්, මුහූර්තයෙන්; විපුල්සිරි, මහත්සම්පත් ඇත්තාවූ; දෙව්නුවර, (දක්ෂිණලඞ්කායෙහි මහාතීර්ථප්‍රදෙශයෙන් ප්‍රාචීදික්හි) දෙව පුරය; කරවා, නිර්මාපණය කොට (විචිත්‍රචිත්‍රකර්මානෙකාජ්වලිතවූ ප්‍රාසාදයක් කරවා රන්කොත් පලඳවා); යහපතින්, මනාසේ; පිහිට කැරැවී, (තත්ප්‍රතිරූප) ප්‍රතිෂ්ඨාපනය කෙළෙ ෴

25. සසිරි, සශ්‍රීකාවූ; ඓශ්වර්‍ය්‍යසහිතවූ; මානාවුලුපුරෙයි, (රොහණරාජ්‍යයෙහි ගිරිපාදජනපදයෙහි වලහොයට බටහිරි දිගින් පිහිටි) මහානාගකුල (නම්) නගරයෙහි; පිරිසුදු, අසම්මිශ්‍රවූ උභයකුල ඇති; ඉඳුපරපුරෙන් ආ, රජපරම්පරායෙන් ආයාත වූ; සානුවක් අවුරුදු, ෂණ්ණවතිවර්ෂයක් මුළුල්ලෙහි; සොළින් වසඟ වැ තුබූ, චොළායත්ත වැ පැවැත්තාවූ; එ රට, ප්‍රසිඬ වූ රජරාෂ්ට්‍රය; ගෙනැ, තමා සතු කොට; මුනිසසුන්, (සූත්‍රගෙය වෛයාකරණෙත්‍යුක්තකප්‍රභෘති නවාංග) ශාස්තෘශාසනය හා; ලක, ත්‍රිසිංහලය; වවා, සමෘඬ කොට; අමුතු වැ, විශිෂ්ට කොට; මනුරජෙව්, වෛවස්වත මනුරජයා සේ; පිළිවෙළ, පරිපාටිය-සන්තානය; සැදූ, සජ්ජිත කළාවූ; එ, ප්‍රසිඬවූ; සිරිසඟබෝවිජයබා රජ, ශ්‍රීසංඝබොධිවිජයබාහුනරාධිප තෙමෙ; පස්පනස්අවුරුදු, පචපචාශත්සංවත්සරයක් (මුළුල්ලෙහි); විසී, (රාජ්‍යානුශාසනා කෙරෙමින්) කල් යැවී ෴

26. පොළොන්නරුපුර, (උත්තරලංකායෙහි) පුලස්තිනගර නම් පුරය අග්‍රරාජධානිය කොට විසූ; එ, ප්‍රසිඬවූ; පැරකුම්බා නිරිඳු, මහාපරාක්‍රමබාහු නම් පෘථිවීශ්වර තෙමෙ; ලක, ත්‍රිසිංහලය; එකසත් කර, එකච්ඡත්‍ර කොට (ඉක්බිති); ගොසින්, යාත්‍රාස්ථාන කොට; අරමණ, එනම් දෙශය; සොළී-පඬිරට, (දඹදිවැ දක්ෂිණාපථයෙහි) චොඩදෙශය හා පාණ්ඩ්‍යදෙශය; යුදයෙන්, සංග්‍රාමයෙන්; රැගෙනැ, තමාඅයති කොට; යස පුරා, යශඃ පූරණය කොට; (කීර්තිප්‍රතාපයෙන් ජගත්ත්‍රය සම්බාධ කොට; සෙහෙන්, මොනවට; මනහරා, ළ ගන්නාවූ; දෙදහස්පන්සියක්, පචවිංශතිශතපරිමිතවූ; මහවෙහෙර කරවා, මහාවිහාරයන් සාධවා; ලෝසසුන්, ලොකශාසනවය සම්බන්ධවූ; දුක්-අඳුරු, දුඃඛාන්ධකාරය නොහොත් දුඃඛය හා අන්ධකාරය; (ලෝවැස්සන් සම්බන්ධවූ දාරිද්‍ර්‍යාදි දුඃඛය හා ශාසනය සම්බන්ධවූ වෛතුල්‍යවාද මිශ්‍රණඅප්‍රතිපත්තිදුෂ්ප්‍රතිපත්තිපූරණාදි අන්ධකාරය); හැරා, ඉවත ලා; තෙදින්, සවප්‍රතාපය කාරණ කොට ගෙනැ; දිවයුරු ලෙසින්, දිවසපතිව්‍යාජයෙන්; බැබැළී, බිජී ෴

27. මෙලෙස, උක්තප්‍රකාරවූ; තෙද, (කොශදණ්ඩජත) තෙජසයැ; බල, කායබලසෙනාබලාදියැ; මහත්අණසක, උදාරවූ ආඥාචක්‍රයැ; (යන, මෙ තී ගුණ); ඇති, විද්‍යමානවූ; රජුන්, (පූර්වවර්ණිත) නරශ්‍රෙෂ්ඨයන්ගේ; කුලැ, වංශයෙහි (උපන්නාවූ); සවුළුවිජෙබාතිරිඳුපිත්පැරැකුම්රජුන්හට, සවුළුවිජයබාහුනරෙන්ද්‍රපුත්‍රපරාක්‍රමබාහුමහාරාජොත්තමයහට; මුනුබුරු, නප්තෘවූ; ලැමැනිජයමහලැනහිමිසුරතුර, ලම්බකර්ණජයමහාලාන නම් මහීපාලස්වාමිරූපකල්පපාදපය; වෙළු, වෙෂ්ටනය කළාවූ; [පාඨාන්තරවිසින්: වැළැඳි, ආලිංගනය කළාවූ;) රන්ලියයුරු, ස්වර්ණලතාකෘතිවූ; සුනෙත්මහදෙවිබිසෝහිමි, සුනෙත්‍රාමහාදෙවී නම් මහිෂිකාස්වාමීන්වහන්සේ; බුදුකුරු, බොධිසත්වගුණ ඇති; සොඳ, මනකල්වූ; රජරුවක්, රජදරුවකු-රාජපුත්‍රයකු; ලත්, ලදු ෴

28. රයිගම් නම් පුර, (මෙ මැ ලක්දිවැ මායාරටැ) රාජග්‍රාම නම් නගරයෙහි; උතුම්ගුණයුත්, උත්තමගුණොපෙතවූ; මෙ පැරැකුම්බා නිරිඳු, මේ (සුනෙත්‍රාදෙවීපුත්‍ර) පරාක්‍රමභුජ නරෙශ්වර තෙමෙ; සුසැටබරණ, චතුෂ්ටයාභරණයන් ද; සිද්ද වොටුනුත්, සිඛකිරීටය ද; පැලැඳැ, ප්‍රසාධනය කොට; පුරඳර විලසින්, ශක්‍රවිලාසයෙන් යුක්ත වූයේ; වෙළෙඳගොවිකුලැ වත්නිරිඳුන්, වණිග්ගෘහපතිවංශ්‍යවන්‍යනරෙන්ද්‍රයන්විසින්; නොදැනැ, කාර්‍ය්‍යාකාර්‍ය්‍යවිචාරණයෙහි මූඪ වැ; කළ, අනුෂ්ඨිතවූ; නොසිරිත්, දුර්නීතින්; වරු, වර්ජිත කොට; ලෝසසුන, ලොකශාසනවය; බබුළුවා, උද්දීප්ත කොට; දිවයුරු කුල, හිරුහුගේ කුලය-සූර්‍ය්‍යවංශය; සරසමින්, සජ්ජිත කරමින්; හෙබවී, ශොභමාන කැරැවී; [පාඨාන්තරවිසින්: පැලැඹෙයි, වැජැඹේ] ෴

29. මෙනිරිඳු, මේ නරොත්තමයා; දකුතු, දර්ශනය කළ හොත්; නුවන්ලත්පල, නෙත්‍රලාභයෙහි ඵලය; ලැබෙයි, ලබ්ධ වෙයි; සිතුවොත්, ධ්‍යාන කළ හොත්; (මේ රාජොත්තමයාගේ ගුණානුස්මරණය කළ හොත්); දුක්, ව්‍යසන; ඇරේ, පහ වෙයි; රස, මාධුර්‍ය්‍යයෙන්; නුමුතු, අමුක්තවූ; බස්, වදන්; ඇසුව, ශ්‍රවණය කළ හොත්; අරතරේ, ඉතාශීඝ්‍ර වැ නොහොත් අත්‍යන්තසාරවූ; දෙව්ලොවැ, ස්වර්ලොකයෙහි (විද්‍යමානවූ); [පාඨාන්තරවිසින්: දෙලොවැ මැ, මෙලෝපරලෝදෙක්හි මැ හෙවත් ඓහික-පාරත්‍රිකසංඛ්‍යාතවූ]; සැපත්, සම්පත්; පැමිණෙයි, සම්ප්‍රාප්ත වෙයි; දිමුතු, උද්දීප්තවූ; යස, පරිවාරසම්පත්තිය නොහොත් කීර්ත්තිය; තෙද, තෙජස-ප්‍රතාපය; නුවණ, ඥානය; ගුණ, ඉන්ද්‍රියවිජය-දුෂ්ට

න්‍ග්‍රහ-ශිෂ්ටපරිපාලනාදිය; කිවු, කීර්තනය කළ හොත්; කැමැති යම් දෙය; ඊප්සිතවූ යම් කිසි සැපයෙක් වේ ද ඒ; සිදු කෙරේ, නිපදවා. එබැවින්, එසේ හෙයින්; අමුතු බැඳි පද, අභිනව රචිත පද්‍යයන්; සබතුරේ, සමායෝදරයෙහි; කියම්, කථනය කෙරෙම්; වියතිඳු, කවිසමයනිපුණ මහතුනි! (තෙපි;) ඒ, වක්ෂ්‍යමාණපද්‍යයන්; අසව්, (අවික්ෂිප්තචිත්තයෙන් යුක්ත වැ සාදරයෙන්) ශ්‍රවණය කරව් ෴

30. පැහැදිසරම්බාරුදිමනරම්බා,—පැහැදි, ප්‍රසන්නවූ; සරම්බා, පද්මාවතිය-ලක්ෂ්මිය; රුදි, රජිතවූ; මනරම්, හෘදයඞ්ගමවූ; බා, බාහුයුගළ ඇති; තුනුසිරිරම්බාපතිපිළිබිම්බා,—තුනුසිරි, ශරීරසම්පත් කාරණ කොට ගෙනැ; රම්බාපතිපිළිබිම්බා, (රම්භාවට වල්ලභවූ වෛශ්‍රවණපුත්‍ර) නලකූබරප්‍රතිමවූ; රුපුරජරම්බාරනමතකුම්බා,—රුපුරජරම්බාරන, පරරාජලක්ෂණරම්භාරණ්‍යයට; (හෙවත්: කදලිවනය මැඩැලීමට); මතකුම්බා, මත්තහස්තිතුල්‍යවූ; තෙව්කුම්බා, විෂ්ණුට බන්ධුභාග්‍ය ඇති; පැරකුම්බා හිමි, පරාක්‍රමබාහුස්වාමිය! (තො); දින, ශත්‍රුමථනය කර ෴

31. රනගලතලයුරුපැහැසරපුලුලුර, කනකගිරිනිතම්බප්‍රතිභාගප්‍රභාස්වරප්‍රෘථුලවක්ෂඃස්ථල ඇති; දෙව්රජගජකර මෙන, ඓරාවතකරිකරාකාරවූ; දිගුයුගකර, ආයතබාහුයුගළ ඇති; මන පිනවන, (දුටු දනන්) සිත්සතන් සතුටු කරවන්නාවූ; පුල්සල්තුරුසිරිදර, ප්‍රඵුල්ලශාලවෘක්ෂයක්හුගේ ශොභාව උසුලන්නාවූ; [පාඨාන්තරවිසින්: පුල්, විකශිතවූ; සල්තුරු, ශාලවෘක්ෂයක් සේ; සිරිබර, ශ්‍රීභාරවූ;] කැත්කුලමිණි, ක්ෂත්‍රියවංශශ්‍රෙෂ්ඨවූ; පැරැකුම්නරවර, පරාක්‍රමබාහුනරෝත්තමය! (තො); දින, දිග්විජය කර ෴

32. මෙ රදුන්, මේ පරාක්‍රමබාහුමහාරාජොත්තමයාගේ; සරණන, අංඝ්‍රියුග්මය තෙමෙ; ලකැ, සිංහලදෙශය විෂය කොට ඇති; තුන්රට, රුහුණුරට හා මායාරට හා පිහිටිරට හා; මුළුදඹදිව පිළිබඳ, සකලජම්බුද්වීපප්‍රතිබද්ධවූ; නිරිඳුන් බිඟුකැන්, නරපති නමැති භ්‍රමරසමූහයා; අවුදින්, වෙත එළැබැ; ගෙනැ යන, හැරැ ගෙනැ යන්නාවූ; රන්මිණිමුවරඳ, හිරණ්‍යමණිලක්ෂණමකරන්ද ඇති; තඹරෙකි, තාමරසයෙකි ෴

33. සගුණෙන්, සන්ධිවිග්‍රහාදිය කාරණ කොට ගෙනැ; [පාඨාන්තරවශයෙන්: සෙගුණෙන්, ජෙසාගුණය නොහොත් සෙව්‍යගුණය නොහොත් උත්තමගුණය කාරණ කොට ගෙනැ;] පුවතර,

(අන්‍යමනුජාධිපයනට) ජ්‍යෙෂ්ඨවූ නොහොත් ලොකප්‍රසිද්ධ වූ; මෙ නිරිඳු, මේ නරපුඞ්ගවයාගෙ; සිරිවැකි, ලක්ෂ්මිය හා එක්වූ; සොබමන්, ශොභමානවූ; පද, චරණයෙහි (ලූ); රන්සළඹා, හෙමනූපුරය තෙමෙ; දල්ලඹ, උදකාවලම්බිතවූ; නිලබා, කළුවලා ක්‍රීළ; තිළිණෙන්, ත්‍යාගසම්පත්තිය කරණ කොට ගෙන; ජය ශ්‍රීගෙන, පරදවා; බලයෙන්, බල පෑ; (හඬාදිත්‍යර්ථඃ); ගත්, ස්වීකෘතවූ; ලෙළවිදුලිය, චවලවූ විද්‍යුත්හුගෙ; පබාසෙ, පැහැය මෙන්; සසොබා, ශොභාසහිත වී ෴

34. සිළුමිණිරජ, රාජචූඩාමණිවූ; ('රජසිළුමිණි'යි කියැ යුතු යෙහි ප්‍රතිපාතන කළා); මොහු, මෙ පැරකුම්බා නරපතිහුගෙ; පුවළා, ප්‍රෞඪවූ; දෙවටොර, වෘත්තොරුයුග්මය තෙමෙ; ලකළා, අලංකෘතවූ; සළුමිණිබරඳල්, මණිහාරජාලයෙන් යුක්තවූ ශාටක යන්; ගවසන, ආච්ඡාදනය කරන කල්හි; මූළුලොව, සමස්ත ලොකය; උසුලන, උවහනය කරන්නාවූ; රන්ටැම්යුවළා, ස්වර්ණස්තම්භයුගමයක්හුගෙ; ලෙළුමෙන්, සෞන්දර්‍ය්‍යය සෙයින් නොහොත් බැබැළීමක් සෙයින්; නො වළා, එක්වන්; දන මන පිනවයි; ලෝවැස්සන්ගේ සිත් සතුටු කරවා ෴

35. මොහු, අදූරවර්ත්තිහුගෙ; පුලුලුකුළා, පෘථුලවූ ශොණි භාමො; දිනකරසියරුම්ණිසරපුවළාම්න, පද්මරාගමණිරචිත හාරවිශෙෂලක්ෂණප්‍රෞඪමත්ස්‍යයන් ඇති; ඉණසැදරළ, කටි සජ්ජලක්ෂණතරංග ඇති; මුතුපෙණඹසළා, මුක්තාලක්ෂණඵෙණ සචය ඇති; ගනවෙරළත, දෙහලක්ෂණවෙලාන්ත ඇති: (ඝනඃ ශරීරමිති රාජනිඝණ්ටුඃ); තිළිණෙන්, ත්‍යාගය හෙතු කොට ගෙන; වතළා, විස්තෘතවූ; ගඟ, ගංගාවගෙ; රනවැලිතලවැනි, ස්වර්ණවාලුකාස්ථලයක් වැන්නීය ෴

36. සිරිමත්, ශ්‍රී ඇත්තාවූ; පින්සර, පුණ්‍යසාරවූ; පැරකුම් නිරිඳුගෙ, පරාක්‍රමභුජක්ෂ්මාපතිහුගෙ; දුන් කොකුමඟරු, ගල්වන ලද කුංකුමාංගරාග ඇති; උරැ, වක්ෂඃස්ථලයෙහි; යුත්, යොදන ලද, පලඳනා ලද; මුතුහර, මුක්තාහාරය තෙමෙ (සොබඳු වී දූ යත්?) සැඳැරැපත්, සන්ධ්‍යාරාගප්‍රාප්තවූ; රන්මෙරගිරිතළමැද, ස්වර්ණමෙරුපර්වතනිතම්බමධ්‍යයෙහි; පිළිබිඹුපත්, ප්‍රතිබිම්බිතවූ; තරුවැළමෙන්, තාරාවළීව්‍යාජයෙන්; බැබැළිණි, භ්‍රාජමාන වී ෴

මෙසින් පැරකුම්බාරජහුගෙ උරඃස්ථලය ස්වර්ණමෙරුපර්වත නිතම්බතුල්‍යයැයි කිව ෴

37. රතුමිණිනවපලුතිල්මිණිකොළඳර, රක්තමාණික්‍යලක්ෂණ නවපල්ලව හා ඉන්ද්‍රනීලමණිලක්ෂණපත්‍ර ධරන්නාවූ; මුතුමල්

පිපි, මුකුලලක්ෂණවිකසිතකුසුම් ඇත්තාවූ; රතරේනවැළ පැහැසර, හිරණ්‍යලක්ෂණපරාගාවලින් බබළන්නාවූ; සිතුලෙස දෙන විතරණගුණපලබර, සිත්වූපරිද්දෙන් දීයමානවූ ත්‍යාග ලක්ෂණඵලභාර ඇත්තාවූ; මෙ, සම්පවත්තිවූ; නිරිඳු, (පරාක්‍රම බාහු) මනුජාධිපතිහුගෙ; අත, හස්තය තෙමෙ; සුරතුර, කල්ප වෘක්ෂයාගෙ; අතුසිරි, ශාඛාශ්‍රිය; ගති, ස්වීකාර කොළේ ෴

38. රසඳුන්වැකි,, රසාජනචර්චිතවූ; යුගනෙත, නෙත්සඟළ; මැඳ, මධ්‍යවර්තිවූ; ලප වැනි, කලංකය වැන්න; සවනතැ, කන තෙහි (බැහූ); මිණිඅබරණ, රුවන්මුවා පලඳනා; තරුවැළබඳ, තාරාවලී වැන්න; සත, ප්‍රජාවන්ගෙ; නෙත නෙතු, ඇසක් ඇසක් පාසා; පිරි, පූර්ණවූ; මඳහස, ස්මිතය; සඳකැන්, ජ්‍යොත්ස්නා වැන්න (එහෙයින්); පැරකුම්රජු, පරාක්‍රමබාහුභූපතිහුගෙ; වුවනත, වක්ත්‍රය තෙමෙ; සඳමඩලෙකි, චන්ද්‍රමණ්ඩලයෙකි ෴

39. දියනෙතකුලපති, සූර්‍ය්‍යවංශාධිපතිවූ; මෙ, අවිදූරස්ථවූ; රජුගෙ, (පරාක්‍රමභුජ) භූපතිහුගෙ; මනනඳ, සහෘදයහෘදයා නන්‍දවූ; සිරිඅත, ලක්ෂ්මීහස්තන්‍යස්තවූ; රන්දපණෙව්, හිරණ්‍ය මුකුරයක් සෙයින්, රන්කැටපතක් සෙයින්; සොඳ, මනකල්වූ; වුවනත, වක්ත්‍රය තෙමෙ; සවනත, කර්ණාන්තයෙහි (ප්‍රක්ෂිප්තවූ); රතුමිණිකැන්පිවිරස්, රක්තමාණික්‍යකාන්තිලක්ෂණතිග්මාංශුප්‍ර භාව; වැදූ, ඝර්ෂිත වැ; ඇමසඳ, හැමකල්හි; පුල්, විකසිතවූ; නව, නූතනවූ; පැහැපත, ප්‍රභාප්‍රාප්තවූ, (මනාපැහැ ඇති); පියුමෙකි, පද්මයෙකි ෴

40. බුදුකුරු, බොධිසත්වගුණයෙන් යුක්තවූ; මෙ නිරිඳු, මේ අධිපතිහුගෙ; අගපත, මස්තකප්‍රාප්තවූ; නවමිණිකැන්රුඳු, නව රත්නකාන්තීන් රජිතවූ; රන්කිරුළ, ස්වර්ණකිරීටය; (කෙබඳුද යත හොත් :) තරසර, ස්ථිරසාරවූ; විදුලිය, විද්‍යුත්හුගෙ; සිරි, ශොභාව; ගත, ග්‍රහණය කළාවූ; තුඟුසිඟු, උත්තුංගවූ (පර්වත) ශෘංගයෙක් වේද; එහි මුදුනත, ඊමතුයෙහි; උදු, ඍජුවූ; ඉඳුසැවු සිය, ශක්‍රධනුශතයෙක්; ඇත, විද්‍යමාන වත් හොත්; එ මැ විලසින් යුත, තවිලාසයෙන් මැ යුක්ත වෙ ෴

41. මහසෙන්පිරිවරතුරුමැද, මහාසෙනාපරිවාරසංඛ්‍යාතතා රකාමධ්‍යයෙහි; සඳයුරු, චන්ද්‍රාකෘතිවූ; මෙ, වෙතැ සිටිනා; රදුන්, (පරාක්‍රමභුජ) රාජෝත්තමයා; විසිතුරු, විචිත්‍රවූ; ගතරන්රතයට, ඝනකනකස්‍යන්දනයට; නගිමින්, ආරූඪ වැ; පුරතුරු, නගරා භ්‍යන්තරයෙහි; පැදකුණු වන ලෙස, ප්‍රදක්ෂිණා කරන ආකාරය; (කෙසේ දෑ යත හොත් :) පුරඳුරු, ශක්‍රයා; සුදසුන්වේමැද, සුදර්ශනවීථිමධ්‍යයට; පත්වැනි,*පැමිණියා මෙනි ෴

"පැදකුණු කළ ලෙස" යනු තෘතීයචරණපාඨාන්තරයි.— "ප්‍රදක්‍ෂිණා කළ ආකාරය" යනු අර්ථයි.

42. ගුණයෙන්, සෞම්‍ය ගුණය කාරණ කොට ගෙන; තරිඳු, චන්‍ද්‍රයා වැනිවූ; ගැඹරින්, ගම්භීර ගුණය කාරණ කොට ගෙන; කිරිඳු, ක්‍ෂීරසාගරය වැනිවූ; බලයෙන්, කායශක්ත්‍ය කාරණ කොට ගෙන; කිරිඳු, (අවිශෙෂයෙන්) හස්තිරාජයකු වැනිවූ; නොහොත් (සවිශෙෂයෙන්:) ඉඳු කිරි, ඓරාවණයා වැනිවූ; දිරියෙන්, ධෛර්‍ය්‍යගුණය කාරණ කොට ගෙන; ගිරිඳු, (මේරු) පර්‍වතරාජයා වැනිවූ; නුවණින්, ඥානය කාරණ කොට ගෙන; ගිරිඳු, ගීෂ්පතිහු වැනිවූ; විකුමෙන්, (පරාභිභවන ලක්‍ෂණ කොට ඇති) වික්‍රමය කාරණ කොට ගෙන; සිරිඳු, ශ්‍රීපතිහු වැනිවූ; සිරි, සම්පත් කාරණ කොට ගෙන; ඉඳු, ශක්‍රයා වැනිවූ; නොහොත්: සිරි, ශ්‍රිය කාරණ කොට ගෙන; ඉඳු, චන්‍ද්‍රයා වැනිවූ නොහොත්: ඉඳු සිරි, චන්‍ද්‍රයාටමෙන් ලක්‍ෂ්මිය ඇත්තාවූ; නො හොත්: සිරිඳු, ඓශ්වර්‍ය්‍යයට අධිපතිවූ; පැරකුම්බුජතිරිඳු, පරාක්‍රමභුජනරෙන්‍ද්‍රය! (තෝ); දින, අරාතීන් විධ්වංසනය කර —

43. මනරම්, සිත්කලුවූ; සිරි, ඓශ්වර්‍ය්‍යයට නොහොත් රාජ්‍ය ලක්‍ෂ්මියට; පති, වල්ලභවූ; සරසවිරසවත්, වාඞ්මාධුර්‍ය්‍ය ඇති හෙවත් මිහිරිතෙපුල් ඇති; ගතගුම්සක්, සාන්‍ද්‍රවූඝොෂා ඇත්තාවූ හෙවත් මහත්හඬඇත්තාවූ නොහොත් මෙඝගර්ජිතා බඳු නාද ඇත්තාවූ දක්‍ෂිණාවෘත්තශංඛය; සෙවි, සෙවනය කරන්නාවූ; වෙර අළ, ප්‍රතිඝානුනය හෙවත් ක්‍රොධය පහ කළාවූ; අත, අන්තඃ කරණ ඇති; තුරුයුත්, සංහ්ලාදයෙන් යුක්තවූ නො හොත් (යථාකාලයෙහි සෙවුනාලද පචාංගික–) තූර්‍ය්‍යයෙන් යුක්තවූ; විහිගුම්, ව්‍යාප්තවූ; මින්නද, (පලන්අබරණ පිළිබඳ) මාණික්‍යයන්ගේ නාද ඇති; පුන්සඳනදවත්, පූර්ණචන්‍ද්‍රයා මෙන් (දුටු දනන් මන නුවන් වුළුඹුනා) මනාවූ සෝම්වුවන් ඇති; කගමිණි ගත්, ඛඩ්ගරත්නාදෘතය කළාවූ;—සමුද්‍රපක්‍ෂයෙහි:—මනරම්, චිත්තාභිරාමවූ; සිරිපති, විෂ්ණු හා; සරසවිරස වත්, සරස්වතීගංගාජලය ඇති; ගතගුම්, සාන්‍ද්‍රවූ ගර්ජිතා ඇති; නොහොත්: මෙඝගර්ජිතා බඳු ගර්ජිතා ඇති; සක්, ශංඛයන්ගෙ; සෙවි, ආශ්‍රය ඇති ('ශංඛ ඇති' යනු යි); තුරුයුත් වෙරළත, වෘක්‍ෂයන්ගෙන් යුක්තවූ වෙලාන්ත ඇති; විහිගුම්, විශීර්ණවූ; මින්නද, (තිමිංගිලාදී) මත්ස්‍යයන්ගේ නාද ඇති; පුන්සඳ, පූර්ණචන්‍ද්‍රයා හා; අනදවත්, [illegible] මත්ස්‍යවිශෙෂ ඇති; නොහොත්: නදවත්, නන්[illegible] ඇති[illegible], ජලනිගීම

ඇති; නොහොත්: කඅග, උදග්‍රාග්‍රවූ; ගත්, සජාතවූ; මිණි, රුවන් ඇති;—පැරකුම්රජ, පරාක්‍රමබාහුපෘථිවීශ්වර තෙමේ; සයුරෙකි, සමුද්‍රයෙකි ෴

44. මෙ නිරිඳු, මේ නරේශ්වරයාගෙ; දිමුතා, උද්දීප්තවූ; සුවිමල් යසසට, අතිපරිශුද්ධවූ කීර්තියට; නුමුතා, අමුක්තවූ; පැහැයෙන්, (විශදතරවූ) ශරීරවර්ණයෙන්; එකබඳුවන ලෙස, සමාන වනුසඳහා; ගජ, ඓරාවත තෙමේ; සුරනිඳුන්, සපිරිවාරශක්‍රයා; උසුලා, උවහනය කෙරෙයි; හ්ස, හංස තෙමේ; සතතා, බ්‍රහ්මයා; (උසුලා, උවහනය කෙරෙයි); උරගිඳු, අනන්ත නාරජ තෙමේ; උවිඳු, උපෙන්ද්‍රයා; (උසුලා, උවහනය කෙරෙයි); ද, වැළි; කෙලෙඝ, කෛලාශය තෙමේ; තිනෙතා, මෙහෙසුරුහු; සෙවි, සෙවනය කෙරෙ ෴

45. මනනඳ, හෘදයානන්දවූ; නුබගුණරුස, (අප්‍රමෙයත්වයෙන්) ආකාශය බඳු ගුණසංහති ඇති; පැරකුම්හිමි, පරාක්‍රමභුජභූපති ස්වාමිය! (නුඹවහන්සේ); දියබඳ, විෂ්ණුයෑ; සියුවත, බ්‍රහ්මයෑ, යන මෙ දෙදෙනාවිසින්; කළ, (පටිපාටින්) විහිතවූ; උතුරු සෙනෙහස, අධිකවූ ස්නෙහාධ්‍යාශය ඇති; සිරිසඳ, ලක්ෂ්මිය හා; සරසවි වෙත, බ්‍රාහ්මියකෙරේහි; සමඟ වැ වැසෑ, එක් වැ වසස කොට; පරදරපව්, පරස්ත්‍රීසෙවනජනිතපාපය, [මැදපදලොප්සමස්]; දුරු කළ ලෙස, පහ කළ නියාව; කෙලෙස දූ, කිඳෑක් වීදූ ? ෴ අන්‍යාංගනාසංගමයෙන් වන පාපය කිසෙසින් හළුයෙහි දූ? යී සේ යි ෴

46 දුලයසපැරකුම්රජ,—දුල, ජ්වලත්වූ; යස, පරිවාරසම්පත් ඇත්තාවූ; පැරකුම්රජ, පරාක්‍රමබාහුමහරජහුවිසින් (තමාගෙ); තෙදබලයෙන්, තෙජෝබලය කාරණ කොට ගෙනැ; දඹදෙණි වැසි, ජම්බුද්‍රොණිවාසනව්‍යවූ; කුලවන්තින්, වෙළෙඳගොවිකුලැවන්තිනිරිඳුන්, වෛශ්‍යවංශ්‍යවන්‍යනරෙන්ද්‍රයන්; මැඩැ, මර්දනය කොට; තිසි, නෛරන්තරවූ නොහොත් යොග්‍යවූ; නිල ලා, ආරක්ෂා තබා; සිරිලක, රත්නද්වීපය; තැන්පත් කළ ලෙසි, ස්ථානප්‍රාප්ත කළ ආකාරය, සෙමෙහි තුබූ නියාව; (කෙසේ දූ යත හොත්:) කැලඹු, ක්ෂුභිතවූ; දිය, (අඛිලභුවන) ජලය; අගතිසි, කුඹුයොන් මහමුනිහුවිසින්; පැදූවැනි, ප්‍රසන්නකළා මෙනි ෴

47. අණතද, සනබ්ධවූ ආඥ ඇති; මෙ නිරිඳු, මේ නරෙන්ද්‍රයාගෙ; වැකි, වාක්‍යය ('නියොගයෑ' යී සේ යි); ළම, සිතින්; නො මකා, ලුප්ත නො කොට ('සිත්හි තර කොට පිහිටුවා' යැ යූ සේ යි); ගුණසරු, මොහනගුණයෙන් සාරවූ; නොයොත්: ළම, සිත්හි; වැකි, වැකුණාවූ, පිහිටියාවූ; මෙ නිරිඳු, මේ නරවීරයාගෙ; තද, දැඩිවූ; අණ, ආඥව; නො මකා, ලුප්ත නො කොට

('ස්ථිර කොටයැ' යු සේ සි); ශ්‍රීණ සරු, පරන්තපාදිගුණසාරයෙ පිළිබඳවූ; අකරත වන්, අක්ෂරයන්ගේ ප්‍රවේශය ඇති, (පැරැකුම්බාමිහිපල්හුගේ සම්බන්ධවූ ආඥාව මෙතෙහි කොට පරන්තපාදි ගුණසාරය පිහිටුවා බඳනාලද); ගනකාළම, මේඝකාළම (එනම් මූත්‍රාවිශෙෂය) හා යොගවූ; රන්කාළම, කනකකාහළය; බැණෑ හැඟු, භණිත කොට තඟනාලද ('පිඹිනාලද්‍ද' යී සේ සි); නද, හඩ; අසමින්, කනැ ඕමින්; රණදෙරණන, යුඩභූමියෙහි (සිටිනා); කා, කවර නම් සතුරකුගෙ; ළම, සිත්; නො සැලේ ද්‍ද, චචල නො වේ ද්‍ද? චචල වන්නේ මැ' යී සේ සි ෴

48. බාතියරජ්වන්, භාතියරජතුල්‍යවූ; පැරැකුම්දිනරද, පරාක්‍රමබාහුනරෙශ්වරලක්ෂණදිනෙශ්වරයාගෙ; සියුරඟසෙන්රස් කඳ, හස්ත්‍යශ්වරථපදාතිලක්ෂණරශ්මිසෙනාමය; ජෝතිය වන, බබළන කල්හි; ජෝතියසිටුනරවරගනඳරකද,—ජෝතියසිටු නරවර, එනම් ජනාධිපති නමැති; ගනඳරකද, ගාඪාන්ධකාරකදම්බය තෙමෙ; බීතිය කැරැ, තමා භය ඇත්තා කොට හෙවත් භය ප්‍රාප්තවැ; පරසක්වළ, චක්‍රවාලාන්තරයට; වැදූ ගියෙ, ප්‍රවෙශවි෴

තවද කිසි පොතෙකැ —

"බා ති ය රජ වන් පැරැකුම් දිනර ද
ජෝ ති ය සියුරඟසෙන් රුස් කළ ස ඳ
ජෝ ති ය සිටි නරවරගනඳරක ඳ
බී ති ය කැරැ ගියෙ පරසක්වළ වැ ද"

යන පාඨාන්තරයෙක් ඇති ෴ එහි අර්ථ:—

"බාතියරජවන්පැරැකුම්දිනරද, භාතියරජහු වැනිවූ පැරැකුම්බානරපති නමැති දිනපතිහි; ජෝතිය, රශ්මිකදම්බය මෙන්; සියුරඟසෙන්, චතුරංගිණිසෙනාව; රුස් කළ සඳ, රාශීකෘත කල්හි; ජෝතිය සිටි, අභිගාමී වැ සිටියාවූ; නරවර, (රිපු) රාජ නමැති; ගනඳරකද, බහලාන්ධකාරස්කන්ධය තෙමෙ; බීතිය කැරැ, (තමාගේ චිත්තසන්තානයෙහි) භීතිය ඇති කොට හෙවත් භිතියට පැමිණැ; පරසක්වළ වැදූ ගියෙ, චක්‍රවාලාන්තරප්‍රාප්ත වී" යනු සි ෴

49. ඈපාහසරද, ආදිපාදරූපහංසරාජ තෙමෙ; කිවිකැලන්, කවිජනයන්ගෙ; ඔද,ගර්වයට හෙතුවූ; යසසින්, පරිවාරසම්පත්තිය නොහොත් කීර්තිය කාරණ කොට ගෙනැ; සුරරද, ශක්‍රප්‍රතිමවූ; රිවි කුලෙන්, හිරුහුගේ කුලයෙන්, සූර්‍ය්‍යවංශයෙන්; පැවැතෙන, ප්‍රවෘත්තිත වැ එන්නාවූ (සූර්‍ය්‍යවංශප්‍රභවවූ); පැරැකුම්රද, පරාක්‍රමබාහුනරොත්තමයාගෙ; සුරත, අතිරක්තවූ නොහොත් ඉතා

ඇලුම් කටයුතුවූ; සිරිපාසර, ශ්‍රීපාදපද්මය සම්බන්ධවූ; මූවරද, ධූලියෙහි, පරාගයෙහි; ගැවී, චර්චිතවූ; සිතැ, (තමාගේ) අන්තඃකරණයෙහි; තැවුල්, සන්තාපය; නිවී, නිර්වෘත කැරගති ෴

50. ගංපළකුමරු, ගංපළකුමාර තෙමෙ; පිනිපාවන්, හිමාංශුවර්ණවූ; පිරිසුදු, පරිශුද්ධවූ; යසවතුරු, යශඃප්‍රවාහ ඇති; සියපා, හිරුහු මෙන්; තෙදයුත්, තෙජසින් යුක්තවූ; සොඳුරු, භද්‍රවූ; මෙ, අභිමුඛවර්ත්තිවූ; රජුගෙ, පරාක්‍රාන්තභුජභූපතිහුගෙ; මහරු, මහාර්හවූ; සිරිපාතියරස්ගඟ, ශ්‍රීචරණතාම්‍රාංශුව්‍යාජවූ නදියෙහි; බැසැ, නිමග්න වැ; ගිම්, (සවිත්‍රසන්තාපවර්ත්තිවූ භීති-) ඝර්මය; සතපාගති, සන්තර්පණය කැරගත්තේයැ, නිවාගත්තේයැ, සන්හිඳුවාගත්තේයි ෴

51. වැඩි, වර්ධනාලද, ඔසවනලද; රන්කොඩිමෙන්, ස්වර්ණකෙතනසෙයින්; මුළුලොවැ, අශෙෂලොකයෙහි; පසිඳු, ප්‍රසිද්ධවූ; පින්දැඩියෙන්, පුණ්‍යදාර්ඪ්‍යයෙන්; වැඩි, මහත්වූ; පැරකුම්නිරිඳු, පරාක්‍රමභුජනරාධිප තෙමෙ; මන්, චිත්තයෙහි; එඩියෙන්, දර්පයෙන්, චිත්තාඩම්බරයෙන්; අඩියක්, පාදමාත්‍රයක්; පසුනො වැ, පසුබට නො වී; ඉඳු, ඍජු වූයේ; පුරුදු, පරිචිතවූ; විකුමෙන්, වික්‍රමයෙන් යුත්; කන්නඩි, කර්ණාටයන්ගේ; මන්, මානය; මැඩි, මර්දනය කෙළෙ ෴

52. පෙර සිටැ, පූර්වයෙහි පටන්, චිරකාලයෙහි පටන්; පුරුදු, පරිචිතවූ; ජයමන්, ජිගීෂුචිත්තය, දිනියැටි සිත; [පාඨාන්තර විසින්: රජමන්, රාජමානය;] නැරිය, නො හළාවූ; වීරියබල විකුමෙන්, වීර්‍ය්‍යබලවික්‍රමයන් කාරණ කොට ගෙනැ; මිගිඳු සරි, මෘගරාජසදෘශවූ; ආරියසක්විතිරජකුලකුමුදසූරිය, ආර්‍ය්‍යචක්‍රවර්ත්ති නම් රජහුගේ කුල නමැති කෞරවයන් හැකිළවීමට සහස්‍රරශ්මිහු වැනිවූ; හිමි, ස්වාමිවූ; පැරකුම්නිරිඳු, පරාක්‍රමබාහු නරොත්තමය! (තො); දිනා, ශත්‍රැවිජය කර ෴

53. පැරකුම්රජ, පරාක්‍රමබාහුභූපාලයාවිසින්; කී, අභිහිතවූ; නිරසර, සචිරසාරවූ; මෙවර, සම්ප්‍රෙෂය; මුඳුනත කැර, මස්තකයෙහි කොට (පිළිගෙනැ); සෙන්, මහාබලසෙනා තොමො; සොළියා පුර, චොලරාජ්‍යයට; වැදැ, ප්‍රවෙශ වැ; පැලඹෙන, විජෘම්භමානවූ; තෙදණින්, ආඥතෙජසින්; බාසුර, බබළන්නාවූ; වර, (හස්ත්‍යශ්වබලවාහනාදීන් යුක්ත හෙයින්) ශ්‍රෙෂ්ඨවූ; කුරුඬයන්මාලවරායර, එනම් ජනාධිපයා; පැරැදූ, පරාජය කළා ෴

54. දෙරණින්, මිහිකතවිසින්; ලියතුරු, ලතාන්තරයන්ගෙ; උසුලනු, ඉසිලීම, කෘතොවහනය; පැනෙනුයැ, දෘශ්‍යමාන වන්

ර්ණනයැ; දුන්, මෙසමයෙහි; මෙ නිරිඳු, මෙ රජහුවිසින්; සුරතින්, (තමා) දකුණතින්; ගත්, ගන්නාලද; පිවිතුරු, පවිත්‍රවූ; නිලුපුල් පැහැයුතු, නීලොත්පලවර්ණයෙන් යුක්ත වූ නොහොත් නීලො පලවර්ණයෙන් යුක්තවූ හෙවත් ඉන්ද්‍රනීලමණිවර්ණවූ; කගලිය, අසිසංඛ්‍යාතලතා තොමෝ; නිරතුරු, අනවරතයෙන්; මිහිකත, මහීකාන්තාව; උසුලා, උවහනය කොට; විසිතුරු, අපූර්වය; කියලිය, පහළ කළා ෴

'පෘථිවි තොමෝ ලතාජාතීන්ගේ උවහනය කෙරෙයි, ඒ අපූර්වයෙක් නො වෙයි, නිසර්ගසිද්ධයි, හැමදෙනාවිසින් මැ දක්නා ලැබෙ. අද්‍යත්වයෙහි මේ පැරකුම්බාරජහුවිසින් තමා දකුණතින් ගන්නාලද ලොහොමල නැති ශ්‍යාමවර්ණවූ ඛඩ්ගලතා තොමෝ සතතයෙන් මහීකාන්තාව උසුලයි, ඒඅපූර්වයැ' යනු භාවයි ෴

චතුර්ථපාදයෙහි 'මිහිතල' කියාත් පාඨයි, 'මහීතලය' යනු අර්ථයි ෴

55. රණහණ වන්, සංග්‍රාමභූමිගතවූ; රුපු, සතුරන්ගෙ; වෙර, දෙහසම්බන්ධිවූ; ලේ, රුධිර නමැති; දිය, උදකය; ඉසි, සිචනය කළාවූ; නිසි, අනවරතයෙන් නොහොත් යොග්‍යවූ; පිපි, විකශිතවූ; යසමල්, යශඃකුසුම ඇති; මෙ රජුගෙ කගලිය, මේ (පරාක්‍රමබාහු) මහීපාලයාගේ ඛඩ්ගරූපලතා තොමෝ; එහි, ශත්‍රුරාජයන් පිළිබඳ රාජ්‍යයෙහිලා; දසදම්රැසි, දශරාජධර්ම සංඛ්‍යාත රස ඇති; රජසිරිපල ගෙනැ, රාජ්‍යශ්‍රීසංඛ්‍යාතඵලයන් ජනනය කොට; මුළුලෝවැසි, සකලභුවනවාසීවූ; සනදදගණ, ප්‍රජාසංඛ්‍යාතපක්ෂිසමූහයා; තුටු කැළැ, හෂ්ට කළා ෴

56. ගරුතර, අතිගෞරවවූ; තරසරදිරි, ස්ථිරසාරවූ ධෛර්‍ය්‍යය කාරණ කොට ගෙනැ; ගිරිඳුන් සරි, මහමෙර සමානවූ; හිරුකුල, සූර්‍ය්‍යවංශ නමැති; කිරිසමුදුර, අමෘතාර්ණවයට; තරිඳුන් අයුරු, පුන්සඳ බඳුවූ; සරුගුණ, සාරවූ ගුණය කාරණ කොට ගෙනැ; සුරිඳුන් සරි, සක්දෙව්රජහු වැනිවූ; පැරකුම්රජ, පරාක්‍රමබාහු නරශ්‍රේෂ්ඨ තෙමෙ; සොළිපඬිනිරිඳුන්, චොළපාණ්ඩ්‍යරාජයන්ගෙ; ඉසැ, මස්තකයෙහි; [ජාත්‍යෙකවචන.] කිරුළු, වොටුනු; පැලැඳැවී, ප්‍රසාධනය කැරැවී ෴

57. කලධෞ, රිදීය; කොඳ, (පිපි) කුමුදුමල; කිරණව, කිරිමුහුද; හස, සුදුතිසර් නොහොත් මහදෙවිය; හාර, මුතුවැළ යන මේ මංගලවස්තුතුල්‍ය වැ පතළාවූ; යසධෞ, යශඃප්‍රභා ඇති; උදාර, මහත්වූ; පැරකුම්නිරිඳු, පරාක්‍රමබාහුනරේශ්වරයහුට; සරුසාර,

අත්‍යර්ථයෙන් සාරවූ; සඳරිවිකුලැ, සොමසූර්‍ය්‍යවංශයෙහි වූ, නිරිඳෙ; මනුජාධිපයො; නොවාරා, නොකඩ වැ; මුදුනැ, මස්තක යෙහි; දේ අත් බැඳැ, බඬ.ජලී වැ; සිටිති, ස්ථිත වෙත් ෴

58. වැරසැර, වීරසාරවූ; මෙ නිරිඳු, මේ මනුජේශ්වරයාගෙ; විකුමන්, වික්‍රමවිශෙෂයන්; සිතුවොත්, (උපමාවශයෙන්) පරි කල්පනය කළ හොත්; මහමෙර, ත්‍රිදිවාධාරය; තුඹසෙක්, වල්මීකයෙකි; (දුඃභාවයෙනි.) සමුදුර, සමුද්‍රය; කිඳුලෙකි, කුඩා ඇළියෙකි; (ගම්භීරභාවයෙනි. කිඳුළි නම් වැස්සෙන් සෑරී ගිය නො ගැඹුරු ඇළයි;) තර, මහත්වූ; දඹදිව, ජම්බුවීපය; සියදෙර, ස්වගෘහචාරයෙහි; වැලිමළුවෙකි,' සිකතාමාලකයෙකි; (මිදුලි, මහද්භාවයෙනි. එහෙයින්;) සෙසුරජනරපණුවන්, අවශිෂ්ටරාජ නමැති නරප්‍රාණීන්; වෙර බැඳැ, වෛරබන්ධනය කොට, බඩ වෛරී වැ; කිමැ, කුමක් ද ? 'කරන්නේ'—යනු, ශෙෂාර්ථයි ෴

59. මෙ රදුන්, මේ රාජොත්තමයාගෙ; නරගුණ ලබනුව, ස්ථිර ගුණලාභය පිණිස; මෙරගිර, මෙරුපර්වත තෙමෙ; සුරිඳුන්, දෙතිස්දෙවියන් ඇතුළු සියලුපිරිවරසහිත සක්දෙව්රජහු; මුදු නෙන්, (තමාගේ) මස්තකයෙන්; උසුලා, ධරා; හැමවර, නිරතුරැ; තමතුනු, ස්වදෙහය සම්බන්ධවූ; අඩකින්, අඞ්ගයකින්; ගැලෙමින්, නිමග්න වැ; ගිරිපිරිවර සහ, සප්තකුලපර්වත මැ පරිවාරසහිත වූයෙ; දූන්, අද්‍යාපියෙහි; තව රකිනෙව්, තපස් රක්ෂා කෙරෙයි හඟිම් ෴

60. පැරකුම්නිරිඳුගෙ, පරාක්‍රමබාහුනරවීරයාගෙ; තුල් ගජ, ස්ථූලහස්තිය; රිය, රථය; හය, අශ්වය; මුතු, මුක්තාහාරය; පට වාසත්, පට්ටවස්ත්‍රය; වල්විදුනා, වාලව්‍යජනය; යුගමිණිවැළ, මණිමාලායුගලය; සේසත්, ධවලච්ඡත්‍රය; (යන මේ මංගල වස්තූන් එකක් එකක් පාසා); බැල්මෙන්, අවලොකනයෙන්; බෝසත්, බහුජනයො; කල් නො යවා, කාලාතික්‍රමණය නො කොට; දන ලැබැ, ධනලාභී වැ; පෝසත් වෙති, ප්‍රභුශක්තිය ඇත්තෝ වෙත් ෴

'පරාක්‍රමබාහු මහරජාණන්ගේ හස්ත්‍යශ්වාදීන් බැලීමෙන් බොහෝ ජනයෝ නොබෝකලකින් බොහෝ ධන ලැබැ ප්‍රභුත්ව යට පැමිණෙත්' යනු භාවයි ෴

61. ලොවට, ලොකයහට; ගුරා, ආචාර්‍ය්‍යවූ; පැරකුම්නර පවරේ, පරාක්‍රමබාහුනරොත්තම තෙමෙ; සරාසඳෙව්, ශරච්චන්ද්‍රයා සෙයින්; නොපිළිවෙත්පච්ගතඅඳරේ, අප්‍රතිපත්තිසංඛ්‍යාත කිල්විෂලක්ෂණබහලාන්ධකාරය; වරා, පහ කොට; ළතරේ, අනාහෘදයෙහි; සතොස්, සංහ්ලාදය; පුරා, වර්ධනය කොට; නොහොත් : ළ, හෘදයෙහි, සිත්හි; සතොස්, සන්තොෂය; තරේ,

ස්ථිර වැ නොහොත් අධික වැ; පූරා, පූරණය කොට; යතිසියුරන්, තපස්විලක්ෂණවකොරයන්; සසුන්හඹරේ, ශාසනශාසනලක්ෂණ අන්තරීක්ෂයෙහි; හෙබවී, ශොභමාන කැරැවී ෴

62. සැපතින්, සම්පත් කරණ කොට ගෙනැ; පුරඳුරුඅයුරු, පුරන්දරාකාරවූ; මෙ රදුන්, මේ පරාක්‍රමබාහුරාජෝත්තමයා විසින්; සතොසින්, සන්තොෂයෙන් යුක්ත වැ; තිති, අතුරු නැති වැ; දෙන, පරිත්‍යාග කරනුලබන්නාවූ; මහදන්වතුරු, මහාදානලක්ෂණමහොඝය තෙමෙ; යදිගඟ, යාචකලක්ෂණනදීන්; වසමින්, ප්‍රවර්ෂාදනය කරමින්; මන, (යාචකයන්ගේ) සිත් නමැති; දෙළ, නිර්ඣරයන්; ඉතුරු, උතුරුවනුයෙ; යසකිරි සයුරු, කීර්ත්තිලක්ෂණසුධාර්ණවය; පුරමින්, පූරණය කරමින්; වතළේ, ව්‍යාප්ත වී ෴

63. මොහු, මේශ්‍රීසංඝබොධිශ්‍රීපරාක්‍රමබාහු නරෙශ්වරයාගෙ; වරයස, අභීෂ්ටවූ කීර්ත්තියට; පිරිසඳ, පූර්ණචන්ද්‍රයා; කිරිතලි, ක්ෂීරවෂ්කයැ සි ද; කිරණව, ක්ෂීරාර්ණවය; දිගොවිලි, දීර්ඝවූ දෙලනයනත්‍රයැ සි ද; උරපති, අනන්තයා; නුරුවලි, නූපුරයැ සි ද; හරගිරි, කෛලාශය; කිඩසෙලි, ක්‍රීඩනශෛලයැ සි ද; සුරගජපති, සුදමයා; යති, යාත්‍රාසන්ධානයැ සි ද නොහොත් යානයැ සි ද; සුරගඟ, මන්දාකිනිය; මල්වැලි, කුසුමදාමයැ සි ද; තුරුපෙති, තාරකාපඞ්ක්තිය; මුතුවැලි, මුක්තාහාරයැ සි ද; යෙති, කියත් (ලෝවැස්සෝ) ෴

64. සුරගඟ, සුවර්ණදී තොමෝ; යුත්, යුක්ත නමැති; ගෙල, ග්‍රීවාඇති; වේ, වෙදසංඛ්‍යාතශාස්ත්‍රඥත නමැති නොහොත් ශාස්ත්‍රාන්ත චරිත්‍ර නමැති; පියපතරින්, පක්ෂසංහතියෙන් උපලක්ෂිතවූ; මතරඟ, සිත්කලූවූ; සියකුසතුරලඟ, නිජෝදර යෙහි ලඟනාවූ හෙවත් බඩතුර ඇලුණාවූ; නත්හර, අනන්තතුල්‍ය මුක්තාහාර නමැති; කිරි බිවූ, පයඃපානය කළාවූ; පැරැකුම් නිරිඳුගෙ, පරාක්‍රමබාහුනරදෙවයාගෙ; කිත්හැස, කීර්ත්තිලක්ෂණ හංසියවිසින්; තුඩගින්, චඤ්චවග්‍රයෙන්; ගත්, ගන්නාලද; පොකුරෙකි, පුෂ්කරාංකුරයෙකි ෴

65. සඳහිමසඳනේ වැනි, චන්ද්‍රතුෂාරචන්දනාකෘතිවූ; කල්, මනොඥවූ; සොමිගුණ, සෞම්‍යගුණ ඇති; මෙ ලකට, මේ තාම්‍රපර්ණීවීපයට; මුල්, මූලිකවූ හෙවත් ප්‍රධානවූ; නඳනේ, නන්දනීයවූ; පැරැකුම්රජ, පරාක්‍රමභුජාභිධානමධ්‍යමලොකපාල තෙමෙ; මුනිවදනේ, බෞඬශාස්ත්‍රයෙහි; හල්පිළි, ව්‍යඤ්ජනස්වර යන්; නො වරදා, නතාඛාඪිවශයෙන්; දැනැ, පරිඥානය කොට

ගෙහෙවත් යථාර්ථාවගමනය කොට; තමගිදනිදනේ, සවභෘදශ ලක්ෂණතිථියෙහි; සිල්මිණි, (සම්‍යක්කායවාක්සංයමසංඛ්‍යාත) ශීලලක්ෂණ රත්නයන්; ලා, බහා; රකි. රක්ෂා කෙරේ ෴

66. සියකුලෑ, සවීයවංශයෙහි (ආදිපුරුෂවූ); රිවිමෙන්, හිරුහු සෙයින්; කල්දෙස්පිළිවෙළ, කාලදෙශපරිපාටිය; පැයකින් පැයකට, ඝටිකාවක් පාසා; විමසා, විමංසනය කොට; දවස් අළු, දිවසාතික්‍රමණය කළාවූ; සත් අසළ, ශාස්ත්‍රාවබොධය ඇත්තාවූ; පියකරු, ප්‍රියකරවූ; පැරකුම්නිරිඳුට, පරාක්‍රමබාහුනරෙන්ද්‍රයහට; සරි, සමානවූවො; මුළුතුන්ලෝතුළ, (ස්වර්ගමර්ත්‍යපාතාලසංඛ්‍යාත) සකලභුවනකුහරයෙහි; කවුරු දූ, කවරෙක්හු දූ?; කිය, (පින්වත් සබිය!) තෙපලව ෴

67. දෙරණේ, භූලොකයෙහි; පුවතර, ප්‍රසිඬවූ නොහොත් ප්‍රමුඛවූ; මනරම්, හෘදයානන්දකරවූ; සිරිපැරකුම්නරවරණේ, ශ්‍රීපරාක්‍රමබාහුනරොත්තමය! (නුඹවහන්සේගෙ); සතපියකරණේ, ලෝවැස්සන්ගේ ප්‍රීතියට කාරණවූ; ඉවැසුම්ගුණයට, ක්ෂාන්තියට ද; යළි, නවද; පව්කම් කළ සතහට, පාපකර්ම කළ සත්වයන් කෙරෙහි, පාතකීන් කෙරෙහි; වන, වන්නාවූ; උරණේ, කොපයට ද; කුම් සරි වෙ දූ, කුමක් සමාන වේ දූ? (‘උපමා නැතැ’ සී සේ සි) ෴

68. මුනිගුණ සැලැකුම්, බුඬගුණානුස්මෘති ඇති; සිතැ, අන්තඃකරණයෙහි; පා, ක්‍රොධමදාවලෙපාදීන්ගෙ; නො වැකුම්, වැකීම් නැති; විකුමෙන්, ශෞර්‍ය්‍යාතිශය කරණ කොට ගෙනැ; තෙවිකුම්, වෙන්හු; නිති, නිරතුරු; නො තැකුම් කළ, තර්කණය නො කළාවූ (‘තමාගේ වික්‍රමය කරණ කොට ගෙනැ ත්‍රිවික්‍රමයාගේ වික්‍රමය කිසිකලෙකත් ගරු නො කළාවූ’ යනු, අර්ථයි); තිළිණෙනි, ත්‍යාගය කරණ කොට ගෙනැ; සුරකුම්, භද්‍රඝටතුල්‍යවූ; ලක නැව, ශ්‍රීලංකාවිපලක්ෂණනෞකාවට; කුම්සරි, කූපාකෘතිවූ; පැරකුම්අගරජ, පරාක්‍රමභුජ අග්‍රරාජයන්වහන්සේ! (තො); පැරකුම්, ශෞර්‍ය්‍යය; පෑ, ප්‍රකාශ කොට; දින, අරාත්‍යුත්පාටනය කර ෴

69. එම්බා, පින්වත් ලෝවැස්සෙනි! (තෙපි); සරසවිකමලම්බා, වාග්වනිතාපද්මාවතී දෙදෙනා; වෙතැ, තමා) සමීපයෙහි; රුඳැවූ, වාස කැරුවූ; සිරිපැරකුම්බා, ශ්‍රීපරාක්‍රමබාහු නම් වූ; මෙ නිරිඳු තුම, මේ නරදෙවොත්තමයාගෙ; නම, (‘ශ්‍රීපරාක්‍රමබාහු’ ‘ශ්‍රීපරාක්‍රාන්තභුජ’ ඉත්‍යාදි) සංඥා; බැතිපෙම්, භක්තිප්‍රේමය; බා, බහා (‘වර්ධනය කරමිනැ’ යූ සේ යි ; සඳහන් කළ සතහට, මොනවට මෙනෙහි කළ ජනයහට; ලොවැ ඇති, ලොකයෙහි විද්‍යමානවූ; සව්සිරි, සකලසම්පත්; ලැබෙනුයැ, ලබ්ධ වන්නීයැ, සම්ප්‍රාප්ත වන්නීයැ ෴

70. තෙදැති රුදුරු රුපුන්, ප්‍රතාපවද්‍රෛරූතීන්ගෙ; එඩි, චාණ්ඩික්‍යය; මැඩි, මර්දනය කළාවූ; විපුලවික්‍රමිනාරායණ, උදර වික්‍රමයෙන් ත්‍රිවික්‍රමප්‍රතිමවූ; යුවතිනයනමන පිනවන, යෞවන සත්‍රීන්ගේ නෙත් සිත් සතුටු කරන්නාවූ; රුසිරු, මනොඥවූ රූපශ්‍රිය කරණ කොට ගෙනැ; නාරායණ තේනය, අනංගයා වැනිවූ; තියුණුනැණැති, සියුම්නුවණැති ('තීරණප්‍රඥ ඇති' යනු භාවයි); හසළ, ආශ්‍රිතවූ (දන්නාලද); නොඑකුසතරවේද, නානා විධශාස්ත්‍ර හා (ඍග්-යජුඃ-සාම-අථර්ව සංඛ්‍යාත) වෙද චතුෂ්කය නොහොත් නෛකශාස්ත්‍රඥතාය කරණ කොට ගෙනැ; නාරායණ, (ධර්මපුත්‍ර) නාරායණ නම් ඍෂිහු වැනිවූ; රජ, (සතුරු) රජනට; නාරායණ, ("දණ්ඩග්‍රහණමාත්‍රෙණ නරො නාරායණො භවෙත්" ඉති යුඛැවින්) දණ්ඩග්‍රාහිවූ; සසිරි, සලක්ෂ්මීකවූ; පැරැකුම්බුජරජ, පරාක්‍රමබාහුපෘථිවීන්ද්‍ර තෙමෙ; නොහොත්: නාරායණ, එනම් සෛන්‍යවිශෙෂ ඇති; පැරැකුම්බුජරජරජ, පරාක්‍රාන්තභුජරාජේන්ද්‍ර තෙමෙ; පවති, ප්‍රවෘත්ත වේ ('පවතීවා' යනු යි) ..

71. ලාඩ, ලාටදෙශයැ හෙවත් ලඑරටයැ; ගව්ඩ, (වංගදෙශය පටන් භුවනෙශය අන්ත කොට ඇති) ගෞඩදෙශයැ; වංග, (සමුද්‍රය පටන් බ්‍රහ්මපුත්‍ර නම් හොය අවසන් කොට ඇති වඞ්ගදෙශයැ හෙවත් වඟුරටයැ යන; රටින්, දෙශාන්තරයෙන්; රතම්ණිමුතුපඬුරු ලබන, හිරණ්‍යයැ මණියැ මුක්තායැ යන මෙකී නාක් දෑ උපායන කොට ලබන්නාවූ; තැන තැන, තන්හි තන්හි; වනවිල්, කාන්ත නමැති තඩාගයන්හි; වැදූ, ප්‍රවෙශ වූ; රැඳි, රජිතවූ ('නිලීනවූයැ' යූ සේ යි); තුඩවැඩි, දෙඩමලුවූ; රුපුමැඩි, ශත්‍රු නමැති හෙකයනට; බුජංග, සර්පරාජන්වූ; රජවේශ්‍යාබුජංග, 'පරරාජවෙශ්‍යාභුජංග' යන විරුදනාම ඇත්තාවූ; නොහොත්: රජ, සාමන්තරාජ නමැති; වේශ්‍යා, පණ්‍යස්ත්‍රීන්ට; බුජංග, ද්‍රාවකවූ; කලිංගපුර, (ජගන්නාථයෙන් පූර්වභාගයෙහි පිහිටි කෘෂ්ණතීරාන්තයෙහි වූ) කලිඟුනුවර; දිනම්ණිකුලවිජය නිරිඳුපරපුරෙන් ආ, සූර්‍ය්‍යවංශ්‍යවිජයරාජපරම්පරායාතවූ; පැරැකුම්බුජරජහිමි, පරාක්‍රමභුජභූභුජස්වාමිය! (නො); දින, විජයශ්‍රී භජනය කර ..

72. කිරුළුසමඟ, මුකුටය හා එක් වැ; සූසැටබරණරත්න, චතුෂෂෂ්ටිසංඛ්‍යාකරත්නාභරණයෙන්; දෙවිඳුවිලස, ශක්‍රදෙවෙන්ද්‍ර විලාසයෙන්, සක්දෙව්රජහු සෙයින්; සැදි, සජ්ජිතවූ; නැබුළු, මහත්වූ; මෙ සිරිලක, මේ ශ්‍රීලංකා නමැති; නුබඟබ, අනන්ත

කෝෂාදරයෙහි; බබළන, විරාජමානවූ; නවනබෝරත්න, බාලාර්ක තුල්‍යවූ; දඹදෙණිපුර, ජම්බුද්‍රෝණිපුරයෙහි; සවුළුකුල, එනම් කුලයට අලංකාරවූ; වීර, අකම්ප්‍යවූ; රාජසිරෝරත්න, නරේන්ද්‍ර චූඩාමණිවූ; පැරකුම්බුජරාජරත්න, පැරකුම්බාරජරුවන, උත්කෘෂ්ටවූ පරාක්‍රමබාහු රජ තෙමෙ; මෙ මුළුලොවට, මේ සමස්ත ලොකයට; පුවතර වියැ, ජ්‍යෙෂ්ඨ වි නොහොත් ප්‍රසිඬ වී ෴

'පැරකුම්බුජරාජරත්න' යන තන්හි,—පරාක්‍රමබාහු රජ තෙමෙ කිසේ රත්න වී දැ යත්:—උපන් උපන් දැයතුරෙහි යමක් යමක් ඔකාට දැ හේ 'රත්නයැ' යි කියනු ලැබෙයි. පැරකුම්බාරජ ද රජනට ඔකාටයැ, එහෙයින් හේ 'රාජරත්න' නම් ෴ කියනලද මැ යි—"ජාතෙ ජාතෙ යදුත්කෘෂ්ටං තද්‍රත්නමභිධීයතෙ" යි ෴

73. ගජපති හයපති නරපතිරජුන්, හස්තිනාථ-අශ්වනාථ-නරනාථභූපතීන්ගෙ; එඬි, දපීය; මැඩැ, මිරිකා; ගත්, ගෙනැ බහාලනලද; කටාර, කටාහයක් (එනම් භාජනවිශෙෂයක්) වැනිවූ; බුජබල, බාහුබලයෙන් නිපන්; යසවතුරු, යසඹසය; සක්වළිනුත්, චක්‍රවාලයෙනුත්; පිටාර, බහිගීත කොට; උතුරැ කළ, ඉතිරවූ (ලොවැදිරිය දක්වා යැවූ); රජනිය, ආන්වීක්ෂිකීත්‍රයී වාර්තාදියැ; මුනිබණ, (ධර්මවිනයසංඛ්‍යාත) බුඬවචනයැ; වියරණ, පාණින්‍යාදිප්‍රණීත) ශබ්දශාස්ත්‍රයැ; කව්, ශ්‍රව්‍යකාව්‍යයැ; නළු, දෘශ්‍යකාව්‍යයැ යන මොවුන් පිළිබදවූ; සරසවි, වාග්විලාසිනියට; කොටාර, කොටගෙයක් හෙවත් ගබඩාවක් වැනිවූ; කපටරාජ තුරැකුටාර, කෛතවරාජලක්ෂණවෘක්ෂයනට පර්ශූපමවූ; මෙ රජ, මේ පරාක්‍රමභුජභූතධරාධිපතිහුගෙ; පුවතර, ප්‍රසිඬවූ; තුති, තිපු තොමො; වැජැඹි, විජෘම්භිත වූ ෴

74. දිනකරපුල්සියපතවිලැ, සූර්‍යවංශලක්ෂණවිකශිතශතපත්‍ර තඩාගයෙහි; රන්හස මෙන, සුවර්ණහංසයකු සෙයින්; සරඳන, සංරජනය කරන්නාවූ; ['සරහන' යනුදු පාඨයි—'අභිනය කරන්නාවූ' යන අර්ථයි. විමසියැ යුතු.] නිරිඳුන්, (අන්‍ය) නරාධිපයන්; ගෙනැ, තමා වශයෙහි පවත්වා; තම සන්හස, ස්වීය රාජපට්ටය; මුඳුනත, (තමා තමා ගේ) මස්තකයෙහි; තබන ලෙසට කළ, තබන සේ සැලැස්වූ; තොස, තුෂ්ටවූ; නිළිණෙන්, ත්‍යාගය කරණ කොට ගෙනැ; මනමිණි-සිතු-සුරබිදේනු-කළ බසදිසි, චින්තාමණි-චිත්‍රපාටලි-කාමධෙනු-කාලාබ්භ්‍රතුල්‍යවූ; ලෝබිරාජගජඅංකුස, මත්සරීනරෙශ්වරස්වරූපහස්තීනට අකුස් සක් වැනිවූ; පැරකුම්බුජබූපති, පරාක්‍රමභුජභූපතිය! (තො); දින, සකලාරාතිදමනය කර ෴

75. විරුසිරි, ශෞර්‍ය්‍යවිශිෂ්ටශ්‍රීය; සිපා, ස්පර්ශ කොට; තුති කියවන, (තමාගේ) වර්ණනාව කරවන්නාවූ; වීර, ශූරවූ ශත්‍රු නමැති; තුල, පුළුනට; දනඤ්ජයා, වහ්නිතුල්‍යවූ; සඳ, ශශාංකයා; ලප නැති කැරූ, ලාංඡන නැත්තා කොට; කොඳ, මාඝ්‍යපුෂ්පයන්; තුඳ කැරූ, විකාශ කොට; සොඳ, කමනීයවූ; යස ලත්, කීර්ති ලද්දාවූ; රණඤ්ජයා, (කෘතජය රජහු පිත්) රණජය රජහු වැනිවූ නොහොත් යුද්ධජය ඇති; ඔපවැසි, කාන්තියෙන් අධිකවූ; රුව, රූපශ්‍රිය විසින්; මදනසදිසි, සමරසදෘශවූ; [විතරණතන හසඤ්ජයා, විතරණස්තනහංසජය;] විතරණතන, දානලක්ෂණ මේඝය කරණ කොට ගෙනැ; හසඤ්ජයා, නිර්ලෝභිනෘපතීන් නොහොත් තිසරුන් පැරදූවූ; දනුරුවේද, ධනුර්වේදයට; දනඤ්ජයා, ("සර්වාන් ජනපදාන් ජිත්වා විත්තමාශ්‍රිත්‍ය කේවලම්, මධ්‍යෙ ධනස්‍ය තිෂ්ඨාමි, තෙනාහුර්මාං ධනඤ්ජයම්"—ඉත්‍යුක්ත නිරුක්තීන් යුක්තවූ ධනඤ්ජයාපරනාමධෙයඇති) අර්ජුන රජහු වැනිවූ; අප පැරකුම්නරනිඳු, අසමත්පරාක්‍රමබාහුමනුජේශ්වරය! (තෝ); දින, සකලාරාතිවිධ්වංසනය කර ෴

76. විමල, පරිශුද්ධවූ; උබයරිවිකුල, (ජනකජනනීන් සම්බන්ධිය) උභයපක්ෂයෙහි සූර්‍ය්‍යවංශයට; මිණි, රුවනක් වැනිවූ නොහොත් ශ්‍රේෂ්ඨවූ; අකිලබුවන, නිඛිලභූලෝකයට; රාජරාජ, අධිරාජවූ; උදුලලකුණු, උජ්වලිත ලක්ෂණ ඇති (හෙවත්—"දීර්ඝාඃ ශුෂ්කා විශාලාස්‍යා යෙ භවන්ති තුරඞ්ගමාඃ, තෙ ශස්තාඃ පාර්ථිවෙන්ද්‍රස්‍ය යානවාහනකර්මණි"—යනාදීන් නිර්දිෂ්ට අශ්වලක්ෂණයෙන් බබලන්නාවූ); ගරුඩවේග, ගුරුළුවන්ගේ වේගයට බඳු වේග ඇති; හයාරෝහ, අශ්වාරෝහයෙහි; නකුලරාජ, (අශ්වශාස්ත්‍රාචාර්‍ය්‍ය) නකුලරජහු වැනිවූ; සකලකලාවල්ලභගුණ, සකලකලාවන්ට වල්ලභගුණ ඇති නොහොත් චන්ද්‍රයා සේ සෞම්‍ය ගුණ ඇති; සාහිත්‍යසත, සාහිත්‍ය (අලංකාර) ශාස්ත්‍රයට; බෝජරාජ, මහාරාජාධිරාජ ශ්‍රීභෝජදේවව්‍යාජවූ; ගජාරෝහ, හස්ත්‍යාරෝහයට; වංගරාජ, වඟුරජුවැනිවූ; පබැඳ විකුම්, ප්‍රබලවික්‍රම ඇති; පැරකුම්රජ, පරාක්‍රමබාහුනරාධිපය!; 'දින' යනු අනුසන්ධාන කරනු ෴

77. පැනය කියන, ප්‍රශ්නකථනය කරන (කල්හිදු); විසඳන කලැ, (ප්‍රශ්න) විසර්ජනය කරන කල්හි (දු); මිලිඳුනිරිඳුසදිසි, මිලෙන්ද්‍රරාජතුල්‍යවූ; වාද, හස්සප්පවාද ඇති; විනයසුතබිදම්, තෙවළාබුදුවදන්හි ද; සසමය, ෂඩ්විධසමයඥනයෙහි ද; තකුසත, තර්කශාස්ත්‍රයෙහි ද; දිඞ්නාගපාද, පූජ්‍යපාදදිඞ්නාගාචාර්‍ය්‍ය

යන් වැනිවූ; සනයවිකුම්, පෘෂ්ඨස්ථිතබල හා වික්‍රම ඇති; කිඳුරු, චන්ද්‍රකින්නරයන්ගේ නාද බඳු; මදුරුනාද, මධුරස්වර ඇති; විනය, විනීතභාවයෙන්, හික්මීමෙන්, ඉන්ද්‍රියවිජයෙන්; විනූත, පතළාවූ; වසුමතිපති, අන්‍යරාජයන්ගෙ; මව්ළිමාල, මකුටමාල්‍ය පඞ්ක්තියෙන් ('කඩාමල්කඩිනෑ' යු සේ යි); සුරබිපාද, සුගන්ධිත චරණ ඇති; පැරකුම්බානිරිඳු, පරාක්‍රමබාහුමනුජේශ්වරය!; 'දින' යනු අනුසන්ධාන කරනු ෴

78. සහදෙව් ලෙස, (දිවාක නම් රජහු පිත් සහදෙව නම් රජහු සේ, නොහොත් ජරාසන්ධයා පිත්) සහදෙවයා සේ; කාග පත, අශිපත්‍රය; ගෙනැ, ආදෘනය කොට; රණමැඳ, යුද්ධමධ්‍ය යෙහි (සංග්‍රාමයෙහි; පාඨාන්තරවිසින්: යුද වැදූ, යුධාංගණ ප්‍රවෙශ වැ); කිසි බිත නොවන, කිඤ්චිද්භීතියක් නො වන්නාවූ; [කිඤ්චිත් ශබ්ද අල්පාර්ථයෙහියැ.] පිළිමල්රජකල්පුල්කමල්විලට, ප්‍රතිමල්ලරාජකාන්තාලක්ෂණප්‍රඵුල්ලොත්පලසරසියට; තුහිනපාත, නිහාරපාතයක් වැනිවූ, පිනිවැටුමක් වැනිවූ; රනමිණිමුතුපට්ට වස්ත්‍රවිතරණගුණපාරිජාත,—රන, හිරණ්‍යයැ; මිණි, මාණික්‍ය යැ; මුතු, මෞක්තිකයැ; පට්ටවස්ත්‍ර, පටපිළියැ යන මේ වස්තූන් සම්බන්ධවූ; විතරණගුණ, පරිත්‍යාගයට; පාරිජාත, කල්පද්‍රැමවූ; දසරතරමකුලබිජාත, දශරථරාමකුලාභිජාතවූ නොහොත් දශ රථයාහට අභිරාමවූ (සූර්‍ය්‍ය) වංශයෙහි උපන්; පැරකුම්බාහු නිරිඳු, පරාක්‍රමභුජමනුජේශ්වරය! (නො); දින, අරාතිවර්ගභෙද කර ෴

79. අප මුනිරද, ගෞතමගොත්‍රසම්භූත ශාක්‍යසිංහ සුගත තථාගත සද්ධර්මවරචක්‍රවර්ත්තිස්වාමීන්වහන්සේවිසින්; වදහළ ලෙස, දෙශිත නියායෙන්; තිපිටකතෙපල, සූත්‍රාභිධර්මවින යොක්තීන්; පාට කළ, වනපොත් කළාවූ; කළුබඳ, කෘෂ්ණවර්ණ දෙහ ඇති; ['කලබඳ'යි—සමහර පොතෙකැ පැනෙන (දන්ත්‍ය) ලකාරමධ්‍යපාඨවිසින්: මනොඥවූ ගාත්‍ර ඇති;) තුඟු, උස්වූ; ගිජිඳුන් ලා, හස්තිරාජයන් හැර, (හස්තිසෙනා ලවා); බිඳි, භග්න කරනලද; කන්නඩිපුර, (රාමනාථය පටන් ශ්‍රීරංගය අන්ත කොට ඇති කර්ණාටදෙශයෙහි වූ) කර්ණාටරාජධානියෙහි; කපාට, දොරකවු ඇති; මූකර, දෙඩමලුවූ; වයිරිරාජකුල, ශත්‍රැ රාජකුලයහට; විපාට, බාණයක් වැනිවූ; හේමපාට, රන්වන්වූ; මනනඳමිණිබරණලකළ, චිත්තාහ්ලාදජනකරත්නාභරණයෙන් අලංකෘතවූ; පැරකුම්රජ, පරාක්‍රමබාහුනරදෙවය! (නො); රණදරණි, සංග්‍රාමභූමියෙහි; වගු බිඳ, සතුරන්ගේ වර්ගභෙදය

හෝ සහායපක්‍ෂභේදය කර ෴ නොහොත් 'භිදා'යි පෙර කිරියවිසින් ගෙන, ශත්‍රුවන්'භේදය කොට'යි අර්ථ කියා 'දිත' යනු අනුසන්ධාන කටයුතු ෴

80. ගුණකරුණාකර, (ශීලාදි) ගුණයට හා (පරදුඃඛාසහන ලක්‍ෂණ) කරුණාවට උත්පත්තිස්ථානවූ; සරණාගතසතසිවිරජ දේව, පිහිට සොයා තමා සමීපයට පැමිණි සත්‍වයනට සිවිමහ රජහු වැනිවූ; රණ, සංයුගයෙහි ලා, අසුරන්, දානවයන්; මැඩ, අභිභවා; ජයගත්, ජයග්‍රහණය කළාවූ; බාහුදේව, (නෛෂධා පරනාමධෙය ඇති) නළරජහුගෙ; කුලයෙන්, අන්‍වයෙන්; ආ, පැමිණියාවූ; සැපතින්, සම්පත් කාරණ කොට ගෙන; මිත්රජ දේව, මත්ස්‍යරාජදෙවයා හෙවත් විරාටරජහු වැනිවූ; අණසක් විති, ආඥාචක්‍රවර්ත්තිවූ; වාසල මේ වන්, ආස්ථානකාර්‍ය්‍යසම්පාදනය සඳහා හෙවත් රජකිස පිණිස පිවිසි; පැරකුම්බාහුදේව, පරාක්‍රමබාහුදෙවය! (තෝ); නැණබල පෑ, ප්‍රඥශක්තිය ප්‍රකාශ කොට; සැපසේ ඉඳු, සුවසථයෙන් වාසය කර ෴

81. මෙදෙන්, යෞවනාදිය කාරණ කොට ගෙන; යුද වන්, සටනට පැමිණි; අන්රදුන්, පරරාජ නමැති; රඹරන් තැළුම්, රම්භාරණ්‍යතාඩනයට; මදමත්ගජේන්ද්‍රනි, මෙදෙන් මත් ඇතකු වැනිවූ; පුන්සඳින්, පූර්ණචන්ද්‍රයා කෙරෙන්; බට, අවතීර්ණවූ; සඳකැන් ලෙසින්, ජ්‍යොත්ස්නාව්‍යාජයෙන් යුත්; පුන්යසින්, අනූනවූ කීර්ත්තිය හෝ පරිවාරසම්පත් කාරණ කොට ගෙන; රඝුරම්රජේන්ද්‍රනි, රඝුරාජ-රාමරාජයන් වැනිවූ; ළඳුන්, යොෂිතුන්ගෙ; නෙත, ඇසට; රසඳුන්, රසාජන වැනිවූ; රන්කඳින් කළ මෙන් රුවින්, සුවර්ණස්කන්ධයෙන් කරතලද්දක් වැනිවූ හෙවත් රන්පිළිමයක් වැනිවූ රූපසෞන්දර්‍ය්‍යය කාරණ කොට ගෙන; මින්දජේන්ද්‍රනි, මීනකේතනයා වැනිවූ; පින්, පුණ්‍ය ලක්‍ෂණයෙන් උපලක්‍ෂිතවූ (එහෙයින්); උතුම්, ප්‍රවරවූ; පැරකුම් රජේන්ද්‍රනි, පරාක්‍රමබාහු නරවීරය! (තෝ); නන්සිරින් විඳ, නානෛශ්වර්‍ය්‍යයන් අනුභව කෙරෙමින්; මන්තොසින්, චිත්ත සන්තුෂ්ටියෙන් යුක්ත වැ; ඉඳු, දිවසාතික්‍රමණය කර ෴

82. පෑ විකුම් බල කුම්බකන් බිඳි රම්උවම්, දක්වනලද ශෞර්‍ය්‍යාතිශය හා කායශක්ත්‍යාදිය ඇතියා (රවුළා මල්) කුම්භකර්ණයා භජනය කළ ශ්‍රීරාමයා වැනිවූ; යුදජයදජේන්ද්‍රනි, ප්‍රවිදාරණයෙහි ජයධ්වජ ඇති නොහොත් අභිසම්පාතයෙහි ජය කෙතුවක් වැනිවූ; කම්තරම් දැන, කර්ම්ප්‍රමාණාවගමනය කොට (රාජකාර්‍ය්‍ය පිළිබඳවූ එ එ කටයුත්තට සුදුසුනියායෙන්); බානු

හම් කැරැ, ආසූර්‍ය්‍යස්ථායී කොට; නම් ද, උපාධිනාමයනුදු; ගම්, ග්‍රාමවරයනුදු; දෙන, ප්‍රදානය කරන්නාවූ; (එහෙයින්;) මනුරජ ණෙනි, මනුරජහු වැනිවූ; රම්, ලක්‍ෂ්මියගෙ; කමල්තනයුග, පද්මකුඞ්මලාකාරකුචයුග්මයෙහි; ලූ, ගල්වනලද; කොකුම්, කුංකුමපංකයාගෙ; නිවැකුම්, අනාලිප්තභාවය; ඇකුම්කළ, ආක්‍රමණය කළාවූ; (පද්මාවතියගේ පද්මකුඞ්මලාකෘතිවූ පයොධර යුගලයෙහි කුංකුමපංකාවලෙපය කළාවූ යනු භාවයි.) බුජ ණෙනි, අත්ඇති; ලෝරැකුම්, ජගද්‍රක්‍ෂණයෙහි; පැරැකුම්, ශෞර්‍ය්‍යයිවූ; උතුම්, උත්කෘෂ්ටවූ; පැරැකුම් නමින්, 'පරාක්‍රම' යන නාමයෙන් උපලක්‍ෂිතවූ; මහරජණෙනි, මහාරාජයන්වහන්සේ! (තො); දින, පරාභිභවනය කර ෴

83. මත්සරා, මත්තාංගනාවන්විසින්; කරගත්, අත්හි ගන්නා ලද; සරා ලෙස නෙත්සරා යුතු, ක්‍රීඩාපද්මතුල්‍යනෙත්‍රලක්‍ෂණ බාණයෙන් යුක්තවූ; රූසරාණෙනි, රූපසාරවූ නොහොත් මතඟනන් අත්හි ගත් කෙළිපියුම් වැනි නෙත් නමැති පියුම් ඇති රූපසම්පත් නමැති විල්ඇති; සත්සරා, සත්වසාරවූ; [පත් සරා' යන පාඨවිසින්: ප්‍රාප්තවූ ශරත්සමය ඇති;] සඳ, චන්ද්‍රයෑ; නත්, අනන්තයෑ; හරා, මෙහෙසුරුයෑ නොහොත් මුතුවැළයෑ යන මෙ කී මංගලවස්තුතුල්‍ය වූ; දිගුබිත්සරා, දිග්භිත්තිලක්‍ෂණ තඩාගයෙහි; දිසී, දෘශ්‍යමානවූ; කිත්සරාණෙනි, කීර්ත්තිලක්‍ෂණ පුණ්ඩරීක ඇති; අත් පුරා, (තමන්ගේ) හස්තපූරණය කොට; යදිසිත් පුරා, යාචකයන්ගේ චිත්තපූරණය කොට; දෙන, වස්තු පරිත්‍යාග කරන්නාවූ; කැත්සරා, ක්‍ෂත්‍රියශ්‍රෙෂ්ඨවූ; ['කැත්සුරා' යන පාඨයෙහි: රාජශූරවූ නොහොත් රාජදෙවවූ 'රාජොත්තමවූ' යනුයි.] ලක්සරාණෙනි, ලංකාවට (ලංකාද්වීපවාස්තව්‍යජන යනට) ශ්‍රෙෂ්ඨවූ; පැරැකුම්සරාණෙනි, පරාක්‍රමබාහුනරවීරයාණෙනි! (තො); උරාතලමුත්හරාලෙස, වක්‍ෂඃස්ථලයෙහි අමුක්තවූ මුක්තාහාරයක් මෙන්; සත්, සාධූන්කෙරෙහි නොහොත් සකල සත්වයා කෙරෙහි; මෙත් පුරා, මෛත්‍රී පූරණය කොට, මෙත් සිත් වඩමින්; ඉදු, වාසය කර ෴

84. පත්මඅත්කුල, සූර්‍ය්‍යවංශයෙහිවූ; කැත්, නරෙශ්වර නමැති; දිමුත්, දීප්තිමත්වූ; හර, මුක්තාහාරයට; පත්, ප්‍රාප්තවූ; පද, පැහැපත්වූ ඉහවත් ප්‍රභායෙන් යුක්තවූ; අත්, මනොඥවූ; වරරත්නවත් ශ්‍රෙෂ්ඨමාණික්‍යයක් වැනිවූ; තම, ස්වීයවූ; රත්නෙ නත්, රක්තවූ නෙත්‍රයුග්මය ද; දිගුඅත්දෙකත්, ආජානුලම්බී බාහුයුගලය ද; පැහැපත්, නෙත්කලු වර්ණයෙන් යුත්; ගතත්,

ශරීරය ද යන මෙතෙක් අංගප්‍රත්‍යංගයන් කරණ කොට ගෙනැ; සිත්තමසෙ, චිත්‍රකර්මයක් පරිද්දෙන්; යගපත්, හද්‍වූ; පත්මවිත් වත, පද්මාකෘතිවක්ත්‍ර ඇති නොහොත් ලක්ෂ්මීවාසවක්ත්‍ර ඇති; පත්, ප්‍රාප්තවූ; මහත්සිරි, විපුලෛශ්වර්‍ය්‍යයෙන් යුක්තවූ; පසත්, ප්‍රශස්තවූ; පැරකුම්රජුත්තම, පරාක්‍රමබාහුරාජෝත්තමය! (තො); නිත්ත මැ, අතුරු නැති වැ මෙ; සිත්සැපත්, චිත්තසෞඛ්‍යය ද වශබද්ධීයෙන් දෙහසෞඛ්‍යය ද; ලැබැ, ලබ්ධ වැ; සත්, ලෝ වැස්සනට; තොස්, සංහ්ලාදය; [පාඨාන්තරවිසින්: සෙත්, ශාන්තිය;] අත් කැරැ, ළඟා කෙරෙමින් නොහොත් හස්තප්‍රාප්ත කෙරෙමින් හෝ අයැති කොරෙමින්; සිත්මිනෙව්, චින්තා මාණික්‍යයක් මෙන්; පවතින්නැ, සමෝතකම්යෙන් වැඩෙති ---

85. මූදසේ, සාගරය මෙන් ගැඹුරුවූ; නැණ, නුවණැති; සුර දිපගුරු සේ, ගීෂපතිහු මෙන්; වේදයෙන්, වෙදය කරණ කොට ගෙනැ; වාදයෙන්, (විචාරාත්මකවාග්භෙදවූ) වාදකථායෙන්; දිනු, පරවාදීන් පැරදවූ; යෝදසේ, වසුදෙවාදීන්ට මෙන්; බල, කායශක්ත්‍යාදිය ඇති; නොහොත්: යෝදසේ, යුධයෙහි දක්ෂවූ; නොහොත්: සේ යෝද, දක්ෂයොධවූ; බල, සේනාබල ඇති; වීර, ශෞර්‍ය්‍යයුක්තවූ; වික්මැති, (පරාභිභවනලක්ෂණ) වික්‍රම ඇත්තාවූ; දීරවූ ගුණ, අකම්ප්‍යවූ ගුණය කරණ කොට ගෙනැ; බූදරාදිප, නගාධිරාජතුල්‍යවූ; සාදනූ තිරිඳුන්, අහිත රජුන්ගෙ; මුඳුන්, මස්තකයෙහි; දුන්, දෙනලද ('පිහිටුවනලද' යනුයි); පාදයුත්, චරණයුගලයෙන් යුක්තවූ; අනුරාපුරාදිප, අනුරාධපුරා ධිපතිවූ; [අනුරාධපුරය වූ කල ලංකාරාජ්‍යයට අන්තර්භූතයැ, පෞරාණික අග්‍රරාජධානියයැ, දක්ෂිණශාඛාමහාබොධිරත්නමා ලිකාමහාචෛත්‍යාදිසිඬ්ඪස්ථානශතයෙන් ප්‍රතිමණ්ඩිතයැ, එහෙ යින් තදධිපත්‍යය කියනලදි.] නොහොත්: අනුරාපුර, අනුරාග පූරකවූ නොහොත් අත්‍යන්තප්‍රීතියට හෝ සෙනහයට ගෘහයක් වැනිවූ නොහොත් අනුරූපවූ රාගයන්ගේ අවිච්ඡේදයෙන් යුත් ක්‍රියාකාරණය ඇති; අදිප, ස්වාමිවූ; පැරකුම්නරාදිප, පරාක්‍රම භූජාභිධානමනුජාධිපතිය! (තො); යසගීනාද, යශොගීතනාදය; ලෝ, ලොකයෙහි; පුරා, අනූන කොට; සැපසේ ඉඳින්, සප්‍රාප්තවූ පරිද්දෙන්(ස්වභාවයෙන්)වාසය කර ---

86. අංගමංගජ, ශරීරාවයවයන්හි ජනිතවූ; මංගලෙන්, මංගල ලක්ෂණයෙන්; වැඩි, පරිපූර්ණවූ; බිංගමෙන්, භ්‍රමරයකු සෙයින්; මුනි, ශාස්තෘහුගෙ; පාකමල්වට, අංඝ්‍රිපද්මය පිරිවැටූ; කාවිබන්

දනන්ගට, කාව්‍යබන්ධනය කළ - ජනයනට; ඉංගකින්, ඉංගිත මාත්‍රයකින්; අංගතුංගමතංගජන්, උස්වූ දෙහ ඇති මත්ත හස්තින්; දෙන, (පාරිතොෂිකධන කොට) දෙන්නාවූ; අංග, අඟුරටයැ; වංග, වඟුරටයැ; කාලිංග, කාලිඟුරටයැ; හිංගුල, හිංගුල රටයැ; කොංගණෙන්, කොංකණරටයැ යන මෙ කී දෙශයෙහි නිෂ්පන්නාවූ භාෂායෙන්; පැවැසූ, ප්‍රකාශිතවූ; යසින්, යශස්වර්ණනායෙන්; යුක්තවූ; තුට, මනාපවූ; සිරිසංගබෝපැරකුම්රජුන් හට, ශ්‍රීසංඝබොධි ශ්‍රීපරාක්‍රමබාහුරාජොත්තමයාහට; අංගසංග, රාජ්‍යාංගසමූහ තෙමෙ; වළංග වෙන්, වශග වේවා ෴

87. ඈස්සහස්සිරි, සක්සැපත්බඳුසැපතට; නිවෙස්ලෙස්, නිවාස සදෘශවූ; තුරැරැස්, ජ්‍යොතිඃෂොමයසේ (ප්‍රමාණාතික්‍රාන්තවූ); පාබලපිරිස්, පාබලසේනා හා; යසස් ඇති, පරිවාර සම්පත් ඇති; දෙස්වෙසෙස්, ප්‍රදෙශවිශෙෂයන් හෙවත් ග්‍රාමවරයන් හා; දූසිදස්, දෘශිදෘශයන් ද; ගවස්, ගොශෙඛවයන් ද; තිස්සපස්සුබරණරැස්, චතුෂ්ෂෂ්ටිසංඛ්‍යාත ආභරණරාශිය ද; නිති, අනුදිනයෙහි; දෙන, පරිත්‍යාග කරනුවූ; නිදෙස් වස්, නිර්දොෂවූ වංශ ඇති හෙවත් පරිශුඬවූ උභයකුලඇති; කිවිහස්ත, කවීන්ගේ හස්තයට; පත, පැමිණියාවූ; හස්, මුද්‍රාතුල්‍යවූ; නොහොත්: කිවිහස්ත, කවින්ගේ හස්තයෙහි; අහස්පත, ආකාශපත්‍රයක් වැනිවූ; විස්මබස් පැවැසුම්, ආශ්චර්‍යවූ වාක් කථනයෙහි; සරස්වති, භාරතිය වැනිවූ; තොස්, තුෂ්ටියෙන්; උසස්, උදග්‍රවූ; පැරකුම්ගජස්පති, පරාක්‍රමබාහුරාජොත්තම තෙමෙ; රස්සහස්, සහස්‍රකිරණයාවිසින්; දෙන, පමුණුවනලබන්නාවූ; රස්, චණ්ඩාතපය; නිදෙස් කෙළෙ, නිර්දොෂ කෙළේ ෴ (පැරැකුම්බාරජ තෙමෙ තමාගෙ තෙජස කාරණ කොට ගෙනැ හිරැහු නිස්තෙජස්ක කෙළේ' යනු භාවයි ෴

['තිස්සපස්සුබරණරැස්' යන තැන්හි 'තිස්' යන්නෙන් ත්‍රිදශකයක් ද (30+) 'සපස්' යන්නෙන් ෂට්පංචකයක් හෙවත් තිසක් ද (30+) 'සු' යන්නෙන් සතරක් ද (4) ගෙනැ මෙ හැම මුළු කළ කලැ (=64) සැටසතර ගැණේ] ෴

88 අගරජහිමිපැරකුම්බානරපවර, අග්‍රරාජෙශ්වරපරාක්‍රමබාහුනරොත්තම්යාගෙ; තෙදපතර, තෙජස්සමූහය; දිග, දිශානුදිශායෙහි; සක්වළහිම්, චක්‍රවාලපර්‍යන්තය අවධි කොට; පැලැඹෙන, විජෘම්භිත වන කල්හි; දිවයුරැතිසර, සූර්‍ය නමැති හංස තෙමෙ; වනගබ, සන්ධ්‍යාවලාහකයාගෙ; ළඟ, සමීපයෙහි; වෙවුලා,

කම්පිත වැ; අරණ, පරිභ්‍රමණය වන්නාවූ; සමුද්‍රවතුර, සමුද්‍ර ජලෞඝ ඇති; වලබදහ, වඩබාමුඛ නමැති ගිනි; සැඟැවිණි, නිලීන වී ෴

මෙසේ හෝ අර්ථ කියයුතු :—

අගරජහිමි, අග්‍රරාජේශ්වරවූ; පැරකුම්බානරපවර, පරාක්‍රමභුජනරෝත්තමයාගෙ; තෙදපතර, තේජඃප්‍රසරය; සක්වළහිම්, චක්‍රවාලපර්‍ය්‍යන්තය සීමා කොට ඇති; දිග, දිශානුදිශායෙහි; පැලැඹෙන, පැතිරැ පවත්නාකල්හි; දිවයුරැනිසර, දිවසකර නමැති නිසර තෙමෙ; (දහ, දග්ධ වැ; සිහිල්ගුණය විදිනු සඳහා); වන ගබ, මෙඝයාගෙ; ළඟ, සමීපයෙහි (සිටැ); වෙවුලා, කම්පිත වෙයි. වළබ, වඩබා (හෙවත් ඡායා නම්වූ සූර්‍ය්‍යභාර්‍ය්‍යා තොමෝ); දහ, දග්ධ වැ; අරණ, භ්‍රමත්වූ; සමුද්‍රවතුර, සමුද්‍රජලෞඝයෙහි; සැඟවිණි, නිලීන වූ ෴

89. විදි, මහබඹ තෙමෙ; පැරකුම්දෙරණිඳුරැපරසිඳුතෙද යසස, පරාක්‍රමබාහුධරණීශ්වරයාගේ ප්‍රසිද්ධවූ තේජස හා යශස; මතරම්, සිත්කලුවූ; තියුණුනැණ, තීක්ෂ්ණනුවණින්; රැගෙනැ, ග්‍රහණය කොට; නොතරම්, අප්‍රමේයත්වය හෙවත් පමණ නො කළැකි බව ද; සහරසිලිලාර, සියුසයුරෙහි; පැන්රැස, ජලස්කන්ධය; දෙහොතින්, හස්තසම්පුටයෙන්; ඉසැ, උකහාගෙනැ; තරම්, ප්‍රමේයත්වය හෙවත් පමණ කළ හැකි බව ද; දනි, අවගමනය කෙළේයැ යනු; වියතුන්, කවීන්විසින්; කියන, කථනය කරන්නාවූ; බස, තෙපුලි ෴

90. ලෙව්නුවන්, ලෝවැස්සන්ගේ ඇසට; නඳ දෙන, තුෂ්ටි දනෘවූ; නවසඳකලාවන්, නූතනචන්ද්‍රකලාකෘතිවූ; දෙන, පරිත්‍යාග කරනු ලබන්නාවූ; තිළිණෙන්, තුෂ්ටිප්‍රාභෘතය කරණ කොට ගෙනැ; සියුදිව්වැසිවලාවන්, චාතුර්විපකජලධරකූටාය මානවූ; මුනිබණ, බෞද්ධශාස්ත්‍ර නමැති; කෙසරතෙල්යුතු, කෙශරි තෛලය යොදනලද; රනමලාවන්, හෙමභාජනතුල්‍යවූ; මෙ හිමි, මේ (භූපති) ස්වාමි තෙමෙ; ලොවැ, ලොකයෙහි විද්‍යමානවූ; සුසැටකලාවන්, චතුෂ්ෂෂ්ටිකලාවන්; දැනැගනී, උද්ග්‍රහණය කෙළේසි ෴

91. අරුණුසරණතල, ඊෂද්‍රක්තවර්ණපාදතල ඇති; ගජවන් ගමන්යුතු, ඇතුන්ගේ ගමන් වැනි ගමනින් යුක්තවූ; කමල්කල් වුවන්,—කමල්, පද්මතුල්‍යවූ; කල්, (එහෙයින්) මනොඥවූ; වුවන්, මුහුණු ඇති; නොහොත් : කමල්, කමලාදෙවියට හෙවත්

ලක්ෂ්මියට; කල්, මනොඥවූ; විවත්, මුහුණු ඇති; රසපියබස් නුමූතු, රසයෙන් අමූක්තවූ මනා තෙපුල් ඇති හෙවත් මධුර ප්‍රියාලාපයෙන් යුක්තවූ; වදුරවිතුවණ, වජ්‍රායුධයාට බඳු ඥාණ ඇති; සොමිගුණ, චන්‍ද්‍රයාට මෙන් සෞම්‍යගුණ ඇති; දිමුතු, (මහද්‍රාජතෙජසින්) දීප්තිමත්වූ; මෙ නිරිඳු, මේ නරෙන්‍ද්‍ර තෙමෙ (කොවැනි වී ද? යතහොත් :); සව්දෙව්, සියලුදෙවියන්ගෙ; රුසිරි, රූපශ්‍රිය; අමුතු, අමුක්ත කොට; එකතැන, එකස්ථාන යෙහි; මැවුවැති, නිර්මාණය කළාක් වැති (වී)

92. හෙ සඳ, භවත් චන්‍ද්‍රය!; මුහුද! කිමැ, (එම්බා) සමුද්‍රය! කිම් ද?; වෙලතැ, (හෙ සඳ! තා) ජීමූතගර්භයෙහි; සැඟැවෙනු කිමැ, තිලින වන්නේ කිම් ද?; මෙ, (එම්බා මුහුද!) අභිමුඛ වන්නිවූ; ගජහයඅතින්, හස්ත්‍යශ්වයන් හෙතු කොට ගෙනැ; දිමුත, විරාජමානවූ; පැරකුම්රජ, පරාක්‍රමභුජභූභුජ තෙමෙ; ගිජිඳුන්, උතුම් උතුම් ඇතුන්; දෙයි, දානවිෂයෙහි පමුණුවයි; (එහෙයින් මම්, මචාහතවූ මෙ ගජරජහු දූ දූන හොත් නපුරු යි සිතා මුහු හැරගෙනැ වලහගබ මූවහ වෙමි යනු සෙස්සයි;) ඔහු, (හෙ සඳ!) එ රජහු; මඳහස කැර ලවත, සමිත කරත වේලායෙහි; තදුන් ඝාලුම් සොමිගුණයුතු පඬුරු, භවත්හුවිසින් දෙනලද සෞම්‍යගුණයෙන් සංගතවූ ප්‍රාභාරූප ප්‍රභෘතය තෙමෙ; ඇත, විද්‍යමාන වෙයි නොහොත් සැහෙයි (එහෙයින් හෙ තෙමෙ මචාහතවූ ගජරජහු දත් දෙනු සඳහා නො ගනියි, නො නො සැඟැවෙහි යනුදු සෙස්සයි)

93. රදසොසරිඳුපැරකුම්නිරිඳුඋදයග, රාජෙන්‍ද්‍රප්‍රවරපරාක්‍රම භුජනරාධිපරූපලොකාලොකාචලයෙහි; මුතුලැල්හරු සමඟ, මුක්තාලතිකාලක්ෂණතාරකාවන් හා එක් වැ; බඳ, බද්ධවූ; සේ සත්සඳ, ධවලාතපත්‍රලක්ෂණචන්‍ද්‍රයා; වැඳැ, අභිවාදනය කොරෙමින්; පැදුම්දිගැ, පශ්චිමදික්හි; ඉඳිනා, නිෂණ්ණ වන්නාවූ; හැමනිරිඳුන්, සකල (සාමන්ත) ක්ෂිතීන්‍ද්‍රයන් සම්බන්ධිවූ; සොඳ, මනකල්වූ; කරතල, හස්තතලයන්ගේ ද; සියපත්, ශතපත්‍රයන් ගේ ද; හැකිළුම, සංකොචය තෙමෙ; එකරඟ, එකාකාර වී

94. ලකිසුරුසුරත, ලංකෙශ්වරයාගේ දක්ෂහස්තයෙහි; ලෙළෙ, ලීලොපෙතවූ; කගපත්වලාකුලේ, අශිපත්‍රලක්ෂණමෙඝකූටය; වෙළේ, වෙලාතටයෙහි; පැළදිගින්, ප්‍රාචීදිශායෙන්; නිරතුරු, අතුරු නැති වැ; නැඟෙන, උද්ගත වන්නාවූ; එවිගස, එකෙණෙහි; අමිතුරුනිරිඳුඅඟනන්, ශත්‍රුරාජවනිතාවන්ගෙ; කොමළ,

සියුමැලිවූ; උරතලේ, වක්ෂඃස්ථලලක්ෂණතඩාගයෙහි; පියොවුරු නිසර, ස්තනලක්ෂණහංසයුග්ම තෙමෙ; මුතුහරණෙළුඹුදෑළි, මුක්තාවලීලක්ෂණමෘණාලතාලය; හලේ, ගළයේසි ෴

95. උතුරුදිස, උදීචියෙහි (පිහිටියාවූ); හිමසෙලැ, හිමවත් පර්වතයෙහි, (හිමවත්පර්වතසමීපයෙහි, හිමවත්පර්වතප්‍රාන්තයෙහියැ යූ සේ); ඇත්සිහරජ, හස්තිරාජයන් හා සිංහරාජයන්; දෑකැ, දර්ශනය කොට; එහි, එ හිමවුපවුයෙහි, සිදහන, සිඬවනිතාවෝ; වෙන වෙන, පෘථක් පෘථක් වැ; මේ ලෙස, මෙසෙයින් (වක්ෂ්‍යමානාකාරයෙන්); ගාත, ගායනා කෙරෙත්; (කිසෙති යත් ?) පැරකුම්රජුට, පරාක්‍රමභුජභූභර්තෘහට; සරිතිරිදෙක්, සමානවූ රජෙක්; තිලෝකුසැ, ත්‍රිභුවනොදරයෙහි (විද්‍යමානවන්නේ නම් හෙ තෙමෙ); දපණපස, කැටතෙලෙහි; පිළිබිඹු පත්, ප්‍රතිබිම්බිතවූ; ඔහු රුව මැ යි, තදීය රූපය මැ යි හෙවත් පැරකුම්බාමහරජහුගෙ ප්‍රතිමූර්තිය මැයි ෴

96. තිවට, බ්‍රහ්මයාවිසින්; මෙර, ස්වර්ණාචලය; පත්හිදව, පර්ණසූචිය හෙවත් කර්තනිය කොට; හැරගෙනැ, ග්‍රහණය කොට; මෙ, අදූරස්ථවූ; නිරිඳු, (පරාක්‍රමභුජ) මනුජේශ්වරයාගෙ; අනත, අනන්තරහිතවූ; ගුණතැණ, දයාදාක්ෂිණ්‍යාදිය හා ප්‍රඥාපාටවය; ලියූ, ලියනලද; ගුවනතල්පත, ගගනලක්ෂණලේඛ්‍යපත්‍රය; සයුරතෙලියොත, සාගරලක්ෂණතෛලපාත්‍රියෙහි; කළු මැදැ, මෂීකල්කාවලිප්ත කොටගෙනැ; අනත, නාරජහු; පවසත, තෙපලතුදු; කිසි අඩු නො වෙයි, කිඤ්චිදූනත්වයෙක් නො වෙයි හෙවත් පරිසමාප්තියට නො යෙයි; [කිඤ්චිත්ශබ්ද අල්පාර්ථයෙහියැ ] එ වනත, එ (පැරකුම්බාරජහුගෙ එබඳුවූ ගුණානුවර්ණ) වර්ණනා කරත් හොත්; සො වියත, (අන්‍යවූ) කවර කවිවරයෙක්; සමත, සමර්ථ වේ ද ? (නො වේ) මැ යී සේ යි) ෴

97. මිහිපල්, පොළෝ රක්නාවූ; පැරකුම්රජමිණි, පරාක්‍රමබාහුරාජෝත්තමයාගෙ; රනොවිල්ගුණ, හිරණ්මයදෛලතායන්ත්‍රතුල්‍යවූ ගුණය; සවන පැමිණි, ශ්‍රවණපථප්‍රාප්තවූ, (ඇසූ); පිළියැණිතිරිඳුන්, ප්‍රත්‍යර්ණිකමනුජාධිපතීන් සම්බන්ධිවූ; ළදකල්, තරුණස්ත්‍රීන්ගෙ; සවනින්, කර්ණයෙන්; නිලුපුල්, (කර්ණාවතංසවූ) නීලොත්පල තෙමෙ; [ජාත්‍යපෙක්ෂායෙහි එකවචනයි.] ගිලිහිණි, වැටිණි ෴

98. මෙ රජුගෙ, මේ (පරාක්‍රාන්තභුජ) වසුධාධිපතිහුගෙ; කග, ඛඩ්ගය; සිලිල් පොවන, සලිලාවගාහ කරත් මැ; රුපඹුව, ශත්‍රැ

වනිතාජනයාගෙ; නෙත, නේත්‍රයෙන්; සිලිල්, බාෂ්පජලය; වගලෙ, වැගිරිණි; එසාග, පූර්වොක්ත ඛඩ්ගය; 'මෙ'යනු නිපාතයි; සුරතින්, දක්‍ෂහස්තයෙන්; ලෙළවන, ලෙළවන කල්හි; සුරඹුව, දිව්‍යවනිතාජනයාගෙ; වම්නෙත, දක්‍ෂිණෙතරනෙත්‍ර තෙමෙ; ලෙළ දුනි, සසල් වී, පොපිගති ෴

[අතිශයශොකයක්හුගේ සම්ප්‍රාප්තියට පූර්වභාගයෙහි අකාරණයේ හාස්‍ය ඇතිවීමෙන් ඔබ්බෙහි කඳුලු වැගිරම ධර්මතායෑ, එසේ මැ සදර්ථසිද්ධියට පූර්වභාගයෙහි පුරුෂයන්ගේ දක්‍ෂනෙත්‍ර චලනය ද ස්ත්‍රීන්ගේ වාමනෙත්‍රචලනය ද ධර්මතා යි ෴ පැරැකුම්බාරජහුගෙ කඩුපතර පණ පොවනු සඳහා ගින්නෙහි බහා රත් කොට ගෙනැ නැවතැ දියෙහි ඔබනසඳ සතුරඟනන් නෙතින් කඳුලු වැහෙයි, හෙ පැරැකුම්බාරජහු සංග්‍රාමභූමිගත වන බවට පූර්වනිමිත්තයෑ. එ රජහු එ මෙ කඩුව දකුණතින් ලෙළවන කලැ දෙවඟනන්ගේ වාමනෙත්‍රචලනය වෙයි, හෙ වනාහි සතුරඟනන්ගේ වල්ලභ රජුන් සංග්‍රාමයෙහි පතිත වැ ස්වර්ගතවන බවට පූර්වනිමිත්තයි] ෴

99. සිරිසරසවි සහ පුරුදු, ලක්‍ෂ්මී වාග්විලාසිනී දෙදනා හා පරිචය ඇත්තාවූ; සිරිපැරැකුම් මෙ නරනිඳු, ශ්‍රී පරාක්‍රමබාහු නම් අභිධාන ඇති මේ ක්‍ෂිතීන්ද්‍රයාගෙ; යසගී, යශොගීතීන්; අසමින්, ශ්‍රවණය කෙරෙමින්; සුරිඳු, ශක්‍ර තෙමෙ; නත, (සහස්‍රවක්ත්‍රධාරිවූ) අනන්තයා හා; උවිඳු, (අනන්තයා ශයනාසන කොට හෝනා) වේන්හු; සඳහන් කෙළෙ, සඞ්ඛ්‍යාන කෙළේ හෙවත් ස්මරණය කෙළේ යි ෴

100. පැරැකුම්නිරිඳුසඳ, පරාක්‍රාන්තභුජනරෙන්ද්‍රචන්ද්‍රයාගෙ; මනනඳ, මනොනන්දනවූ; රූසිරි, රූපශ්‍රිය; බලන, අවලොකනය කරන්නට; ඇමසඳ, සර්වකාලයෙහි; සියලඟ, සකලශරීරයෙහි; නිසල, ඇසිපිය නො හෙන්නාවූ; සොඳ, පස්පැදිස්නා; නුවන් ඊ නම්; ඇස් ඇති වී නම්; යෙහෙකි, මැනැවි ෴

101. සවන්තැටියෙන්, ශ්‍රවණලක්‍ෂණචෂකයෙන්; බොන, පානය කරන් හොත්; මොහු, මේ පරාක්‍රාන්තභුජභූභර්තෘහුගෙ; පියබස්අමා, ප්‍රියාලාපපීයූෂ තෙමෙ; ඇත, විද්‍යමාන වෙයි; සැහෙයි; සුරෙ, ඉන්ද්‍රොපෙන්ද්‍රප්‍රභෘතිහු; රනමෙරමන, ස්වර්ණමෙරුමන්ථය; බමා, භ්‍රමණය කොට; සයුරන, සමුද්‍රොදරය, කුමට, කුමක් පිණිස; ඇලෑළු දූ, ආලොළන කළාහු දූ? ෴

102. පිනිඳිය (…න් පෙරගත්තාලද) එතම් සුරභිජලය; නොහොත්: පිනි, තුෂාරය; දිය, ප්‍රසන්නශීතෝදකය (කිමැඩි දෑ?); සඳුන්රස, චන්දනද්‍රවය; [පාඨාන්තරයිසින්: සඳුන්රුස, චන්දනනිවය;] (කිමැඩි දෑ?) මුතුහර, මුක්තාහාරය (කිමැඩි දෑ?); සඳ්රස, චන්ද්‍රරශ්මිය; කුමට, කිමැඩි දෑ? පැරැකුම්රජ, පරාක්‍රමබාහුනරෙශ්වරයාගෙ; වෙසෙස, විශිෂ්ටවූ; සිරිපාසෙවණැ, ශ්‍රීපාදච්ඡායායෙහි; සිහිලස, ශෛත්‍යය; පවති, පවත්නෙයැ ..

103. සුරලොවට, දෙව්ලෙව්හි; ඉසුරු ද, ආධිපත්‍යය ද; මුළුරට, සකලරාෂ්ට්‍රයෙහි ('චතුර්ද්වීපයෙහියැ' යු සේ යි); සක්විති සැපත්, සාර්වභෞමසම්පත්තිය ද; තුට, ඉෂ්ටවූ; නිවන්සුව, නිර්වෘති සුඛය ද; ලද, ලද්දේ නමුදු; මෙ රජ, මේ පරාක්‍රමබාහුනරදෙවයාගෙ; බැල්මට, ඞ්ලොකනයට; සදිසි වේ දෑ, සමාන වේ දෑ? නො වේ මැ යි සේ යි) ..

104. නුවණ, ඥානය කරණ කොට ගෙනැ; සුරගුරුබඳු, බෘහස්පතිසදෘශවූ; සොමි ගුණයෙන්, සෞම්‍යවූ ගුණය කරණ කොට ගෙනැ; සඳුසදිසි, චන්ද්‍රතුල්‍යවූ; සැපතින්, සම්පත් කරණ කොට ගෙනැ; සුරිඳුසරි, සුරෙන්ද්‍රප්‍රතිභාගවූ; මෙ නිරිඳු, මේ මනුජෙන්ද්‍රයා; සීනෙන්, ස්වප්නයෙන්; දුටත්, දර්ශනය කළත්; වැඩෙකි, අර්ථයෙක් (වන්නේ මැ)යි ..

105. සත්අත, ඡත්‍රපාණිය හෙවත් බ්‍රහ්මයැ; සිරිපති, ශ්‍රීවල්ලභයැ හෙවත් විෂ්ණුයැ; දිනිඳු, දිවසපතියැ හෙවත් සූර්‍ය්‍යයැ; තියම්බා, ත්‍ර්‍යම්බකයැ හෙවත් මහෙශ්වරයැ; වත්අත, ගණෙශ්වරයැ; සිරි, ලක්ෂ්මීයැ; සඳ, චන්ද්‍රයැ යන; මෙ සුරකදම්බා, මේ දෙවගණයො; දුනුකුම්බා, ධනුකුම්භමාසයන්හි; මත පත්, මූදුන් පැමිණියාවූ, උද්ගතවූ; ගන, ප්‍රද්‍යුම්නයාගෙ; සිරි, ශොභාව; ඉසිලි, උද්වහනය කරන්නාවූ; පැරැකුම්බා නිරිඳුට, පරාක්‍රමබාහුනරෙන්ද්‍රයාහට; සෙතසිරි, කාමක්‍රොධාදිවිජයශ්‍රිය; නොහොත්: සෙත, ශාන්තිය හා; සිරි, (අපරිමෙයවූ) සම්පත්තිය; නොහොත්: අසිරි සෙත, ආශ්චර්‍ය්‍යවූ, අපූර්වූ සම්පත්තිය; දෙත්, ප්‍රදානය කෙරෙත් ('පමුණුවත්වා' යනු යි) ..

106 තෙවිකුම්විකුමෙන්, ත්‍රිවික්‍රමයාගේ වික්‍රමය බඳු වික්‍රමයෙන් යුක්ත වැ; රණදෙරණා, සංග්‍රාමභූමියට; බැසැ, ප්‍රයාණය කොට; නො නැකුම් කළ, සම්භාවනා නො කරනලද; රුපු, සතුරන් ඇති; නිසරණසරණා, අනිකෙතජනයනට ආවසථයක්

වැනිවූ; සුරකුම් කළ ලොව, සුළඳ්ජු ගොපිත ලොකයා ඇති; තිසරණාබරණා, බුත්සරණ දහම්සරණ සඟසරණ නමැති ආභරණ ඇති නොහොත් තුන්සරණය නො බිඳැ රක්නාවූ නොහොත් ශරණත්‍රයාගේ සංරක්ෂණානුෂ්ඨානය ඇති; අසරණසරණා, අනාථනාථවූ; පැරකුම්රජ, ශ්‍රීසංඝබොධි ශ්‍රීපරාක්‍රමබාහුනර නාථය! (තො); දින, සතුරන් පරදව ෴

107. අප පැරකුම්රජ, අසමත්පරාක්‍රමබාහුමහිපාලයාගෙ; යස, කිත්තිය; නිති, අතුරු නැති වැ; පැලඹෙන, විජෘම්භමාන වන කල්හි; උරහර, (සපිවෙණිධාරිවූ) මහෙශ්වරයාගෙ; 'නිල්ගෙලෙ' යන නම, ('නීලකණ්ඨය' යන අර්ථ ඇති) 'නිල්ගෙලෙ' යන නාමය තෙමෙ; නො පවති, පවත්නේ නො වෙයි; හිමකර, තුහිනකිරණ තෙමෙ; නිකැළැල, නිෂ්කලඞ්ක වෙයි හෙවත් කලංකවිරහිත වෙයි; සජ්කුලපතිපති, ශ්‍රීකෘෂ්ණ; රුපුනරපති මෙන්, (වෙස් වළා යන) සතුරුරජකු මෙන්; කිතයුගසිරි, සත්‍ය යුගයාගේ ශොභාව; ගති, ග්‍රහණය කෙලේ ෴

108. පුවතර, ප්‍රසිඬවූ; රම්බාවිරිදුතරම්බා, ශක්‍රප්‍රතිභාගභාග්‍ය ඇති; මනහර, හෘදයඞ්ගමවූ; රම්බාපතිපිළිබිම්බා, නලකුවර ප්‍රතිමවූ; සිරිරම්බා, ශ්‍රීරාමයාට බඳු බාහු ඇති; පැරකුම්බාරජ, පරාක්‍රමභුජ-අවනීශ්වරය! (තො); යසහර, කීර්තිහාරය; දිගු නම්බා, දිග්වනිතාවන්ගෙ; උර, වක්ෂස්හි; ලම්බා, අවලම්බනය කොට ('පලඳවා' යනුයි); දින, සඡෝතකම්යෙන් පවතු ෴

109. රුපු බිඳුමට, (හෙ ද හෙ ද) ශත්‍රුභඤ්ජනය පිණිස; පිහිට වැ, ආධාර වැ; සිවි, සපිතවූ; සඳරා, (රුධිරලිප්තත්වයෙන්) සන්ධ්‍යා ඝනප්‍රභාප්‍රණිහප්‍රභා ඇති නොහොත් ඡන්දරාග ඇති (හෙවත් තමා කෙරෙහි ඇලුම් ඇති); රුදු, චර්මකොෂාවනද්ධවූ නොහොත් සන්නාහසන්නද්ධවූ හෝ (ශත්‍රූන්ගේ) ගතිරෙධකවූ; උදුගුණ, (හෙ ද හෙ ද) ඍජුගුණ ඇති; දිනවන, (හෙ ද හෙ ද) ජයග්‍රහණය කරවන්නාවූ; යසපතරා, (හෙ ද හෙ ද) යශඃප්‍රසාර ඇති; වැස සිදු කැරු, (හෙ ද හෙ ද) අභිසිඬිය කෙරෙමින්; අත්, හස්තය; නො හැරා, වර්ජිත නො කොට; නො හොත් : අත් නො හැරා, තමා කෙරෙන් ත්‍යක්ත නො කොට; සෙවුනා, (හෙ ද හෙ ද) සෙවනය කරන්නාවූ; මෙතිරිඳුකග, මේ නරෙශ්වරයාගේ ඛඞ්ගය තෙමෙ; අගමැතිඳකු අයුරා, අග්‍රමන්ත්‍රීන්ද්‍රයකුගේ ආකාර ඇත්තේයි ෴

110. මුනිසරණ, භගවත්හුගේ ශ්‍රීපාද නමැති; නඹරමීපා, නාමරසමධුව පානය කරන්නාවූ; මීපා, බමරකු වැනි; පුවතරා

ප්‍රථිතවූ; සිරිලක්දීපාදීපා, ශ්‍රීලංකාද්වීපාධිපතිවූ; නොහොත්: සිරිලක්දීපා, ශ්‍රීයුක්ත ලංකාද්වීපයට; දීපා, ප්‍රදීපයක් වැනිවූ; කම සරදෙව්දු සරූපා, කාමචාරීදෙවේන්ද්‍රස්වරූපවූ නොහොත් අනංගස්වරූපවූ; රූපා, (අභිරාමවූ) දේහ ඇති; පැරකුම්බුජ බූපාබූපා, පරාක්‍රමභුජරාජරාජය! (තො); දින, සන්තොෂයෙන් වැඩෙහි ෴

['මුනිපදනඹරසමීපාමීපා' යන ප්‍රථමපාදපාඨාන්තරයෙහි අර්ථ—'මුනිපද, බුදුහුගේ පාද නමැති; තඹර සමීපා, තාමරස සමීපස්ථවූ; නොහොත්: තඹුරස-මීපා, පද්මමධුපායීවූ; මීපා, බමරකු වැනි' යනුයි] ෴

111. ඝනසරයුරුයසකිරණා, ඝනසාරාකාරවූ හෙවත් කර්පූර තුල්‍යවූ යශඃප්‍රභායෙන්; කිරණා, ක්ෂීරාර්ණවය වැනිවූ; වෙනතර පතිමතවරණා, විවෙෂිතරම්භ නමැති මත්තහස්තින්ගේ; වරණා, නිෂෙධය ඇති; මනහර, චිත්තහාරීවූ; විරුසිරිසරණා, වීරලක්ෂණ ලක්ෂ්මියගේ ස්වරණය ඇති නොහොත් වීරලක්ෂණලක්ෂ්මියට පිහිටවූ; සරණා, චරණ ඇති; පැරකුම්නරවරණාවරණා, පරාක්‍රමබාහුරාජෝත්තමය! (තො); දින, සම්භාරාතිභජනය කර ෴

112. යසසැති, පරිවාරසම්පත් ඇත්තාවූ; දියනෙත, ජගන්නෙත්‍රවූ; පැරකුම්නිරිඳුගෙ, පරාක්‍රමබාහුමහරජහුගෙ; සසල, චචලභාවය තෙමෙ; ඇසිපියැ, අක්ෂිපක්ෂ්මයෙහි ඇත්තෙයැ; වක් බැව්, වංකභාවය තෙමෙ; රත, අනුරක්තවූ; බැමයුග, භ්‍රෑයුග්මයෙහි ඇත්තෙයැ; නිසනේහස, නිඃස්නෙහාධ්‍යාශය තෙමෙ; දීමෙහි, දානවිෂයෙහි; සසලා, (ඉංගිතඥාපනය සඳහා) චලනය කොට; රුඳු, රජනය කළාවූ; මුදු, මොළොක්වූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තවූ; බැමයුග, භ්‍රෑයුග්මයෙහි හෙවත් භ්‍රෑභංගියෙහි; ඇත, ඇත්තෙයැ; වෙන, (අක්ෂිපක්ෂ්ම-භ්‍රෑයුග්ම-භ්‍රෑභංගියෙහි මුත් මින් පිටත්) අන්තැනෙක්හි; නැත, (පූර්වොක්ත චාපල්‍ය වඞ්කභාවනිඃස්නෙහාධ්‍යාශයතා) නැති. පරාක්‍රමබාහුමහරජාණන්ගේ චිත්තසන්තානයෙහි චපලතා වඞ්කතා නිෂ්කාරුණිකතා නැතැ යි සේසි ෴

113. කිරිසිඳු, ක්ෂීරසාගරය; අගනිසි, කුම්භජමුනිහු; එකැදිලියෙන්, එකාජලියෙන්, (එක් මෙ හස්තසම්පුටයෙන්); ගත්වර, ගෘහීතාවස්ථායෙහි; වියැළුණු කල, ශුෂ්කවූ කල්හි; සිරිසඳු, ශ්‍රී කාන්තාව; තම, ඔහුගේ, කුම්භජමුනිහුගෙ; සුලැඟිලිනියැතුළට, කනිෂ්ඨිකානඛරකුහරයට; පිවිසැ, වැද; සැඟැවුණු කලැ,

නිලිතවූ කල්හි; පරසිදු, ප්‍රසිඬවූ; පැරකුම්නිරිඳුගෙ, පරාක්‍රම බාහු මනුජාධිපතිහුගෙ; පිරිසුදු, නිම්ලවූ; තොගොත්: පිරි, පරිපූර්‍ණවූ; සුදු, ශුභ්‍රවර්‍ණවූ; යසසට, කීර්ත්තියට; සරි කොට, සඹාන කොට; උවමක්, උපමාවක්; පවසනුයෙ, ප්‍රකාශ කරන්නෙ; කිකලැ, කවරකලෙක්හි ද? කිසික්ලෙකත් පැරකුම්බාමහරජ හුගෙ යසසට සරිවූ උවමක් පැවැසියැ නො හෙ යී සේ යි ෴

114. තිදසිඳු, ශක්‍ර තෙමෙ; පෙරදිගුපති, ඉන්‍ද්‍රදිගට අධිපතියැ; රද, පරාක්‍රම්බාහුභූපතීෘ තෙමෙ; ඉඳුරැපැදුමැසියුදිගුපති, ප්‍රාක් ප්‍රතිච්ප්‍රභෘතිචතුර්දිශාවට අධිපතියැ; ඔහුට, ශක්‍රයහට (ඇත්තෙ); එරවණ නම් ඇතෙකි, ("ශ්වෙතදන්තශ්චතුර්භිස්තු මහාකාය ස්තතඃ පරම්, ඓරාවණො මහානාගො'භවවජ්‍රභෘතා ධෘතඃ" යි කියනලද ලක්‍ෂණයෙන් යුත්) ඓරාවණ නම්වූ එක් මැ එක් හස්තියෙකි;—මෙරජුට, මේ (පරාක්‍රමබාහු) නරෙන්ද්‍රයහට; ගජ සෙනඟෙක් ඇති; ("දීඝාඞ්ගුලිරක්තපුෂ්කරාඃ සජලාම්භොදනි නාද වෘංහිණඃ, වෘහදායතවෘත්තකන්ධරා ධන්‍යා භූමිපතෙර්‍ම් තඞ්ගජාඃ" යි කියනලද මඞ්ගලලක්‍ෂණොපෙත) හස්ති සමූහයෙක් ඇත්තෙයැ; එසුරිඳු, ඒ ශක්‍ර තෙමෙ; පෙරසුරරණ, අසුරසංග්‍රාම යෙහි; දිනී, ජය ගති;—මෙ නිරිඳු, මේ නරෙන්ද්‍ර තෙමෙ; සුරරණ, ශූරසංග්‍රාමයෙහි; ජය ගති, ජයග්‍රහණය කොළේයැ; ('ශක්‍ර තෙමෙ පූර්වයෙහි ශූරසංග්‍රාමයෙහි දිනී, පැරකුම්බාමහරජ තෙමෙ අසුර යන්විසිනුදු නොදිනියැහැකි දෙවියන්ගේ යුදෙහි පවා දිනී'යනු ධ්වනියි); සුරරජ, ශක්‍ර තෙමෙ; මෙ හැමින්, උක්තප්‍රකාරවූ සියල් ලෙන්; අප පැරකුම්නරනිඳුහට, අසමත්පරාක්‍රමබාහුනරෙන්ද්‍රය හට; සරි නැති, අසමාන වි ෴

115. අල්පදෙයක්, (විපුලවස්තුවක් මිස) මඳවූ වස්තුවක්; නො දෙ මැ යි යන, දානවිෂයෙහි නො පමුණුවා මැ යි කියන් නාවූ; තුතිගොස, ස්තුතිඝොෂය; දියතුරැ, භුවනකුහරයෙහි; පළ කළ, ප්‍රකාශ කළාවූ; සිල්පනිපුණ, ධනුර්විද්‍යාදියෙහි දක්‍ෂවූ; පැරකුම්රජ, පරාක්‍රමබාහු නරෙන්ද්‍රයා පිළිබඳවූ; රජසැපතට රාජ්‍යසම්පත්තියට; පැමිණෙනතුරැ, (තමන්) පත්වන තෙක්; කල්පතුරු යි, කල්පද්‍රැමයැ යි; පසිදු, ලෝවැස්සන්විසින් දන්නා ලද; මඳුරු, (දෙවියන්ගෙ) මන්‍දාරවෘක්‍ෂයැ; පරසතු, (දෙවියන් ගෙ) පාරිච්ඡත්‍රකවෘක්‍ෂයැ; සිතු, (අසුරයන්ගෙ) චිත්‍රපාටලිවෘක්‍ෂයැ යන මෙ කි; සුරතුරැ, දිව්‍යවෘක්‍ෂයො; තිරතුරැ, අතුරු නැති වැ; ලෙව්සත, සුරලෝවැසි අසුරලෝවැසි ජනයන්; තුටු කැරු, ආහ්ලාද ජනවමින්; කල් පසු කැරු, කාලාතික්‍රමණයකොට; සිටිති, සපිත වෙති යි; සිතෙයි, හැගේ ෴

116. මැගිය, හවත් පථිකය!; ඛිඝග, තෙප්ලව; එනු, (තා) එන්නේ; කොහි සිට, කොතැන්හි සිටැලා දූ?; දද, පින්වත් බමුණ! (මම); සමනොළ, සුමනකූටයට; ගොසිනා, ප්‍රයාණය කොට; ('එම්' යනු අධ්‍යාහෘතව්‍යයි); නො ය, (එම්බා මැගිය!) යාත්‍රා නො කර ('මඳවේලාවක් නවතුව' යනුයි); එදිගැ, ඒ (සමනොළ) දිශායෙහි; අමුතු, අභිනව වාර්තාවන්; කිය, කථනය කර; බමුණ, හවද් භූදෙවය!; සුමනසුරිඳුවූසිනා, සමන්දෙව් රජහුවිසින්; දෙදහස්පන්සිය, (අප තිලෝගුරු සම්මාසම්බුදුරජාණන්වහන්සේගේ පිරිනිවීමෙන් මතු 2500) පච්විංශති ශතවර්ෂයක්; ගිය කලැ, ගතවූ කල්හි; දියතා, ලෝකනායකවූ; රජෙක්, නරදෙවෝත්තම කෙනෙක්; එතැයි, ලොවැ පහළ වෙතැයි කියතලදි; [උත්තමාර්ථයෙහි බහුවචනයි.] තන්වැසිය, ස්ථානොචිතවාක් ඇත්තව!; එ නම්, එ කි නම් රජෙක් දූ? යි; කිය, කථනය කර; මෙදිනා, (බමුණාණෙනි! හෙ තෙමෙ) මෙකල්හි; පැරකුම්රජ විය, (අපගේ) පරාක්‍රමබාහුනරේන්ද්‍ර වෙයි ෴

117. මතඟනැඟුමට, ගජාරොහයට; වසුදෙව්සදිසි, යාදවරාජසදෘශය. සියලුදුනුසිප්, (ශරවෙධිවාලවෙධිප්‍රභෘති) සකලධනුශ්ශිල්පයට; දෙණැදුරුමය, ද්‍රොණාචාර්යසදෘශය. තුරඟනැඟුමට, අශ්වාරොහයට; නකුලරද, චතුර්ථපාණ්ඩව නකුලරාජසදෘශය. කගසිපට, ඛඞ්ග ශිල්පයට; සහදෙව්, (මාද්‍රීපුත්‍රපාණ්ඩවවිශෙෂ) සහදෙවරාජසදෘශය; සියුසැටසිපට සමඟ, චතුඃෂෂ්ටිකලාඥනය හා; විකුමට, ශත්‍රුසංහාරයට; පරසුරාමය, භාර්ගවසදෘශය. යොවුන් රුසිරට, යෞවනයෙන් නිපන් රුචිරත්වයට; රම්සුරාමය, ශ්‍රීරාමෙශ්වරසදෘශය. මෙරඟ, උක්තප්‍රකාර සියල්ලට; සරි කොට, සමාන වැ; පසිඳු, ප්‍රකාශියෙන් සිඩවූ, පරිනිෂ්පන්නවූ; නිරිඳෙක්, නරේන්ද්‍රයෙක්; මෙකලැ, වත්මනුයෙහි; පැරකුම්ලකිසුරාමයැ, පරාක්‍රමබාහුලඞ්කෙශ්වරමැයි—'පරාක්‍රමබාහුලංකෙශ්වරයාණන් විනා උක්තප්‍රකාරගුණයෙන් යුත් අන්‍යමනුජාධිපයෙක් මෙකල්හි නැතැ'යි සේ යි ෴

118. පවර, උතුම්වූ; පැරකුම්බාහුබූපා, පරාක්‍රමභුජභූපතිහු; මෙලක්දීපා, මේ (සකල) සිංහලදෙශයෙහි; විත්තබෙරී, ප්‍රසිඩභෙරී හා; විජයදළහන්, එනම් තූර්යවිශෙෂය (ගස්වමින්); සක්, විජයශංඛය; පුම්බමින්, ධමනය කරවමින්; පතාපා, (කොශදණ්ඩජනතෙජස්සංඛ්‍යාත) ප්‍රතාපය; දක්වා, ප්‍රකාශ කරමින්; තිත්තවේරීරජුන්, තිබ්බවෛරීනරෙන්ද්‍රයන්ගෙ; සිතැ, චිත්තයෙහි; බිය ගන්වමින්, භයොත්පාදනය කරවමින්; මත්ත, හෘෂ්ටවූ හෝ මදයුක්තවූ; හාරී, මනොඥවූ; තුරඟ, අසු (පිට);

නැඟිලෙස, ආරූඪවූ ආකාරය (කොසේ දැ යත හොත්:) පෙර, පූර්වයෙහි (වූ); සන්තතානීතුරඟනැඟි, නවයොවුන්, ළදවියෙහි සිටි (අතිතලුනවූ); මන්මදසරූපා, මන්මථස්වරූප වියැ හෙවත් සමරසදෘශ වී.

119. සබඳදෙරණගතදූරුමෙහි,—සබඳ, ස්වබන්ධුයෑ; දෙරණි, ධරණියෑ හෙවත් පෘථිවියෑ; ගත, මෙසයෑ යත මොවුන්ගෙ; දූරුමෙහි, ධාරණයෙහි හෙවත් උචගනයෙහි; නතපණිපති පුරන්දරු,—නත, ශ්‍රීකෘෂ්ණයෑ හෙවත් විෂ්ණුයෑ; පණිපති, අනන්ත නම් නාරජයෑ; පුරන්දරු, ශක්‍රයෑ යත මොවුන් වැනිවූ; සරදසමය උදිතනිමලහිමකරයසැති,—සරදසමය, ශරත්කාල යෙහි; උදිත, උද්ගතවූ; නිමල, නිර්මලවූ; හිමකර, චන්ද්‍රයා වැනි; යසැති, යශස් ඇති; සුන්දරු, මනොඥවූ; සමදවසිරිරාජසමර ජලනිදිමතනමන්දරු,—සමද, සගර්වූ; වසිරිරාජ, සතුරුරජුන් සම්බන්ධිවූ; සමර, සංග්‍රාම නමැති; ජලනිදිමතන, සමුද්‍රමථන යෙහි; මන්දරු, මන්දරපර්වතය වැනිවූ; මුනිපුදපුරන්දරු,—මුනි පුද, බුඩපූජයෙහි; පුරන්දරු, ශක්‍රදෙවෙන්ද්‍රතුල්‍යවූ; අප වර, අපගෙ ස්වාමිවූ; පැරකුම්බුජරජ, පරාක්‍රමබාහුනරෙන්ද්‍රතමය! (තො); සැර දෙ, චිරකාලයක් ජීවත්ව, පවතු.

120. පිරිවරගජහයරියමහසෙන් ගෙනැ, හස්ත්‍යශ්වරථමහා සෛන්‍යපරිවාරග්‍රහණය කොට; රණමුක, සම්කාභිමුඛයෙහි; අබීත, අභිරුකවූ; දිරිතර, අතිශයධෛර්‍ය්‍යී හා; බුජබල, බාහුබල ඇති; විරිදුන්, විරෝධීන්, සතුරන්; විනීතවිලසින්, විනීතයන් මෙන් (තමාවිසින් හික්මවනලදුවන් සෙයින්); ජය ගත්, පරාජය කළාවූ ('තමා වශගයට පැමිණවූ' යැ යු සේ යි); සිරි, පද්මාවති යට; කරතලතඹර, (තමාගේ) හස්තතල නමැති පද්මය; නිවෙස් කළ, නිකෙතන කළාවූ; දිනකරකුලඹිජත, දිවසකරවංශාභි ජාතවූ; පට්ටවස්ත්‍රපාරිජාත, (චීනකාශ්මීරාදිදෙශයෙහි සජාත-ක්ෂෞමකෞෂෙයාදි) පටපිළි දීමෙහි කප්රුකක් වැනිවූ; සිරිබර, ඓශ්වර්‍ය්‍යභාර ඇති; පැරකුම්රජ, පරාක්‍රමබාහුමහීනාථය! (තො); දින, ආධ්‍යාත්මිකබාහ්‍යසංඛ්‍යාතසකලශත්‍රූන් අභිභව නය කර.

121. කව්, ශ්‍රව්‍යකාව්‍ය හා; නළු, දෘශ්‍යකාව්‍ය හා; අවිසිප්, ආයුධ ශිල්ප හා; සකල්කලා, චතුෂ්ෂෂ්ටිකලාවන් සම්බන්ධිවූ; විබාග, නිර්ණය; වෙන වෙන, පෘථක් පෘථක් වැ; දැනැ, අවගමනය කොට; කිවිදන, කවිජනයාගෙ; මන, චිත්තයෙහි; දන, ධනය හෙවත් ස්නෙහය; [ධනං ස්නෙහපාත්‍රමිති ශබ්දරත්නාවලී.] දනවන,

උපදවන්නාවූ; කනකදන, ස්වර්ණපරිත්‍යාගයෙහි; කාලමේඝ, කාලාබ්‍රතුල්‍යවූ; අනවරණතැඟ, (දුගීමැගියාචකාදීන් විෂයෙහි පවත්වන්නාවූ) අනාවරණවිතරණ ඇති හෙවත් නො වැළැක්වියැ හැකි ත්‍යාගසම්පත් ඇති; තැනැ තැනැ, තන්හි තන්හි; පූර්ණධරණී, සමෘද්ධභූමියෙහිලා; මුකර, දෙඩමලුවූ; වසිරිරජකමල නාග, ශත්‍රුරාජලක්ෂ්මීපද්මයනට හස්තිතුල්‍යවූ; දිනකරකුල පැරකුම්බුජරජ, සූර්‍ය්‍යවංශ්‍යපරාක්‍රමභුජනරාධිපතිය! (තො); දින, ශත්‍රුමර්ථනය කර ෴

122. විහිගුම්—යසින්,—විහිඟුම්, විශීර්ණවූ; රජනිකරකිරණ, චන්ද්‍රමරීචීන් යුක්තවූ; ඛිරණ, අමෘතසාගරයාගෙ; තරඟ, රළ පතර හා; ගගනගංග, ආකාශනදීජලය සේ; මනරම්, සහෘදය හෘදයානන්දකරවූ; නිජයසින්, ස්වකීර්ත්තිය කාරණ කොට ගෙනැ; අලු කළ, බබුළුවනලද; සිරිලක, ශ්‍රීලංකා ඇති; රිවිකුලෙනි, සහස්‍රාංශුවංශික ක්ෂත්‍රියජනයා අතුරෙන්; තුංග, උසස්වූ, උතුම්වූ; පැරකුම්බුජබල, ශත්‍රූන්ගේ ආක්‍රමණයට යොග්‍යවූ බාහුබල ඇති; විකුමැති, වික්‍රමාන්විතවූ; යුවතිනයනරුසිතරංග,—යුවති, යෞවනස්ත්‍රීන්ගෙ; නයන, නෙත්‍රයට; රුසිතර, අතිශයරුචිවූ; ඉතා රිසිවූ; අංග, ශරීරසම්පත් ඇති; නොහොත්: යුවති, කාන්තාවන්ගෙ; නයනරුසි, නෙත්‍රාභිරාමවූ; තර, ප්‍රභායෙන් යුක්තවූ ('ලාවණ්‍යසම්පත් ඇතියැ' යනුයි); අංග, දෙහඇති; නොහොත්: තර, ස්ථිරවූ හෝ බලසම්පන්නවූ හෙවත් ශක්තිමත්වූ; අංග, විග්‍රහ ඇති; පරරාජවේශ්‍යාබුජංග, අන්‍යරාජලක්ෂ්මීගණිකාවිෂයෙහි ජාරතුල්‍යවූ; නොහොත්: "පරරාජවෙශ්‍යාභුජංග" යන විරුදනාම ඇති; නොහොත්: පරරාජ, සතුරුරජුන් පිළිබඳවූ; වේශ්‍යා, වරඟනනට; බුජංග, උපපතිවූ; පැරකුම්බුජරජ, පරාක්‍රමබාහුනරොත්තමය! (තො); දින, ශත්‍රුවිජය කර ෴

123. වැරසැර, වීරසාරවූ; රම්බුජවිකුමැති, ශ්‍රීරාමයනට බඳු බාහුවික්‍රම ඇති; සාද නො වන, සුහෘත් නො වන්නාවූ; පරනිරිඳුන්, අන්‍යනරෙන්ද්‍රයන්ගෙ; සිර, ශීර්ෂය; සැරහුම් කළ, සජ්ජීකෘතවූ; මිණිමුතුනඹරසදිසි, ප්‍රබුද්ධපද්මතුල්‍යවූ; සුරබිපාද, සුගන්ධවත්චරණ ඇති; සුරපුර, දිව්‍යනගරය; හිමි කැර, අවධි කොට; පුවතර, ප්‍රසිද්ධවූ; සිරිසර, ශ්‍රීසාරවූ; තුතිගීතනාද, තියුගීනද ඇති; නවමිණිවිතරණවිනෝද,. මුක්තා-මාණික්‍ය-වෛදූර්‍ය්‍ය-ගොමෙද-වජ්‍ර-විද්‍රුම-පද්මරාග-මරකත-නීලරත්න දානයෙහි සන්තුෂ්ටවූ; වර, ස්වාමිවූ; පැරකුම්බුජරජ, පරාක්‍රමබාහුනරෙශ්වරය! (තො); දින, දිග්විජය කර ෴

124. රම්බා, රමණයාට බඳු, භාග්‍ය ඇති නොහොත් රමණයාට බඳු බාහු ඇති නොහොත් ලක්‍ෂ්මීවාසබාහු ඇති; පුරහරගිරිකිරිසිඳුහිමයසස්හාර, කෛලාශාමෘතසාගරතුෂාරසංකාශකීර්ත්‍යාභාරය; දසදිගඟන, දශදිග්වධූන්ගෙ; උර, වක්‍ෂස්හි; ලම්බා, අවලම්බනය කොට (පලඳවා); උදර, මහත්වූ; විතරණින්, ත්‍යාගසම්පත්තිය කාරණ කොට ගෙනැ; මනමිණි, චින්තාමණිතුල්‍යවූ; ජගත්, ලෙව්හි; පුවත්‍ථරවර, පූජිතරත්නමවූ, උතුමන් අතුරෙන් ඉතා උතුම්වූ; වීර, අකම්ප්‍යවූ; අබිනවමදනාවතාර, විතීයවාරෙ තපනානසංකල්පයෝත්‍යවතාරවූ; ධීර, ස්වාමිවූ; පැරැකුම්බානරනිඳු, පරාක්‍රමබාහුනරේන්ද්‍රය! (තො); දිත, සන්තෝෂකම්යෙන් වැඩෙහි ෴

126. ඉඳුනිල්රුවනින්, (ශීර්‍ෂයෙහි) ඉන්ද්‍රනීලරත්නයෙන්; දිලි, ජ්වලිතවූ; රන්කිරුළින්, ස්වර්‍ණකිරීටයෙන් ද; දෙසවන්, කර්‍ණයුග්මයෙහි; සුලඹෙ, සම්‍යගවලම්බමානවූ නොහොත් සම්‍යක්කාන්තවූ; කොඬොලින්, කුණ්ඩලාභරණයෙන් ද; උර, වක්‍ෂස්හි; මල්යුවළින්, පුෂ්පමාලායෙන් හා මණිමාලායෙන් ද; ගෙලෙ, ග්‍රීවායෙහි; රන්ලකරින්, ස්වර්‍ණාලංකාරයෙන් ද; බුජ, බාහුවයෙහි; සසොබේ, ශොභාසහිතවූ; මින්වලයෙන්, මණිකංකණයෙන් ද; මුතුදැල්, (ශ්‍රොණියෙහි) මුක්තාජාලාකුලවූ; මෙවුලින්, රසනාදමයෙන් ද; දහ, ජංඝායුගලයෙහි; මින්පතරින්, මණිප්‍රස්තරයෙන් ද; පදපංකජ, චරණපද්මවන්වයෙහි; රන්සලඹෙ, හෙමනූපුරයෙන් දැසි; මෙ සියල්බරණින්, කියනලද සර්‍වාභරණයෙන්; පැරැකුම්රජ, පරාක්‍රමබාහුනරනායක තෙමෙ; දැන්, මෙකල්හි; ලක, රත්නවීපයෙහි; සක්රජුමෙන්, ශක්‍රදෙවරාජවිලාසයෙන්, වැජැඹෙ, විජෘම්භමාන වෙ ෴

127. හිමරසින්, තුහිනකිරණයා කාරණ කොට ගෙනැ; කිරිසිඳුලෙසින්, ක්‍ෂීරාර්‍ණවයමෙන් (තමා කාරණ කොට ගෙනැ); දිලි, ජ්වලිතවූ; කුලවිසින්, කුලය කාරණ කොට ගෙනැ; මිණිදීපනේ, මණිප්‍රදීපයක් වැනිවූ; කලුන්, කාන්තාවන්ගෙ; ඇසින්, චක්‍ෂුස කාරණ කොට ගෙනැ; රසඳුන්ලෙසින්, රසාජනතුල්‍යවූ; පන්සරවෙසින්, පඤ්චබාණවෙශයෙන් යුක්තවූ හෙවත් අනංගතුල්‍යවූ; තුනුරුපනේ, සුන්දරදෙහ ඇති! ('වාමෙක්‍ෂණාවන්ගේ ඉන්ද්‍රනීලරත්නතුල්‍යනෙත්‍රකාන්තිසම්ණයෙන් නීලවර්‍ණ වැ බබළන මන්මථාකෘතිදෙහ ඇති' යනු අභිප්‍රායයි); එ! බූපනේ, පින්වත් ධරණීශ්වරය! (නුඹවහන්සේ අතින්); අද, මෙදවසැ; තොසින්, තුෂ්ටියෙන් හා; සතහසින් මුසු, සෙනාභාධ්‍යාශයෙන්

යුක්තාවූ; පියබසින්, ප්‍රියාලාපමාත්‍රයක්; ලැබුණොත්, ලබ්ධ වී නම්; මදරජුවිසින්, මන්මථරජයාවිසින්; සහ රොසින්, රොෂයෙන් යුක්තවැ; දෙන, දූතය කරන්නාවූ (පමුණුවනු ලබන්නාවූ); සරපසින්, පචබාණය කරණ කොට ගෙනැ; වන, හට ගන්නාවූ; තාප, දුගය තෙමෙ; නේ, නො ඒ, (මතු) නො පැමිණෙන්නේයි ෴

128. තුල්, මහත්වූ; බිඟුදූල්ලාවන්, භ්‍රමරසංඝතියක් මෙනුදූ; නිල්ගෙලවින්, මයූරයකු මෙනුදූ; නිල්, ශ්‍යාමවර්ණවූ; රල්, රැලි ඇති; වරලින්, කෙශකලාපයෙන් යුක්තවූ; පුන්සඳ මෙන්, පූර්ණචන්ද්‍රයා මෙනුදූ; පුල්, විකශිතවූ; රත්තඹරෙව්, ස්වර්ණපද්මයක් මෙනුදූ; දුල්ලා, උජ්වලවූ; වත, වක්ත්‍රයෙන් යුක්තවූ; කන්වැල්, කර්ණපාලි නම් වූ ආභරණවිශෙෂ නමැති; විදු, විද්‍යුතීන්ගෙ; සැල්මෙන්, තරලත්වයෙන් යුක්තවූ; මිණිකැල්මෙන්, ඉන්ද්‍රනීලරත්නකාන්තිය කරණ කොට ගෙනැ; තිල්ලා, තෛලය හෙවත් තිල්වන්බැව් ඇති; සුන්දර, අභිරමවූ; ගත, දෙහ ඇති; පැරකුම් රජ, පරාක්‍රමබාහුමහිපතිහුගෙ; දිගුබැල්මෙන්, දීර්ඝාවලොකනය කරණ කොට ගෙනැ නො හොත් "පණ්ඩිතා ච නාම දීඝචක්ඛුකා"යි යුබැවින් දිග්විලොකනය කරණ කොට ගෙනැ; සිතු, චිත්තය සම්බන්ධවූ; ලොල්ලා, ලෞල්‍යය තෙමෙ පහළ වන්නේයි ෴

129. මද, අනඟ; මින්දද, මකරධ්වජය; බන්ද, බඳවා-ඔසවා; සරයානේ, දුන්නෙහි; අරවින්ද සර, පියුම්හිය; ලා, බහා-යොද; මන්දනිලතුරඟුව, මන්දමාරුතතුරංගමයා පිටට; නැඟෙමින්, ආරූඪ වැ; [(වාඪී) දකාරපදපූරණයෙහි නිපා-දීඝීතා ඡන්දස් පිණිසයි;] වියොවග, විරහානලය; නංවාන, උද්ගමනය කරවා; ඒ, මා වෙත එළැඹෙයි; චන්ද, චන්ද්‍ර තෙමෙ; අනලලෙස වියැ, වහ්නිතුල්‍ය වියැ; තනියානේ, සහායවිරහිතශය්‍යායෙහි; නෙත, නෙත්‍රයට; නින්ද, නිද්‍රාව; නො ලදිමි, ලදුයෙම් නො වෙමි; සකිසඳ, සඛීන්ද්‍රය! (තො); සඳපානේ, ජ්‍යොත්ස්නායෙහි; පැරකුම්නරනින්ද, පරාක්‍රමභුජනරොත්තමයා; කැන්ද වරෙ, ආහ්වානය කොට වරේ, කැඳවාගෙනැ ඒ ෴

130. වීරසේරපොළිපාඬින්, ශෞර්‍ය්‍යයුක්තවූවෙරචොළපාණ්ඩ්‍යයන්; අණ්ඩූපනේ, ආඥනමැති දුම්හි; ලූ, ප්‍රක්ෂෙප කළාවූ; තාරහාරහරගිරිය්සසැති, ජ්‍යොතිර්මුක්තාවලීකෛලාශසංකාශවිශදතරකීර්ත්ති ඇති; පරතාපනේ, පරතාපවූ, සතුරන් තවන්නාවූ; නැර, නොහැර, අනපහෘත වැ; වාරහන, වරඝනත්ගෙ; නයන

අදනා, නෙත්‍රාකර්ෂණය කරන්නාවූ; තුනුරූපනේ, රූපයෞවන සම්පන්නවූ ශරීරසම්පත් ඇති; බානුකුලදීපනේ, ආදිත්‍යවංශ ප්‍රදීපවූ; ඒ විරපරක්කමබාහු, පින්වත් ශ්‍රීවීරපරාක්‍රමබාහුනරේශ්වරය! (නුඹවහන්සේ); ඒ, (මා වෙත) වරේ ෴

131. මින්, මත්ස්‍ය (-අවතාරයැ); නරසී, නෘසිංහ (-අවතාරයැ); කසුබි, කූර්ම (-අවතාරයැ); කුරු, බඹ (-අවතාරයැ, යන්); ඈ, මේ ආදිවූ; වෙස්, වේශයන් (හෙවත් "වනජෞ වනජෞ බලිසත්‍රිරාමි සකෘපෝ'කෘපඃ, අවතාරා දශෛවෙතෙ කෘෂ්ණස්තු භගවාන් ස්වයම්"යි දක්වනලද දසවැදෑරුම් අවතාරයන්); ගෙනැරැ, අංගීකෘත වැ; විසුව සි, වහස කළැයි; උවිඳුගෙන් හැරැ, උපේන්ද්‍රයාකෙරෙන් බාහ්‍ය වැ හෝ උපේන්ද්‍රයා හැරැ; නොහොත්: උවිඳු, උපේන්ද්‍රයා; ගෙන්, ස්වගෘහයෙන්; හැරැ, පහ කොට; දූන්, අද්‍යත්වයෙහි; පින්සර, පුණ්‍යසාරවූ; එකවෙසෙසි සිටි, එකවේශයෙහි සිටියාවූ; බුජවිකුම්සර, බාහුවික්‍රමයෙන් සාරවූ; පැරැකුම්නිරිඳුවෙත, පරාක්‍රමභුජම්නුජේශ්වරයා සමීපයෙහි; සිරි, ලක්‍ෂ්මී තොමෝ; නිතොර, අවිරත වැ; විසි, වෙසේ ෴

132. දිවයුරුකුලකමලකරදසසියකිරණ,දිවසකරවංශලක්‍ෂණ පද්මාකරයට සහස්‍රාංශුතුල්‍යවූ; මෙසිරිලක, ශ්‍රීයුක්තවූ මේසිංහල දේශයට; පුවතර, ජ්‍යෙෂ්ඨවූ; පැරැකුම්නරවරණ, පරාක්‍රමබාහු නරෝත්තමයා; ලොව, සංසාරගතවූ; කිවිසත, කවිජනයා; සතොස කැරැ, හෘෂ්ට කොට; විතරණ, තුෂ්ටිප්‍රාභෘතයන්; දෙවන, පරිත්‍යාග කරවත් මැ; නවම්ණිනිදි, නවසංඛ්‍යකරත්න නිධිහු; බියෙන්, භීතියෙන්; දෙරණ, ධරණීයෙහි; සැඟවුණු වැනි, නිලීන වූවන් වැන්නහ ෴ පැරැකුම්බාමහරජාණන් කිවිදනන් තුස්වමින් විතරණ දෙවනකල්හි නවරුවන්නිදහන්හු මෙ මහරජ අප ඇම නො තබා කිවිදනනට දුන හොත් නපුරැයි සිතා භීතියෙන් භූමිගත වැ සැඟැවුණන් වැන්නහ යනු භාවයි ෴

133. පැරැකුම්රජ, පරාක්‍රමභුජභූභෘත්හුගෙ; බුජමැඳුර, භුජමන්දිරයෙහි; රැඳුණු, රජිතවූ; පබඳ, ප්‍රසිද්ධවූ; මෙසඳහස, හස්තයෙහි වර්තමානවූ වජ්‍රාංකසසංඛ්‍යාතබද්ධගලක්‍ෂණදීර්ඝාක්ෂිය ද; වෙසඟන ද, වාරාඞ්ගනා ද (යන දෙදෙන); එකයුර, තුල්‍යයහ; (කිහෙති යත්?) මෙ නිරිඳු, මේ නරේන්ද්‍රයා; තුටු වැ, ප්‍රමුදිත වැ; සුරතින්, දක්‍ෂහස්තයෙන්; තම කර, තමාගේ හස්තය හෙවත්-සඳහසදිගැසියගේ මුෂ්ටිසංඛ්‍යාතහස්තය ද්‍ හෝ නොහොත් වෙසඟනගේ ප්‍රකෘතිහස්තය); වළඳන, ආලිංගනය කරත් මැ; නිබඳ, නිබද්ධ වැ; පරනරනිඳුන්, අන්‍යනරේශ්වරයන්ගෙ; කර, ග්‍රීවය; (නො හොත් වෛශ්‍යාපක්‍ෂයෙහි හස්තය එවි); වැළැඳ ගනී, ආලිංගනය කැරැ ගන්නී ෴

134. මලවිය, පුෂ්පවාණ තෙමේ; දදමුතුලැල්සිසිබිම්බාකුඩ, ජ්‍යොතිලීක්‍ෂණමුක්තාලතිකායෙන් යුක්තවූ චන්ද්‍රමණ්ඩලලක්‍ෂණ ධවලාතපත්‍රය; නඟමින්, උද්ගත කෙරෙමින්; දිගුයටගේ, දිශාලක්‍ෂණයෂ්ටියග්‍රයෙහි; මින්දද, මකරධ්වජය; බැඳැ, බන්ධනය කොට; නුබ, ආකාශයෙහි; ලම්බා, අවලම්බනය කොට; සෙනගේ, වසන්තාදීන්; ගෙනැ, ග්‍රහණය කොට; නදකෝකිලසක් පුම්බා, පිකාරාවලක්‍ෂණශංඛධමනය කරවා; දික්විජයට, දිග්විජය පිණිස (යුද්ධජය සඳහා යැ යූ සේ); නලඅසුරු, (ශෛත්‍යසෞරභ්‍යමාන්ද්‍යගුණවිශිෂ්ටවූ) පවනලක්‍ෂණ අශ්වයා පිටට; නැඟැ, ආරොහ වැ; ඒ, ආගමනය කෙරෙයි; අද, මෙදවසැ; නරනිඳු පැරකුම්බා, නරේශ්වරපරාක්‍රමභූජයා; නොළැහෙනු, (මා වෙත) නො එළඹෙන්නේ; මගේ, අසමත්හුගෙ; වරද කිමැ, දෙෂ කිම් දූ? ෴

135. බිඟු, භ්‍රමර; පුල්, විකශිතවූ; කුමුදුවෙනෝ, කුමුදවනය; වැදූ (වැජැ) වර්ජිතකොට; කොඳමල්මුවරදරස, මාඝ්‍යපුෂ්පමකරන්ද රසය; බෝ, පානය කෙරෙයි; මදමත් කොවුලන්; මත්තකුහුරවයන්ගෙ; බෝ, බහුවිධවූ; නද, රුතය; යකුහඬ ද්‍යේ, යක්‍ෂරාවය ද්‍යේ හො යි; දූන්, ප්‍රත්‍යුත්පන්නයෙහි; නො දූනේ, පරිඥනය නො වෙයි; සොඳුරිවිකුල, උභයකුලපරිශුද්ධසූර්‍ය්‍යවංශයෙහි වූ; සිරිසඟබෝසිරිපැරකුම්නරනිඳු, ශ්‍රීසංඝබොධිශ්‍රීපරාක්‍රමබාහුනරදෙව තෙමෙ; නෝ, ආගමනය කොරේ ද්‍යේ හෝ නො කොරේ ද්‍යේ හො යි; නො දූනෙයි, අවගමනය නො වෙයි; සකිසඳ, සඛීන්ද්‍රය!; එනා, (ඔහු) එන්නාවූ; පෙරමඟ, පූර්වපථය, බෝ, අත්‍යර්ථයෙන්; බැලුමෙන්, අවලොකනය කිරීම හෙතු කොට ගෙනැ; නිඳි, නිද්‍රා නොමෙ; නෝ, නො ඒ ෴

136. කඳපා, කන්දර්පයා විසින්; තුනුවිමනත, දෙහලක්‍ෂණ විමානොදරයෙහි; දුන්, දෙනලද ('දල්වනලදූ' යි සේ යි); මිණිදීපා, රත්නදීපතුල්‍යවූ; තුඟු, උස්වූ; ගහනත, ඝ්‍රාණ ඇති; රසඳුන් වන්, රසාංජනප්‍රවෙශවූ; නුවනලපා, නෙත්‍රලක්‍ෂණලාඤ්ජන ඇති; සොම්පුන්සඳසෙ, සෞම්‍යවූ පූර්ණචන්ද්‍රයා මෙන්; ඔපා, කාන්තිමත්වූ; වත, මුහුණු ඇති; බන්, බඳනාලද; මිණි, රුවනින් හෙබියාවූ; නූපුර, නුරුවලායෙන් යුත්; සිරිපා, ශ්‍රීචරණ ඇති; සිරිපැරකුම්බාහුනපා, ශ්‍රීපරාක්‍රමබාහුනෘප තෙමෙ තමා; දූකැ දූකැ, දර්ශනය කොට කොට; ඉන්ට; නිෂණ්ණවන්නට (වාසය කරන්නට); සැපා වී නම්, ආයේ වී නම්; එ මෙ, ඒ ඊම මැ; සැපා වේයැ, සප්‍රාය වන්නේයැ (සෞඛ්‍යවන්නේයැ යූ සේ යි) ෴

137. පිරිසුදු, වෛතුල්‍යවාදීන් අසම්මිශ්‍රවූ; මුනිදහම් තතු ඥමඟ, සර්වඥයන්වහන්සේවිසින් දෙශිතවූ ධර්මයාගේ තත්ත්වය

හෙවත් යාථාර්ථ්‍යය සහිත; සසමය, ෂඩ්විධසමය; ඇත්අස්සියලු සරමය, හස්තිශිල්ප-අශ්වශිල්ප හා සකලශස්ත්‍රාභ්‍යාසය; පිරිසිඳ, පරිච්ඡින්න කොට—අවසන්කොට; ඉගෙන, පුරුදු කොට; මෙසමය, මෙ කල්හි; දිරිබලවිකුම්සැපතින්, නිර්විකාරසිත් ඇති බවය, කාලඥතාය, ශෞර්යාතිශයය, විභූතිය, යන. මෙසින්; පසිඳු, පරිනිෂ්පන්නවූ; නිරිඳෙක් නම්, නරේන්ද්‍රයෙක් නම්; මෙලක, මේ සිංහලදේශයෙහි; පැරකුම් නිරිඳු මය, පරාක්‍රමබාහුනරේන්ද්‍ර මැයි

138. පැරකුම්නරනිඳුගේ, පරාක්‍රමබාහුනරවීරයාගෙ; උදහස් ගුණය, කොපය; දුන, පරිඥතය කොට; එදවස් පටන්, තද්දිනය පෙරටු කොට (හෙවත් උරණ වැ මා කෙරෙන් වෙන්වූ කාලය ආදි කොට); මද, අනඟ; සුදයට, සංයුගය පිණිස; නලසු, ගන්ධ වාහාශ්වයා (පිටට); නැඟැ, ආරොහ වැ; ඒ, (මං වෙත) එළැබෙයි; සඳරස්හිමසදුන්සිහිලසය, ජ්‍යොත්ස්නාමහිකාචන්දනසම්බන්ධිවූ ශෛත්‍යය; යුගනගේ, යුගාන්තවහ්නිතුල්‍යවියැ; සකි, යහළු! (තො); සෙදූ, වහා; ගොස්, ප්‍රයාණය කොට; මෙ නතූ, මේ සරූපය; මගේ ඒ නරනිඳුට; මාගේ ඒ භූභර්තෘහට; කිය, නිවෙදනය කර

139. සකි, යහළුව!; මනම්පා, මන්මථධූප තෙමෙ; කුන්දකර වැදූ, මාසාවතප්‍රවෙශ වැ; නද දෙයි, හඬා; මන්දනිල, මඳපවන; අනලලෙස, ගිනි මෙන්; තුනු, දෙහය; තාපා කෙරෙ; නවං; රූපා, (පැරකුම්බාමහරජාණන්ගේ) සෞන්දර්‍ය්‍යයිවූ; තුනු, දෙහය; සිනැ, චිත්තයෙහි (චිත්තලක්ෂණභිත්තියෙහි); ඇන්දලෙස, තවර කළාක් මෙන්; සිතෙනුය, හැගේ; පැරකුම්බුජබූපා, (ප්‍රෞඪකත පරාක්‍රමබාහුභූපතියා; කැන්දවරෙ, (මා වෙත) කැඳවා ගෙනැ වරේ

140. සිරිපැරකුම්රජ!, (පින්වත්) ශ්‍රීපරාක්‍රමබාහුමහරජාණන් වහන්සැ! (නුඹවහන්සේ); සිරිදියරම්රජමෙන්, ශ්‍රීමජ්ජගද්‍රාම රාජව්‍යාජයෙන්; ඉසැ, උත්තමාංගයෙහි; කිරුළු, කිරීටය; පැලැඳැ, ප්‍රසාධනය කොට; සිරිලකාහිමිරජකුලසිරි, සමස්තශ්‍රී ලඞ්කාධිපතිරාජවංශලක්ෂණලක්ෂ්මිය කෙරෙහි; යෙහෙන්, සවස්ථයෙන්; වැසැ, වසස කොට; සිරිපදඅම්බුජ, (සවකීය) ශ්‍රීපාදපද්මය; සිරියට, ශ්‍රීකාන්තාවට; නිවෙස කැර, වාසස්ථාන කොට; පස්වා දහස, පචවිසහස්‍රයක් (කල් මුළුල්ලෙහි); දින, (ආධ්‍යාත්මික බාහ්‍යසංඛ්‍යාතසකලශත්‍රැමර්දනයකොටකායචිත්තසෞඛ්‍යයෙන් යුක්ත වැ ලොකශාසනාභිවෘද්ධිවඩිනය කෙරෙමින්) ජයග්‍රහණය කෙරෙහි

**පරාක්‍රමබාහුචරිතව්‍යාඛ්‍යා නිමි.**



